# ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය

# இலங்கை வயம்ப பல்கலைக்கழகம்

# WAYAMBA UNIVERSITY OF SRI LANKA

# වාර්ෂික වාර්තාව හා ගිණුම්

# ஆண்டறிக்கையும் கணக்கும்

# ANNUAL REPORT & ACCOUNTS

**2013**

# පටුන


| | |
|---|---|
| | පිටු අංකය |
| දැක්ම | 01 |
| මෙහෙවර | 01 |
| 1 ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු | 02 |
| 2 විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2013 | 03 |
| 3 පාලක සභාවේ සාමාජිකයින් - 2013 | 04 |
| 4 උපකුලපතිගේ සටහන | 05 |
| 5 මානව සම්පත් සහ සිසුන් සම්බන්ධ විස්තර - 2013 | 12 |
| 6 අභ්‍යන්තරව බඳවා ගන්නා ලද සිසුන්ගේ විස්තර - 2013 | 13 |
| 7 වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය - 2013 | 14 |
| 8 විශ්වවිද්‍යාලය මඟින් පවත්වන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර - 2013 | 19 |
| 9 ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර - 2013 | 20 |
| 10 2013.12.31 දිනට පීඨවල සහ අංශවල අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ විස්තර | 21 |
| 11 2013.12.31 දින වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩල | 24 |
| 12 පුස්තකාලය | 26 |
| 13 උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2013 | 31 |
| 14 මහපොළ සහ ශිෂ්‍යාධාරලාභීන් | 33 |
| 15 පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන | 34 |
| 16 අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි - 2013 | 36 |
| 17 ලැබී ඇති ප්‍රදානයන් පිළිබඳ විස්තර | 38 |
| 18 ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව | 40 |
| 19 වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | 49 |
| 20 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය කුලියාපිටිය පරිශ්‍රය | 62 |
| 21 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය මාකඳුර පරිශ්‍රය | 64 |
| 22 ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | 67 |

23 ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය 70

24 වෛද්‍ය මධ්‍යස්ථානය 72

25 පුනරාවර්තන වියදම් විස්තර 73

26 මූලධන වියදම් විස්තර 73

27 මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්) 73

28 මූල්‍ය ප්‍රගතියේ විස්තර (උපයන ලද ආදායම්) 74

29 මූල්‍ය ප්‍රගති සමාලෝචනය – 2013 74

30 පීඨ අනුව එක් ශිෂ්‍යයෙකුට වියදම 2010 - 2013 74

31 ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්) 75

32 ව්‍යාපෘතිවල වියදම් පිළිබඳ විස්තර (දේශීය අරමුදල්) 76

33 යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ විස්තර - 2013 78

2013 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව 79

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය 82

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය 84

2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය 86

# දැක්ම

"ශ්‍රී ලංකා උසස් අධ්‍යාපනයේ
විශිෂ්ටතම මධ්‍යස්ථානය බවට
පත්කිරීම "

# මෙහෙවර

"නව්‍යකරණ අධ්‍යාපන පාඨමාලා,
පර්යේෂණ සහ බාහිර ක්‍රියාකාරකම්
මඟින් ජාතික සංවර්ධනයට
ගැලපෙන පරිදි මානව සම්පත්
වැඩිදියුණු කිරීම"

## 1. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු

*1.) උපාධිපාඨමාලාවල ගුණාත්මකභාවය වැඩිකිරීම.*

*2.) රටේ උසස් අධ්‍යාපනයේ වර්ධන වේගයට සරිලන පරිදි ශිෂ්‍ය බඳවා ගැනීම් වැඩිකිරීම.*

*3.) උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය වැඩි කිරීම.*

*4.) සේවාවල සඵලතාවය සහ සම්පත් භාවිතයේ කාර්යාක්ෂමතාවයේ ප්‍රමාණය වැඩි කිරීම තුළින් සමස්ත ඵලදායිතාවය වැඩි කිරීම.*

*5.) උපරිම ලෙස සම්පත් ලබා ගැනීම සහ ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය ස්ථාවරත්වය පවත්වාගෙනයාම.*

*6.) ඉහළ ගුණත්වයෙන් යුක්ත වැඩ කිරීමේ පරිසරයක් මඟින් ශිෂ්‍ය හා කාර්යය මණ්ඩල අතර ජනවාර්ගික ඒකාබද්ධතාවය වර්ධනය කර විශ්වවිද්‍යාල ප්‍රජාවේ තත්වය තවදුරටත් ගොඩනැගීම.*

## 2. විශ්වවිද්‍යාලයේ නිලධාරීන් - 2013

**කුලපති**

මහාචාර්ය ටියුලි ද සිල්වා මහතා

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා, විද්‍යාවේදී *(කෘෂිකර්ම) (පකිස්ථානය),*

*දර්ශනශුරී (එක්සත් රාජධානිය)*

**පීඨවල පීඨාධිපතිවරු**

**කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය**

මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා, විද්‍යාවේදී *(කෘෂිකර්ම) (පේරදෙණිය), විද්‍යාපති, දර්ශනශුරී (බර්මිංහැම්)*

**ව්‍යවහාරික විද්‍යා පීඨය**

ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා, විද්‍යාවේදී *(කැලණිය), විද්‍යාපති, ඩී.එස්.සී. (ජපානය)*

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා, *ශාස්ත්‍රවේදී (කොළඹ),පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කොළඹ) එම්. කොම්. (කැලණිය),*

**පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා, විද්‍යාවේදී *(රසායන විද්‍යාව) (පේරදෙණිය), දර්ශනශුරී (ඇ.එ.ජ)*

**ලේඛකාධිකාරී**

ඊ. එම්. ජී ඒකනායක මහතා, *ශාස්ත්‍රවේදී (පේරදෙණිය), කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (විවෘත විශ්වවිද්‍යාලය), මානව සම්පත් කළමණාකරන සහතිකය (හයිඩ්‍රාබාද්), ව්‍යාපාර පරිපාලනපති (ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය)*

2013.03.31 දක්වා

ජී පියරත්න මහතා, *ශාස්ත්‍රවේදී (පේරාදෙණිය), මානව සම්පත් කළමනාකරණ පශ්චාත් උපාධි ඩිප්ලෝමා (කොළඹ විශ්වවිද්‍යාලය), මානව සම්පත් කළමණාකරනය පිළිබඳ පශ්චාද් උපාධිය (කොළඹ විශ්වවිද්‍යාලය)*

2013.04.01 සිට

**මූල්‍යාධිකාරී**

ඩී. ඒ. යූ. ධර්මදාස මහතා, විද්‍යාවේදී *(කැලණිය), ඒ සී ඒ., ඒ එස් සී එම් ඒ*

**පුස්තකාලයාධිපති**

ඩබ්ලිව්. ජී. පී. ගම්ලත් මහතා, *ශාස්ත්‍රවේදී (පේරදෙණිය), පුස්තකාල හා තොරතුරු විද්‍යාවේදී (ඉන්දියාව), පුස්තකාල හා තොරතුරු විද්‍යාපති (ඉන්දියාව)*

## 3. පාලක සභාවේ සාමාජිකයින් - 2013

**උපකුලපති**

මහාචාර්ය එස්. ජේ. බී.ඒ. ජයසේකර මහතා

**පීඨවල පීඨාධිපතිවරු**

| | |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨය | - මහාචාර්ය ඩී. පී. එස්. ටී. ජී. අත්තනායක මහතා |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | - ආචාර්ය ඊ. එම්. පී. ඒකනායක මහතා |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | - මහාචාර්ය ඊ. එස්. වික්‍රමසිංහ මහතා |
| පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - ආචාර්ය එම්. එස්. ඩබ්ලිව්. ද සිල්වා මහතා |

**විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය ඩබ්ලිව්. ඒ. අබේසිංහ මහතා

ඒ. ඒ. ජිනදාස මහතා

ජේ. එච්. ආර්. කරුණාරත්න මහතා

ජේ. එම්. ගුණතිලක මහතා

එෆ්. ප්‍රීති පෙරේරා මහතා

ආර්. පී. එල්. වීරසිංහ මහතා

නාරද එදිරිසිංහ මහතා

ආර්. එම්. වන්නිනායක මහතා

**සනාතන සභාව මඟින් පත් කරන ලද සාමාජිකයෝ**

ආචාර්ය කේ. ඩී. ඩී. එන්. දිසානායක මහතා

මහාචාර්ය ආර්. සී. ඩබ්ලිව්. එම්. ආර්. ඒ. නුගවෙල මහතා

**ලේඛකාධිකාරී (ලේකම්)**

ඊ. එම්. පී. ඒකනායක මහතා - 2013.03.31 දක්වා

පී පියරත්න මහතා - 2013.04.01 සිට

# 4. උපකුලපතිගේ සටහන

## 4.1 හැඳින්වීම

විශ්වවිද්‍යාලයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා 29% අධ්‍යයන, 2% අධ්‍යයන සහායක, 6% විධායක සහ 63% අනධ්‍යයන සේවක පිරිසකගෙන් සැදුම් ලත් 499 කින් යුත් කාර්යය මණ්ඩලයක් දායකත්වය දක්වා ඇත. ජ්‍යෙෂ්ඨ මහාචාර්ය, මහාචාර්ය, සහාය මහාචාර්ය, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය සහ කථිකාචාර්ය යන අධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිවෙළින් 2% , 5%, 1%, 48% සහ 44%කි. කාර්මික නිලධාරී, ලිපිකාර සහ සමාන්තර ශ්‍රේණි සහ කම්කරු ශ්‍රේණි ආදි වශයෙන් වූ අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සංයුතිය පිළිවෙළින් 10%, 40% සහ 50% කි. පීඨ හතරෙහිම මුළු ශිෂ්‍ය සංඛ්‍යාව 2572 වූ අතර ශිෂ්‍ය ශිෂ්‍යාවන් 656 දෙනෙක් සඳහා නේවාසිකාගාර පහසුකම් සපයන ලදී. අපේ උපාධිධාරීන්ගේ රැකියා වාර්තා ඉහළ ස්ථානයක පවතී.

## 4.2 ජයග්‍රහනයන්

උපාධි ප්‍රධානෝත්සවය 2013.05.28 වන දින කොළඹ බණ්ඩාරණායක ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පවත්වන ලදී. එහිදී 373 දෙනෙකු ප්‍රථම උපාධිය ද, 04 දෙනෙකු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවද ලබාගත් අතර පශ්චාත් උපාධිය ලබාගත් සංඛ්‍යාව 47කි. මහාචාර්ය එම්. ඒ. කේ. එල්. දිසානායක මහතා හට ගෞරවනීය උපාධියක් පිරිනැමිණි. විශ්වවිද්‍යාලයේ සේවක සංවර්ධන මධ්‍යස්ථානය මඟින් කාර්යය මණ්ඩලය සඳහා පාඨමාලාවන් රැසක් මෙම වර්ෂය තුළ පවත්වන ලදී. ව්‍යවහාරික විද්‍යා පීඨයෙහි පස්වෙනි වාර්ෂික ශාස්ත්‍රීය සම්මන්ත්‍රණය (Symposium) 2013 අගෝස්තු මස 07 දින සහ දොළොස්වෙනි කෘෂිකර්ම පර්යේෂණ සම්මන්ත්‍රණය 2013 මැයි 30 වන දින පවත්වන ලදී.

IDRC ව්‍යාපෘතිය හරහා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් සාර්ථකව සම්පූර්ණ කරන ලද "ශ්‍රී ලංකාවේ සමාජීය අධ්‍යාපනය තුළින් ග්‍රාමීය ආදායම ඉහළ නැංවීම" වැඩසටහන තවත් වසර 1 1/2 කින් දීර්ඝ කරන ලදි. මෙම පියවර 2014 සැප්තැම්බර් මස වන විට අවසන් වනු ඇත.

අනෙකුත් ජයග්‍රහනයන් අතර 2013 මාර්තු මස තුළ ගොඩනැගිලි ඉදිකිරීම් කිහිපයක් නිම කර ගැනීමට හැකියාව ලැබුණි. ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ පළමු අදියර, කුලියාපිටිය පරිශ්‍රයේ එළිමහන් රංග භූමිය, කුලියාපිටිය වෛද්‍ය මධ්‍යස්ථානයේ දෙවන අදියර සහ මාකඳුර තනිකඩ කාර්ය මණ්ඩල නේවාසිකාගාරවල ඉදිකිරීම් නිම කර ගරු උසස් අධ්‍යාපන අමාත්‍ය එස් බී දිසානායක මැතිතුමා විසින් 2013 මාර්තු මස දී විවෘත කරන ලදි.

තවද, 2014 "දැයට කිරුළ" ජාතික ප්‍රදර්ශනය කුලියාපිටියේ සහ විශ්වවිද්‍යාල භූමිය තුළ පැවැත්වීමට අවස්ථාව අපවෙත ලැබිණ. ප්‍රදර්ශනයේ ප්‍රධාන ස්ථානය විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ පිහිටුවීමටත්, සමාරම්භක උත්සවය පැවැත්වීම සහ ජනාධිපති මහලේකම් කාර්යාලය විශ්වවිද්‍යාල භූමිය තුළ ඉදි කිරීම සඳහා සැලසුම් කිරීමට දැයට කිරුළ සංවර්ධන කමිටුව එකඟ විය. ඒ අනුව, 2013.06.15 දින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමා, ගරු විදුලි සංදේශ හා තොරතුරු තාක්ෂණ ඇමති රංජිත් සියඹලාපිටිය මැතිතුමා, ගරු උසස් අධ්‍යාපන අමාත්‍ය එස් බී දිසානායක මැතිතුමා, වයඹ පළාත් ගරු ආණ්ඩුකාර තිස්ස බලල්ල මැතිතුමා, වයඹ පළාත් මහ ඇමති ගරු අතුල විජේසිංහ මැතිතුමා ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍ය ගරු අනුර ප්‍රියදර්ශන යාපා මැතිතුමා සහ විශේෂිත අමුත්තන් කිහිපදෙනෙකු අතින් ශිෂ්‍ය මධ්‍යස්ථානය, ශ්‍රවණාගාරය, ගෘහස්ථ ක්‍රීඩාංගනය, ශිෂ්‍ය නේවාසිකාගාර සහ නැනෝ තාක්‍ෂණ විද්‍යාගාරය සඳහා මුල් ගල් තබන ලදි. 2014 පෙබරවාරි - මාර්තු මාසවලදී පැවැත්වීමට නියමිත ප්‍රදර්ශනය ආරම්භ කිරීමට පෙර මෙම ඉදිකිරීම් නිම කිරීමට බලාපොරොත්තු විය.

කුලියාපිටිය පරිශ්‍රය සඳහා නල ළිං සහිත ජල ටැංකියක් සමඟ පානීය ජල සැපයුම් පද්ධතියක් සහ මාකඳුර කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨයේ දෙවන අදියර සඳහා මුල් ගල් තබන ලදි. උසස් අධ්‍යාපන අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක කරනු ලබන විශේෂ නේවාසිකාගාර ව්‍යාපෘතිය යටතේ එක නේවාසිකාගාරයක සිසුන් 400 කට පමණ නේවාසික පහසුකම් සැපයිය හැකි නේවාසිකාගාර 03ක් ලබා ගත හැකි විය. (කුලියාපිටිය පරිශ්‍රය සඳහා 02ක් ද, මාකඳුර පරිශ්‍රය සඳහා 01ක් ද වශයෙනි)

දැයට කිරුළ ප්‍රදර්ශන වැඩ සටහන යටතේ අභ්‍යන්තර මාර්ග පද්ධතිය වැඩි දියුණු කිරීමට සහ අනෙකුත් සුළු යටිතල පහසුකම් සංවර්ධනය කිරීමට පියවර ගන්නා ලදි.

මාකඳුර නේවාසිකාගාර ව්‍යාපෘති V සහ VI හි වැඩ කටයුතු ආරම්භ කරන ලදි. මාකඳුර පරිශ්‍රයට යාබද පොල් පර්යේෂණ ආයතනයෙන් රුපියල් මිලියන 10කට, අක්කර 5 ක ඉඩම් කැබැල්ලක් විශ්වවිද්‍යාලයට ලබා ගැනීමට හැකි වීම නිසා මෙම ඉදිකිරීම් කළ හැකි විය.

නව බාහිර පාඨමාලා කිහිපයක් පැවැත්විය. ඒවා නම්, රක්‍ෂණ පිළිබඳ උසස් ඩිප්ලෝමාව, ආහාර කර්මාන්ත සහ අළෙවිකරණ ඩිප්ලෝමාව, ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා ඉංග්‍රීසි ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව, පරිගණක භාවිතය සහ නිපුණතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව සහ ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාවයි.

## 4.3 ඇණ හිටීම් හා ඊට හේතු

කොන්ත්‍රාත්කරුගේ අසමර්ථතාවය නිසා කුලියාපිටිය තනිකඩ කාර්යය මණ්ඩල නේවාසිකාගාර ව්‍යාපෘතිය නිම කර ගැනීමට නොහැකි විය. දැයට කිරුළ ප්‍රදර්ශන කටයුතු ආරම්භ කිරීම සහ ශ්‍රී ලංකා නාවික හමුදාවේ ප්‍රදර්ශන වැඩ කටයුතු නිසා කුලියාපිටිය ක්‍රීඩාගාරයේ සංවර්ධන කටයුතු ප්‍රමාද විය.

## 4.4 අනාගත සැලසුම්

විශ්වවිද්‍යාලයේ පශ්චාත් උපාධි කටයුතු, පර්යේෂණ, සහ සාමූහිකත්ව ක්‍රියාකාරකම් ඉදිරියේදී පුළුල් කරනු ලැබේ.

විවිධ ඉදිකිරීම් ව්‍යාපෘති කිහිපයක්ම සැලසුම් කරන ලදී. උදා:- පිවිසුම් මාර්ගය අදියර I, මාකඳුර පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ අදියර III සහ කුලියාපිටිය ව්‍යවහාරික විද්‍යා පීඨය අදියර III. මාකඳුර පරිශ්‍රයේ ගාවිපොළක් සහ පශුසම්පත් පුහුණු මධ්‍යස්ථානයක් ඉදිකිරීමට සැලසුම් කරන ලදි.

## ගරු එස් බී දිසානායක අමාත්‍යතුමා විසින් උත්සවාකාරයෙන් ගොඩනැගිලි විවෘත කරන ලදී

### කුලියාපිටිය පරිශ්‍රය



පීඨ ගොඩනැගිල්ල - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය



නේවාසිකාගාර



එළිමහන් රංගපීඨය



වෛද්‍ය මධ්‍යස්ථානය

### මාකඳුර පරිශ්‍රය



කාර්යමණ්ඩල තනිකඩ නේවාසිකාගාරය



වෛද්‍ය මධ්‍යස්ථානය

# දැයට කිරුළ වැඩසටහන යටතේ ඉදිවන ගොඩනැගිලි සඳහා මුල්ගල තැබීම

**ශිෂ්‍ය මධ්‍යස්ථානය**



**ශ්‍රවණාගාරය**







**ගෘහස්ථ ක්‍රීඩාංගණය**





# හොස්ටල් ව්‍යාපෘතිය සඳහා මුල්ගල තැබීම





# දැයට කිරුළ වැඩසටහන යටතේ විදුවන ඉදිකිරීම් - කුලියාපිටිය පරිශ්‍රය


ශිෂ්‍ය මධ්‍යස්ථානය


ශ්‍රවණාගාරය


ගෘහස්ථ ක්‍රීඩාංගණය


ජල ටැංකිය

## නේවාසිකාගාර ඉදිකිරීම්



# කුලියාපිටිය පරිශ්‍රයේ අභ්‍යන්තර මාර්ග










# මාකඳුර පරිශ්‍රය

**පීඨ ගොඩනැගිල්ල - කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨය**




**නේවාසිකාගාර**



## 5. මානව සම්පත් සහ සිසුන් සම්බන්ධ විස්තර - 2013

| පීඨය | පාඨමාලාව | ශිෂ්‍ය සංඛ්‍යාව | අධ්‍යයන කාර්යය මණ්ඩලය | අනධ්‍යයන කාර්යය මණ්ඩලය |
|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන | විද්‍යාවේදී (කෘෂිකර්මය) | 439 | 32 | 44 |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාවේදී (සාමාන්‍ය/බද්ධ ප්‍රධාන විෂය) | 428 | 36 | 26 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී (විශේෂ) බැංකු හා මූල්‍ය | 1312 | 34 | 17 |
| | විද්‍යාවේදී (විශේෂ) ව්‍යාපාර කළමනාකරණ | | | |
| | විද්‍යාවේදී (විශේෂ) රක්‍ෂණ හා තක්සේරුකරනය | | | |
| | විද්‍යාවේදී (විශේෂ) ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය | | | |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | විද්‍යාවේදී (ආහාර විද්‍යාව හා පෝෂණය) | 231 | 31 | 37 |
| | විද්‍යාවේදී (ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරනය) | 162 | | |
| **එකතුව** | | **2572** | **133** | **124** |

2013 වසර තුළ විශ්වවිද්‍යාලයේ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාව 2572ක් වූ අතර පීඨ හතරේ ම අධ්‍යයන කාර්යය මණ්ඩලය 133ක් සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය 124කි. 2011 සහ 2012 වර්ෂයේ ශිෂ්‍ය සංඛ්‍යා 2178, 2113ක් සමඟ සමස්ථ අධ්‍යයන කාර්යය මණ්ඩලය 104, 119ක් සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලය 100, 102 කි. 2011 වර්ෂය සහ 2012 වර්ෂය සමඟ සංසන්දනය කරන විට 2013 වර්ෂයේ දී ශිෂ්‍ය සංඛ්‍යාව, අධ්‍යයන කාර්යය මණ්ඩලය සහ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ වර්ධනයක් දක්නට ලැබේ. පීඨ හතරකින් ප්‍රථම උපාධි 8ක් ප්‍රදානය කරනු ලැබේ.



## 6. අභ්‍යන්තරව බඳවා ගන්නා ලද සිසුන්ගේ විස්තර - 2013

| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | 2013 බඳවා ගැනීම් | පළමු වසර ශිෂ්‍ය සංඛ්‍යාව | දෙවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | තුන්වන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | හතරවන වසර ශිෂ්‍ය සංඛ්‍යාව | උපාධිධාරීන් සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 139 | 139 | 111 | 98 | 91 | 88 |
| ව්‍යවහාරික විද්‍යා | විද්‍යාවේදී උපාධිය (සාමාන්‍ය) | ඉංග්‍රීසි | 140 | 140 | 141 | 98 | 49 | 81 |
| | විද්‍යාවේදී උපාධිය (බද්ධ ප්‍රධාන විෂය) | | | | | | | 41 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | විද්‍යාවේදී බැංකු හා මූල්‍ය (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | 482 | 482 | 344 | 285 | 201 | 12 |
| | විද්‍යාවේදී ව්‍යාපාර කළමනාකරණ (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 101 |
| | විද්‍යාවේදී රක්ෂණ හා තක්සේරුකරන (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 23 |
| | විද්‍යාවේදී ගිණුම් හා ව්‍යාපාර මූල්‍ය (විශේෂ) උපාධිය | ඉංග්‍රීසි | | | | | | 84 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | ආහාර විද්‍යාව හා පෝෂණය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 73 | 73 | 66 | 53 | 39 | 39 |
| | ආහාර නිෂ්පාදනය හා තාක්ෂණ කළමනාකරනය පිළිබඳ විද්‍යාවේදී උපාධිය | ඉංග්‍රීසි | 60 | 60 | 39 | 34 | 29 | 24 |
| **එකතුව** | | | **894** | **894** | **701** | **568** | **409** | **493** |

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පළමු වසර සිට අවසන් වසර දක්වා සිසුන්ට උපාධි පාඨමාලා පවත්වනු ලබන්නේ ඉංග්‍රීසි මාධ්‍යයෙනි. 2014 වර්ෂයේ දී පවත්වන ලද උපාධිප්‍රදානෝත්සවයේ දී සිසුන් 493 දෙනෙකු උපාධි ලබා ගන්නා ලදි.


## 7. වයඹ විශ්වවිද්‍යාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය - 2013

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ බාහිර තොරතුරු ඒකකය විසින් ප්‍රශ්නාවලියක් මගින් පහත තොරතුරු ඒකරාශී කර ගෙන විශ්ලේෂණය කර ඇත.

උපාධි පාඨමාලාව සම්පූර්ණ කිරීම හා උපාධි ප්‍රදානෝත්සවය අතර කාලය පදනම් කරගනිමින්, 2013 වර්ෂයේ උපාධිධාරීන්ගේ තොරතුරු අනුව මෙම විශ්ලේෂණය සිදුකර ඇත. උපාධිපාඨමාලාව සම්පූර්ණ කිරීම හා උපාධි ප්‍රදානෝත්සවය පැවැත්වීම අතර කාල පරාසයෙහි පීඨ හතර අතර විවිධ වෙනස්කම් පවතී. කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨයේ එය මාස 11 ක් සහ පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ එය සාමාන්‍යයෙන් මාස 03ක් වශයෙන් වාර්තා වී ඇත. ව්‍යවහාරික විද්‍යා පීඨයේ මෙම කාල පරතරය අවුරුදු එකයි මාස 07ක් වශයෙන් වාර්තා වී ඇති අතර ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සාමාන්‍යයෙන් අවුරුදු එකයි මාස 03ක් වශයෙන් වාර්තා වී ඇත.

සමස්ථයක් ලෙස ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ රැකියා නියුක්තිය 93.86 % වේ.


| ගණය | % |
|---|---|
| ස්ථිර | 63.16% |
| තාවකාලික | 29.82% |
| ස්වයං රැකියාවක නියුතු | 0.88% |
| සේවාවියුක්ත | 6.14% |
| **එකතුව** | **100.00%** |



7.1 කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය

| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| වැවිළි කළමනාකරණ | 8 | 13 | 1 | 4 | **26** |
| උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | 4 | 11 | 1 | 1 | **17** |
| ජෛව තාක්ෂණ | 3 | 6 | - | 1 | **10** |
| කෘෂිව්‍යාපාර කළමනාකරණ | 15 | 6 | - | 6 | **27** |
| **එකතුව** | **30** | **36** | **2** | **12** | **80** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 37.5% | 45% | 2.5% | 15% |




7.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| කර්මාන්ත කළමනාකරණ | 12 | 2 | 1 | 1 | **16** |
| ගණිතමය විද්‍යා | 21 | 4 | 1 | 1 | **27** |
| ඉලෙක්ට්‍රොනික විද්‍යා | 8 | 5 | - | 1 | **14** |
| පරිගණක හා තොරතුරු පද්ධති | 7 | 1 | - | 5 | **13** |
| **එකතුව** | **48** | **12** | **2** | **8** | **70** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 68.57% | 17.14% | 2.86% | 11.43% |




### 7.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| ව්‍යාපාර කළමනාකරණ | 19 | 16 | - | 3 | **38** |
| ගණකාධිකරණ හා ව්‍යාපාර මූල්‍ය | 34 | 14 | - | 4 | **52** |
| බැංකු හා මූල්‍ය | 9 | 2 | - | - | **11** |
| රක්ෂණ හා තක්සේරුකරණ | 10 | 2 | 1 | - | **13** |
| **එකතුව** | **72** | **34** | **1** | **7** | **114** |


| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 63.16% | 29.82% | 0.88% | 6.14% |



7.4 පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය


| අංශය | ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත | එකතුව |
|---|---|---|---|---|---|
| ජල ජීවී හා මත්ස්‍ය | 1 | 9 | 1 | - | **11** |
| පශුසම්පත් හා පක්ෂි විද්‍යා | 9 | 6 | - | - | **15** |
| ආහාර විද්‍යා හා තාක්ෂණ | 7 | 6 | - | 1 | **14** |
| ව්‍යවහාරික පෝෂණ | 3 | 7 | - | 4 | **14** |
| **එකතුව** | **20** | **28** | **1** | **5** | **54** |

| ස්ථිර | තාවකාලික | ස්වයං රැකියාවක නියුතු | සේවාවියුක්ත |
|---|---|---|---|
| 37.04% | 51.85% | 1.85% | 9.26% |



### පීඨ හතරෙහි රැකියා නියුක්තිය 2012 සහ 2013 වර්ෂ අතර සැසඳීම

2012, 2013 වසරවල විභාගය පවත්වන ලද අවසන් දිනය සහ උපාධි ප්‍රදානෝත්සවය පවත්වන ලද දිනය අතර කාලයේ උපාධිධාරීන්ගේ සේවා නියුක්තිය ප්‍රතිශතයක් ලෙස දැක්වේ.



## 8. විශ්වවිද්‍යාලය මඟින් පවත්වන ලද බාහිර පාඨමාලා පිළිබඳ විස්තර -2013

### *1.) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය*

- ව්‍යාපාර පරිපාලනපති උපාධිය
- ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව
- රක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාව
- රක්‍ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව
- පුද්ගල මූල්‍ය කළමනාකරණය පිළිබඳ සහතිකය (AIA රක්‍ෂණ සමාගමේ කාර්යය මණ්ඩලය සඳහා)

### *2.) කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය*

- විද්‍යාවේදී (කෘෂිකර්ම කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව
- ආහාර ව්‍යාපාර සහ අලෙවිකරණ ඩිප්ලෝමාව

### *3.) ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය*

- ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව

### *4.) ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය – මාකඳුර*

- ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා ඉංග්‍රීසි ඉගැන්වීමේ සහතික පත්‍ර පාඨමාලාව

### *5.) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය*

- පරිගණක භාවිතය සහ නිපුණතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව

### *6.) තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය – මාකඳුර*

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව
- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව

### *7.) සේවක සංවර්ධන මධ්‍යස්ථානය*

- ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව
- සේවක සංවර්ධන සහතික පත්‍ර පාඨමාලාව

**බාහිර පාඨමාලාවල ශිෂ්‍ය සංඛ්‍යාව**

| පාඨමාලාව | 2013 වසරේදී ලියාපදිංචි වූ ශිෂ්‍ය සංඛ්‍යාව | 2013 වසරේදී පාඨමාලාව සම්පූර්ණ කරන ලද ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|---|
| අ. ව්‍යාපාර පරිපාලනපති උපාධි පාඨමාලාව | 112 | 47 |
| ආ. ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාව | 121 | 04 |
| ඇ. විද්‍යාවේදී (කෘෂිකර්ම කළමනාකරණ) බාහිර උපාධි පාඨමාලාව | 80 | 16 |
| ඈ. රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමා පාඨමාලාව | 75 | හදාරමින් සිටිති |
| ඉ. රක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 87 | 57 |
| ඊ. ඉංග්‍රීසි ඩිප්ලෝමා පාඨමාලාව | 301 | 218 |
| උ. තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව | 92 | - |
| ඌ. ආහාර කර්මාන්ත සහ අළෙවිකරණ ඩිප්ලෝමාව | 12 | 10 |
| එ. ඉගැන්වීමේ තාක්ෂණය සහ ක්‍රමවේදය පිළිබඳ වෘත්තීය ඩිප්ලෝමාව | 35 | 34 |
| ඒ. තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව | 52 | හදාරමින් සිටිති |
| ඔ. පරිගණක භාවිතය සහ නිපුණතාවය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 76 | හදාරමින් සිටිති |
| ඕ. පුද්ගල මූල්‍ය කළමණාකරනය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව | 77 | හදාරමින් සිටිති |

## 9. ආරම්භ කරන ලද නව පාඨමාලා පිළිබඳ විස්තර - 2013


| පීඨය | පාඨමාලාව | මාධ්‍ය | සහතික පත්‍ර | ඩිප්ලෝමා | පශ්චාත් උපාධි ඩිප්ලෝමා | පරිපාලනපති | දර්ශනපති | දර්ශනශූරි |
|---|---|---|---|---|---|---|---|---|
| ***කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය*** | ආහාර කර්මාන්ත සහ අළෙවිකරණ ඩිප්ලෝමාව | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |
| ***ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය*** | රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | ඉංග්‍රිසි | - | √ | - | - | - | - |

## 10. 2013.12.31 දිනට අධ්‍යයන හා අධ්‍යයන සහායක කාර්යය මණ්ඩලයේ විස්තර

| පීඨය | අධ්‍යයනාංශ | අනුමත සේවක සංඛ්‍යාව | ජ්‍යෙෂ්ඨ මහාචාර්ය | මහාචාර්ය | සහාය මහාචාර්ය | ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය | කථිකාචාර්ය / කථිකාචාර්ය (ආධුනික) | උපදේශක | පද්ධති ඉංජිනේරු | වෘත්තීය උපදේශක | වර්තමාන සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන | පීඨ කාර්යාලය | **2** | - | - | - | - | - | - | - | - | - | **2** |
| | කෘෂිව්‍යාපාර කළමනාකරණ | **8** | - | 2 | - | 2 | 4 | - | - | - | **8** | - |
| | ජෛව තාක්ෂණ | **9** | - | - | 1 | 3 | 3 | - | - | - | **7** | **2** |
| | උද්‍යාන විද්‍යා හා භූමි අලංකරණ | **10** | 1 | 1 | - | 3 | 3 | - | - | - | **8** | **2** |
| | වැවිළි කළමනාකරණ | **11** | - | 2 | - | 4 | 3 | - | - | - | **9** | **2** |
| ව්‍යවහාරික විද්‍යා | පීඨ කාර්යාලය | **1** | - | - | - | - | - | - | - | - | - | **1** |
| | පරිගණක හා තොරතුරු පද්ධති | **10** | - | - | - | 1 | 6 | - | - | - | **7** | **3** |
| | ඉලෙක්ට්‍රොනික විද්‍යා | **9** | 1 | 1 | - | 5 | 1 | - | - | - | **8** | **1** |
| | කර්මාන්ත කළමනාකරණ | **15** | - | - | - | 8 | 3 | - | - | - | **11** | **4** |
| | ගණිතමය විද්‍යා | **14** | - | - | - | 7 | 3 | - | - | - | **10** | **4** |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | පීඨ කාර්යාලය | **2** | - | - | - | - | - | - | - | - | - | **2** |
| | ගණකාධිකරණ | **11** | - | - | - | 4 | 6 | - | - | - | **10** | **1** |
| | බැංකු හා මූල්‍ය | **8** | - | - | - | 5 | 2 | - | - | - | **7** | **1** |
| | ව්‍යාපාර කළමනාකරණ | **11** | - | - | 1 | 4 | 5 | - | - | - | **10** | **1** |
| | රක්ෂණ හා තක්සේරුකරණ | **7** | - | - | - | 2 | 5 | - | - | - | **7** | - |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | පීඨ කාර්යාලය | **2** | - | - | - | 1 | - | - | - | - | **1** | **1** |
| | ව්‍යවහාරික පෝෂණ | **10** | - | - | - | 4 | 4 | - | - | - | **8** | **2** |
| | ජල ජීවී හා මත්ස්‍ය | **8** | 1 | 1 | - | 4 | - | - | - | - | **6** | **2** |
| | ආහාර විද්‍යා හා තාක්ෂණ | **11** | - | - | - | 6 | 4 | - | - | - | **10** | **1** |
| | පශුසම්පත් හා පක්ෂි විද්‍යා | **8** | - | | | 4 | 2 | - | - | - | **6** | **2** |


| | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – කුලියාපිටිය | **4** | - | - | - | - | 4 | - | - | - | **4** | **0** |
| | ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය – මාකඳුර | **3** | - | - | - | - | - | 1 | - | - | **1** | **2** |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – කුලියාපිටිය | **5** | - | - | - | - | 2 | 1 | - | - | **3** | **2** |
| | තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය – මාකඳුර | **6** | - | - | - | - | 2 | 1 | 1 | - | **4** | **2** |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | | **5** | - | - | - | - | - | 2 | - | - | 2 | **3** |
| වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය | | **1** | - | - | - | - | - | - | - | 1 | **1** | **0** |
| **එකතුව** | | **191** | **3** | **7** | **2** | **67** | **62** | **5** | **1** | **1** | **148** | **43** |

29%ක් වූ අධ්‍යයන, 2%ක් වූ අධ්‍යයන සහායක, 6%ක් වූ විධායක සහ 63%ක් වූ අනධ්‍යයන වශයෙන් සමන්විත, 499ක් වූ සමස්ත කාර්යය මණ්ඩලය ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ අරමුණු සාර්ථක කර ගැනීම සඳහා කටයුතු කරන ලදි.




**2013 වර්ෂයේ කාර්යය මණ්ඩලය**


අධ්‍යයන කාර්යය මණ්ඩලයේ ව්‍යාප්තිය පිළිවෙලින් ජ්‍යෙෂ්ඨ මහාචාර්ය 2%ක් ද, මහාචාර්ය 5%ක් ද, සහාය මහාචාර්ය 1%ක් ද, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය 48%ක් ද සහ කථිකාචාර්ය 44%ක් ද වේ.




**2013 වර්ෂයේ අධ්‍යයන කාර්යය මණ්ඩලය**

2011 - 2013 කාල පරිච්ඡේදය තුළ විශ්වවිද්‍යාලයේ කාර්යය මණ්ඩලය සැසඳීම

| **සේවක ගණය** | **2011** | **2012** | **2013** |
|---|---|---|---|
| අධ්‍යයන | 114 | 128 | 141 |
| පුස්තකාලය (අධ්‍යයන) | 04 | 04 | 05 |
| අධ්‍යයන සහායක | 08 | 08 | 08 |
| විධායක | 25 | 29 | 28 |
| අනධ්‍යයන | 260 | 271 | 317 |
| **එකතුව** | **411** | **440** | **499** |




## 11. 2013.12.31 දින වන විට අනධ්‍යයන කාර්යය මණ්ඩල විස්තර

| පීඨය/අංශය | විධායක නිලධාරී කාර්යය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| උපකුලපති කාර්යාලය | 1 | - | 1 | 1 |
| ලේඛකාධිකාරී කාර්යාලය | 2 | - | 2 | 2 |
| අධ්‍යයන ආයතන අංශය | 1 | - | 5 | 1 |
| අනධ්‍යයන ආයතන අංශය | 1 | - | 4 | 1 |
| සාමාන්‍ය පාලන අංශය | 1 | 1 | 5 | 5 |
| මූලධන අංශය | 1 | - | 1 | 1 |
| අධ්‍යයන අංශය | 1 | - | 1 | 1 |
| පොදු සේවා ඒකකය - මාකඳුර පරිශ්‍රය | 1 | - | 2 | 2 |
| අභ්‍යන්තර විගණන අංශය | 1 | - | 3 | 1 |
| වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය | - | - | 1 | - |
| බාහිර සම්බන්ධතා අංශය | - | - | 1 | - |
| ගිණුම් අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 3 | - | 9 | 2 |
| ගිණුම් අංශය - මාකඳුර පරිශ්‍රය | 3 | - | 4 | 1 |
| ගබඩා සහ සැපයුම් අංශය | 1 | - | 6 | 2 |
| ආරක්ෂක අංශය | - | - | 3 | 3 |
| ප්‍රවාහන අංශය | - | - | - | 10 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 1 | 6 | 9 | 10 |
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 2 | 5 | 12 | 25 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1 | 1 | 8 | 7 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 2 | 8 | 10 | 18 |
| විභාග අංශය | 1 | - | 6 | 2 |
| පුස්තකාලය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | - | 8 | 8 |
| පුස්තකාලය - මාකඳුර පරිශ්‍රය | - | - | 4 | 3 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | 1 | 2 | 2 |
| තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | 1 | 2 |
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 1 | 1 |

| පීඨය/අංශය | විධායක නිලධාරී කාර්යය මණ්ඩලය | කාර්මික නිලධාරීන් | ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි | සුළු සේවක |
|---|---|---|---|---|
| ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය | - | - | - | 1 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - කුලියාපිටිය පරිශ්‍රය | - | 3 | 1 | 2 |
| වෛද්‍ය මධ්‍යස්ථානය - මාකඳුර පරිශ්‍රය | - | 2 | - | 1 |
| ශාරීරික අධ්‍යාපන ඒකකය | 1 | - | 1 | 4 |
| සේවක සංවර්ධන මධ්‍යස්ථානය | - | - | 1 | - |
| ශිෂ්‍ය හා සේවක සුභසාධක අංශය | 1 | - | 4 | 4 |
| නඩත්තු අංශය - කුලියාපිටිය පරිශ්‍රය | 1 | 3 | 5 | 27 |
| නඩත්තු අංශය - මාකඳුර පරිශ්‍රය | - | 1 | 1 | 7 |
| නේවාසිකාගාර - කුලියාපිටිය පරිශ්‍රය | - | - | 2 | 1 |
| නේවාසිකාගාර - මාකඳුර පරිශ්‍රය | - | - | 2 | 2 |
| **එකතුව** | **28** | **31** | **126** | **160** |

අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ ව්‍යාප්තිය (විධායක නිලධාරීන් හැර) අනුපාතිකව කාර්මික 10%ක් ද, ලිපිකාර හා සමාන්තර ශ්‍රේණි 40%ක් ද සහ සුළු සේවක 50% ක් ද වශයෙන් මුළු එකතුව 317කි.




**2013 වර්ෂයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලය**

# 12. පුස්තකාලය

## 12.1 පසුබිම

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පුස්තකාලය කොටස් දෙකකින් සමන්විතය. කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය මඟින් ව්‍යවහාරික විද්‍යා පීඨයට සහ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයට පහසුකම් සපයනු ලබන අතර මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය මඟින් කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨයට හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයට පහසුකම් සපයනු ලැබේ.

## 12.2 ගොඩනැගිලි

### 12.2.1 *පුස්තකාලය - කුලියාපිටිය*

කුලියාපිටිය පරිශ්‍රයේ පුස්තකාලය පැරණි පරිපාලන ගොඩනැගිල්ලේ ඉහළ මාලයේ වම් කොටසේ පිහිටුවා තිබුණි. පරිපාලන කාර්යාලය වෙනත් ස්ථානයකට මාරු කළ පසු එම කොටස ද පුස්තකාලයට එක් කරමින් පුස්තකාලය පුළුල් කරන ලදි. දැනට ගොඩනැගිල්ලේ බිම් ප්‍රමාණය දළ වශයෙන් වර්ග අඩි 7326ක් වන අතර 141 දෙනෙකුට ආසන පහසුකම් ඇත.

### 12.2.2 *පුස්තකාලය - මාකඳුර*

මාකඳුර පරිශ්‍රයේ පුස්තකාලය ප්‍රධාන පාරට සමීපව, පීඨ දෙක අතර පිහිටා ඇත. මෙය 2006 ජූලි මස 27 දින විවෘත කළ නව දෙමහල් ගොඩනැගිල්ලක් වන අතර බිම් ප්‍රමාණය වර්ග අඩි 7200කි.

## 12.3 නව ජයග්‍රහණ

- පුස්තකාල වෙබ් අඩවිය හරහා e-journals පරිගණක දත්ත ගබඩා පහසුකම් පීඨ දෙක සඳහා ලබා දීම.
- 2013 වර්ෂයට අදාල නව ප්‍රතිග්‍රහන ලැයිස්තු පරිශ්‍ර දෙකේ පීඨ සහ දෙපාර්තමේන්තු සඳහා බෙදා හැරීම.
- ශිෂ්‍යයන් සහ අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා ස්වයං පුස්තකාල පොත් පත් පරීක්ෂා කිරීමේ සේවාව ආරම්භ කිරීම
- තොරතුරු තාක්ෂණ (IT) උපකරණ මිලදී ගෙන තොරතුරු තාක්ෂණ පහසුකම් පුළුල් කිරිම.
- විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පවත් වන ලද පුස්තකාල සම්පත් විශ්වවිද්‍යාල අතරේ හුවමාරු කර ගැනීම හා සුසංගත වීම.
- හරිවැරදි බැලීම් සහ තොග ගණන් බැලීම් කටයුතු පුස්තකාල දෙකෙහිම සාර්ථක ලෙස සිදු කිරීම

## 12.4 පුස්තකාල නව්‍යකරනය

- මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක සඳහා අලුතෙන් බඳවා ගන්නා ලද සිසුන්ට පුස්තකාල හඳුන්වාදීමේ වැඩසටහන 2013 අප්‍රේල් 11 සහ 24 දිනවලදී පවත්වන ලදි.

- ව්‍යවහාරික විද්‍යා පීඨයේ නවක සිසුන් සඳහා 2013 අප්‍රේල් 24 වන දින ප්‍රධාන පුස්තකාලය මඟින් සංවිධානය කරන ලද හඳුන්වාදීමේ වැඩසටහන සාර්ථකව පවත්වන ලදි.

- ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සිසුන්ට පැවති කාර්යය බහුල කාල සටහනට අනුව ප්‍රධාන පුස්තකාලය මඟින් සංවිධානය කරනු ලැබූ හඳුන්වාදීමේ වැඩසටහනට සහභාගී විය නොහැකි වූ අතර ඔවුන් සඳහා පුස්තකාල අත් පොත් බෙදා දෙන ලදි.

**12.5 වැඩමුළු**

- පුස්තකාලයාධිපති, ඩබ්ලිව්. ජී. පී. ගම්ලත් මහතා පහත වැඩසටහන් සඳහා සහභාගි විය.
    - කොළඹ විශ්වවිද්‍යාලය මඟින් 2013 මාර්තු 07 දින පවත්වන ලද වැඩමුළුව
    - කොළඹ විශ්වවිද්‍යාලය මඟින් 2013 මාර්තු 11 දින පවත්වන ලද “INASP’s plans” වැඩමුළුව
    - 2013 සැප්තැම්බර් 18 දින කොළඹ "සිනමන් ගාර්ඩන්" හෝටලයේ දී පවත්වන ලද “Consortium Formation: Working and Products” සමුළුව
    - කොළඹ විශ්වවිද්‍යාලය මඟින් 2013 අගෝස්තු 13 සහ 14 දිනවලදී පවත්වන ලද “Formulation a Consortium” වැඩමුළුව

- 2013 මැයි 14 දින පවත්වන ලද “New Trends in DDC” වැඩමුළුව සඳහා සහකාර පුස්තකාලාධිපතිනි, ඩී ජී ඒ එස් මල්කාන්ති මහත්මිය සහභාගී වීම

- කැළණිය විශ්වවිද්‍යාලයේ දී 2013 නොවැම්බර් මස 22 සහ 23 දින පවත්වන ලද දෙවන ජාත්‍යන්තර සමුළුවට ඉදිරිපත් වීම

    - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිනි, මහීකාන්ති තුසිතා කුමාරි මහත්මිය සහ සහකාර පුස්තකාලාධිපතිනි, ඩී ජී ඒ එස් මල්කාන්ති මහත්මිය (Join paper)

- 2013 නොවැම්බර් මස 29 දින NILIS පර්යේෂණ සම්මන්ත්‍රණයට ඉදිරිපත් වීම

    - ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිනි, මහීකාන්ති තුසිතා කුමාරි මහත්මිය සහ සහකාර පුස්තකාලාධිපති, ගයාන් ජයවර්ධන මහතා (Join Poster Paper)
    - සහකාර පුස්තකාලාධිපතිනි, ඩී ජී ඒ එස් මල්කාන්ති මහත්මිය

- ශ්‍රී ලංකා අග්නිදිග විශ්වවිද්‍යාලයේ දී 2013 නොවැම්බර් මස 25 දින සිට 28 දින දක්වා පවත්වන ලද KOHA (Linux Version Integrated Library Management System) භාවිතා කරමින් පුස්තකාල ස්වයංක්‍රියාකාරීත්වය පිළිබඳ වැඩමුළුව

    - සහකාර පුස්තකාලාධිපති, ගයාන් ජයවර්ධන මහතා
    - පද්ධති විශ්ලේෂක, ඊ එම් සී එල් ඒකනායක මහතා

- පුස්තකාල සහකාර (දෙවන ශ්‍රේණිය), ඩබ්ලිව් එම් ඒ එස් බණ්ඩාර මහතා සහ පුස්තකාල සහකාර (පළමු ශ්‍රේණිය) කේ ඩී එන් ජයවර්ධන මහතා 2013 පෙබරවාරි මස 5 සහ 6 දිනවලදී මීරිගම දී පවත්වන ලද "වෘත්තීය සංවර්ධන පුහුණු වැඩසටහන"ට සහභාගී වීම

- සේවක සංවර්ධන ඒකකය මඟින් 2013 දී පවත්වනු ලැබූ "පුද්ගලික කුසලතා සංවර්ධනය සහ සේවා ස්ථානයේ වගකීම්" පිළිබඳව වූ වැඩමුළුව සඳහා පහත සඳහන් සේවකභවතුන් සහභාගී වීම.

    - ඩබ්ලිව් එම් ඩී එස් දයානන්ද මිය, පුස්තකාල සහකාර
    - ජේ ඒ එන් ජයකොඩි මිය, පුස්තකාල සහකාර
    - ජේ ඒ එස් ජයසිංහ මයා, පුස්තකාල සහකාර
    - ඩී පී එම් දසනායක මයා, පුස්තකාල සහායක
    - එස් එම් එල් වික්‍රමසිංහ මහතා, පුස්තකාල කම්කරු
    - එච් එම් හේරත් බණ්ඩා මහතා, පුස්තකාල කම්කරු
    - ආර් ඒ ආර් ඩී රණවීර මෙය, පුස්තකාල කම්කරු

## 12.6 ලියාපදිංචි වූ පාඨකයින්

### අ) කුලියාපිටිය පරිශ්‍රය

| පාඨකයින් | 2013.12.31 දක්වා | 2013 වර්ෂය තුළ |
|---|---|---|
| ශිෂ්‍යයින් | 4321 | 568 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය<br>ස්ථිර<br>තාවකාලික | <br>113<br>223 | <br>12<br>18 |
| විධායක නිලධාරී කාර්යය මණ්ඩලය | 52 | 04 |
| අනධ්‍යයන කාර්යය මණ්ඩලය | 243 | 32 |

### ආ) මාකඳුර පරිශ්‍රය

| පාඨකයින් | 2013.12.31 දක්වා | 2013 වර්ෂය තුළ |
|---|---|---|
| ශිෂ්‍යයින් | 2189 | 230 |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය<br>ස්ථිර<br>තාවකාලික | <br>57<br>71 | <br>09<br>21 |
| විධායක නිලධාරී කාර්යය මණ්ඩලය | 07 | 01 |
| අනධ්‍යයන කාර්යය මණ්ඩලය | 84 | 06 |

## 12.7 පොත් සහ වාර සඟරා සඳහා වැය ශීර්ෂය

*පුස්තකාලය සඳහා වෙන් කිරීම්:*

පොත් සහ වාර සඟරා - රු. 5, 760, 000.00 (මිලියන 5.76) - ප්‍රධාන පුස්තකාලය

- රු. 3, 600, 000.00 (මිලියන 3.6) - මාකඳුර පුස්තකාලය

*වියදම:*

### අ) පුස්තකාලය – කුලියාපිටිය

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 2,851,816.18 | රු. 930.00 |
| පොත් 1652 | වාර සඟරා 02 |

**සම්පූර්ණ වියදම - රු. 2,852,746.18**

### ආ) පුස්තකාලය – මාකඳුර

| පොත් | වාර සඟරා |
|---|---|
| රු. 3,640,449.00 | රු. 103,710.00 |
| පොත් 280 | වාර සඟරා 07 + AGORA පරිගණක දත්ත ගබඩාව |

**සම්පූර්ණ වියදම - රු. 3,744,159.39**

**12.8 පොත් තොග ප්‍රමාණය**

පුස්තකාලයේ පොත් ලබා ගැනීමේ ලේඛනයට අනුව 2013.12.31 දින වන විට සම්පූර්ණ පොත් සංඛ්‍යාව.

පුස්තකාලය කුලියාපිටිය පරිශ්‍රය - 35596

පුස්තකාලය මාකඳුර පරිශ්‍රය - 17258

වර්ෂය තුළ කුලියාපිටිය පුස්තකාලයේ පොත් 1652 අතරින් පොත් 364 ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත. එමෙන්ම මාකඳුර පුස්තකාලයේ පොත් 884 න් පොත් 604ක් පරිත්‍යාග වශයෙන් ලැබී ඇත.

**12.9 ආදායම**

**12.9.1 පුස්තකාල දඩ**

අ) පුස්තකාලය කුලියාපිටිය පරිශ්‍රය

| | |
|---|---|
| නැති වූ පොත් සඳහා අයකර ගැනීම | - රු. 7335.00 |
| පුස්තකාල ප්‍රවේශ පත්‍ර අනුපිටපත් සඳහා | - රු. 750.00 |
| පුස්තකාල දඩ | - රු. 39724.00 |
| එකතුව | - රු. 47809.00 |

ආ) පුස්තකාලය මාකඳුර පරිශ්‍රය

| | |
|---|---|
| නැති වූ පොත් සඳහා අයකර ගැනීම | - රු. 750.00 |
| පුස්තකාල ප්‍රවේශ පත්‍ර අනුපිටපත් සඳහා | - රු. 575.00 |
| පුස්තකාල දඩ | - රු. 1040.00 |
| එකතුව | - රු. 2365.00 |

**12.9.2 ඡායා පිටපත් සේවාව**

අ) පුස්තකාලය කුලියාපිටිය පරිශ්‍රය

| | |
|---|---|
| ඡායා පිටපත් කූපන් (නිකුත් කරන ලද) | - රු. 37 600.00 |
| ආදායම | - රු. 37 600.00 |

ආ) පුස්තකාලය මාකඳුර පරිශ්‍රය

| | |
|---|---|
| ඡායා පිටපත් කූපන් | - රු. 12 250.00 |
| ආදායම | - රු. 12 250.00 |

**12.9.3 පොත් බැඳීම් අංශයේ සංඛ්‍යා ලේඛන**

බඳින ලද පොත් සංඛ්‍යාව - 164

අලුත්වැඩියා කරන ලද පොත් - 25

**12.10 පුස්තකාලයේ කාර්යය මණ්ඩලය (අධ්‍යයන, අධ්‍යයන සහායක සහ පරිපාලන) 2013.12.31 දිනට**

| **පුස්තකාලය** | අනුමත සේවක සංඛ්‍යාව | පුස්තකාලයාධිපති | ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපති | සහකාර පුස්තකාලයාධිපති | සහකාර ලේඛකාධිකාරී (පුස්තකාල සේවා) | පද්ධති විශ්ලේෂක | එකතුව | පුරප්පාඩු ගණන |
|---|---|---|---|---|---|---|---|---|
| පුස්තකාලය – කුලියාපිටිය පරිශ්‍රය | 5 | 1 | 1 | 1 | 1 | 1 | **5** | **0** |
| පුස්තකාලය – මාකඳුර පරිශ්‍රය | 2 | - | 1 | 1 | - | - | **2** | **0** |


## 13. උපාධි අපේක්ෂකයන් සඳහා නේවාසිකාගාර පහසුකම් - 2013

| විශ්වවිද්‍යාල නේවාසිකාගාර | නේවාසිකාගාර පහසුකම් ලබාගත් සිසුන් සංඛ්‍යාව | | කුලියට ලබා ගත් නේවාසිකාගාර | නේවාසිකාගාර පහසුකම් ලබාගත් සිසුන් සංඛ්‍යාව | |
|---|---|---|---|---|---|
| | **ශිෂ්‍යයන්** | **ශිෂ්‍යාවන්** | | **ශිෂ්‍යයන්** | **ශිෂ්‍යාවන්** |
| පණ්ඩුකාභය – කුලියාපිටිය | - | 60 | කාරියවසම් (1 සහ 2 මහළ) | 60 | - |
| දීඝගාමිණී - කුලියාපිටිය | - | 56 | | | |
| ස්වර්ණපාලී - කුලියාපිටිය | 60 | - | අශෝක | - | 40 |
| චිත්‍රාදේවී- කුලියාපිටිය | 60 | - | | | |
| නව කාන්තා නේවාසිකාගාරය - කුලියාපිටිය | - | 80 | | | |
| සපුමල් බණ්ඩාර I සහ II - මාකඳුර | 120 | - | | | |
| බිසෝ බණ්ඩාර I සහ II - මාකඳුර | - | 120 | | | |
| **එකතුව** | **240** | **316** | **එකතුව** | **60** | **40** |


2013 වසරේ දී ශිෂ්‍යයන් 1023 සහ ශිෂ්‍යාවන් 1549 කි. ඉන් ශිෂ්‍යයන් 240ක් සඳහා ද ශිෂ්‍යාවන් 316 දෙනෙකු සඳහා ද විශ්වවිද්‍යාල නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත. සාමාන්‍යයෙන් විශ්වවිද්‍යාලයේ පළමු වසර හා අවසන් වසර ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට නේවාසිකාගාර පහසුකම් ලබා දෙන අතර ඒ සඳහා ඔවුන්ගේ පදිංචි ස්ථානයේ සිට විශ්වවිද්‍යාලයට ඇති දුර ප්‍රමාණය සලකා බලනු ලබයි.

විශ්වවිද්‍යාලය සතුව පවතින නේවාසිකාගාර ප්‍රමාණවත් නොවන බැවින් බදු පදනම මත පෞද්ගලික අංශයෙන් නේවාසිකාගාර 2ක් ලබා ගෙන ශිෂ්‍යයන් 60ක් සඳහා සහ ශිෂ්‍යාවන් 40ක් සඳහා නේවාසිකාගාර පහසුකම් ලබා දී ඇත.

**2013 නේවාසිකාගාර පහසුකම් – ශිෂ්‍යයන් සඳහා**




**2013 නේවාසිකාගාර පහසුකම් – ශිෂ්‍යාවන් සඳහා**




## 13.1 කුලී නේවාසිකාගාර සඳහා වාර්ෂික වියදම 2013

| නේවාසිකාගාර (කුලියාපිටිය පරිශ්‍රය) | වියදම් වූ මුදල රු. |
|---|---|
| කාරියවසම් (1 සහ 2 මහළ) | 270,000.00 |
| අශෝක | 567,000.00 |
| එකතුව | **837,000.00** |


2011 - 2013 කාල පරාසය තුළ උපාධි අපේක්ෂකයින්ට නේවාසිකාගාර පහසුකම් ලබා දීම සැසඳීම

| වර්ෂය | විශ්වවිද්‍යාල නේවාසිකාගාර | | කුලියට ලබා ගත් නේවාසිකාගාර | | එකතුව |
|---|---|---|---|---|---|
| | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් | ශිෂ්‍යයන් | ශිෂ්‍යාවන් | |
| 2011 | 240 | 336 | 150 | 40 | 766 |
| 2012 | 240 | 336 | 150 | 40 | 766 |
| 2013 | 240 | 316 | 60 | 40 | 656 |

# 14. මහපොළ සහ ශිෂ්‍යාධාරලාභීන්

| පීඨය | මහපොළ | ශිෂ්‍යාධාර |
|---|---|---|
| කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ | 89 | 128 |
| ව්‍යවහාරික විද්‍යා | 52 | 357 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 397 | 599 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 76 | 216 |
| **එකතුව** | **614** | **1300** |

2013 වසරේදී විශ්වවිද්‍යාලයේ 2572ක් වූ සමස්ත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් සිසුන් 614ක් මහපොළලාභීන් වූ අතර 1300ක් සිසුන් ශිෂ්‍යාධාර ලාභීන් වූහ. එනම් 24% ක් සහ 51%ක් වශයෙනි.




**ශිෂ්‍යාධාර/ මහපොළ ශිෂ්‍යත්ව ලැබීම් - 2013**

2011 - 2013 කාල පරාසය තුළ මහපොළ හා ශිෂ්‍යාධාර ලැබූ ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගණන සැසඳීම

| පීඨය | ශිෂ්‍යාධාර | | | මහපොළ | | |
|---|---|---|---|---|---|---|
| | **2011** | **2012** | **2013** | **2011** | **2012** | **2013** |
| කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන | 162 | 124 | 128 | 136 | 125 | 89 |
| ව්‍යවහාරික විද්‍යා | 157 | 167 | 357 | 78 | 77 | 52 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | 326 | 354 | 599 | 379 | 493 | 397 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ | 97 | 116 | 216 | 146 | 192 | 76 |
| **එකතුව** | **742** | **761** | **1300** | **739** | **887** | **614** |

# 15. පර්යේෂණ, නව සොයා ගැනීම් හා ප්‍රකාශන

## 15.1 කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 185 | 01 | 115 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | 02 | 01 | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 15 | - | 08 |
| ඈ. පොත් සංඛ්‍යාව | 07 | - | 03 |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 05 | - | 05 |
| ඊ. අනෙකුත් | 02 | - | - |
| **එකතුව** | **216** | **02** | **131** |

## 15.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 28 | 01 | 19 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | 01 | 01 | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 20 | - | 11 |
| ඈ. පොත් සංඛ්‍යාව | 02 | - | 01 |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 01 | - | - |
| ඊ. අනෙකුත් | 01 | - | 02 |
| **එකතුව** | **53** | **02** | **33** |

**15.3** ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 06 | - | 06 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | - | - | - |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 05 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 04 | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 08 | - | 06 |
| ඊ. අනෙකුත් | - | - | - |
| **එකතුව** | **23** | **-** | **12** |

**15.4** පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | ප්‍රකාශිත | වාණිජ මට්ටමට පත් කිරීම් | ඉදිරිපත් කිරීම් |
|---|---|---|---|
| අ. පර්යේෂණ සංඛ්‍යාව | 41 | - | 45 |
| ආ. නවසොයා ගැනීම් සංඛ්‍යාව | 05 | - | 07 |
| ඇ. වාර සඟරා සංඛ්‍යාව | 05 | - | - |
| ඈ. පොත් සංඛ්‍යාව | 02 | - | - |
| ඉ. පත්‍රිකා සංඛ්‍යාව | 15 | - | 11 |
| ඊ. අනෙකුත් | 07 | - | 02 |
| **එකතුව** | **75** | **-** | **65** |

## 16. අධ්‍යයන කාර්යය මණ්ඩලය විසින් සම්පූර්ණ කරන ලද පශ්චාත් උපාධි - 2013

### 16.1 කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය

| විෂය | 2013.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | 2013 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනශූරී | 18 | - | - |
| දර්ශනපති | 02 | 01 | - |
| විද්‍යාපති | 05 | - | - |
| **එකතුව** | **24** | **-** | **-** |

### 16.2 ව්‍යවහාරික විද්‍යා පීඨය

| විෂය | 2013.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | 2013 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | දේශීය | විදේශීය |
| දර්ශනශූරී / විද්‍යාව පිළිබඳ ආචාර්ය උපාධිය / ඉංජිනේරු ආචාර්ය උපාධිය | 12 | - | 01 |
| දර්ශනපති | 02 | 01 | - |
| විද්‍යාපති | 12 | 02 | - |
| ව්‍යාපාර පරිපාලනපති | 04 | - | |
| **එකතුව** | **30** | **03** | **01** |

**16.3** **ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

| **විෂය** | **2013.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව** | **2013 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව** | |
|---|---|---|---|
| | | **දේශීය** | **විදේශීය** |
| දර්ශනශූරී | 03 | 01 | - |
| වාණිජපති/විද්‍යාපති/සමාජීය විද්‍යාපති/මූල්‍ය ගිණුම්කරණපති /ශාස්ත්‍රපති | 09 | - | - |
| ව්‍යාපාර පරිපාලනපති | 06 | 01 | |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | 01 | - | - |
| **එකතුව** | **19** | **02** | **-** |

**16.4** **පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

| **විෂය** | **2013.12.31 දින වන විට පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව** | **2013 වර්ෂය තුළ දී පශ්චාත් උපාධිය සම්පූර්ණ කරන ලද සංඛ්‍යාව** | |
|---|---|---|---|
| | | **දේශීය** | **විදේශීය** |
| දර්ශනසූරී | 13 | - | - |
| දර්ශනපති | 07 | 02 | - |
| විද්‍යාපති | 06 | - | - |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා | - | - | - |
| **එකතුව** | **26** | **02** | **-** |

## 17. ලැබී ඇති ප්‍රදානයන් පිළිබඳ විස්තර

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | 03 | 03 | - |
| ආ. ජාතික ප්‍රදාන | 01 | 01 | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | - | - | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | **11** | **10** | **-** |

**17.1 කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | 03 | 03 | - |
| ආ. ජාතික ප්‍රදාන | 01 | 01 | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | - | - | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | **04** | **04** | **-** |

***ජාතික ප්‍රදාන***

**මහාචාර්ය ඒ නුගවෙල** - විද්‍යාත්මක ප්‍රකාශන සඳහා ජනාධිපති ප්‍රදාන

***දේශීය ප්‍රදාන***

**ආචාර්ය කේ විවේහානන්තන්** - විශ්වවිද්‍යාල ප්‍රදාන SRHDC/RP/04/13 – 07

**ආචාර්ය එස් එන් ටී ද සිල්වා** - විශ්වවිද්‍යාල ප්‍රදාන SRHDC/RP/04/13 – 18

**ආචාර්ය එන් එස් කෝට්ටේආරච්චි** - විශ්වවිද්‍යාල ප්‍රදාන SRHDC/RP/04/13 – 17

**17.2 ව්‍යවහාරික විද්‍යා පීඨය**

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | 01 | 01 | - |
| ආ. ජාතික ප්‍රදාන | 01 | 01 | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | 01 | 01 | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | **03** | **03** | - |

***දේශීය ප්‍රදාන***

**ආචාර්ය වයි ඒ ඒ කුමාරයාපා**

*ජාතික ප්‍රදාන*

**ජේ එම් ජේ ඩබ්ලිව් ජයසිංහ මහත්මිය**

*ජාත්‍යන්තර ප්‍රදාන*

**ආචාර්ය පී එම් එන් ධර්මවර්ධන -** "උත්කෘෂ්ට යෞවන පර්යේෂක 2013" සඳහා ජපානයේ කියුෂිහි දී සහතික පත්‍ර ලබා ගැනීම

## 17.3 ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | - | - | - |
| ආ. ජාතික ප්‍රදාන | - | - | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | 01 | 01 | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | **01** | **01** | **-** |

*ජාත්‍යන්තර ප්‍රදාන*

**ආචාර්ය ඩී ඒ එම් පෙරේරා -** ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම විසින් 2013 දී සංවිධානය කරනු ලැබූ දෙවන ජාත්‍යන්තර සමුළුවේදී **"සමාජීය විද්‍යාව සහ කළමණාකරනය"** මැයෙන් කරන ලද ඉදිරිපත් කිරීම වෙනුවෙන් හොඳම පර්යේෂණ ඉදිරිපත් කරන්නා ලෙස ලබාගත් කුසලතා ප්‍රදානය

## 17.4 පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

| විෂය | ප්‍රදාන ගණන | අධ්‍යයන කාර්යය මණ්ඩලයේ සංඛ්‍යාව | ශිෂ්‍යයන් සංඛ්‍යාව |
|---|---|---|---|
| අ. දේශීය ප්‍රදාන | - | - | - |
| ආ. ජාතික ප්‍රදාන | 01 | 01 | - |
| ඇ. ජාත්‍යන්තර ප්‍රදාන | 02 | 01 | - |
| ඈ. වෙනත් | - | - | - |
| එකතුව | **03** | **02** | **-** |

**ආචාර්ය ජී ඒ පී චන්ද්‍රසේකර -** 2013 ජාතික විද්‍යා පදනම් අන්තර්ජාතික ගමනා ගමන ප්‍රදානය, ශ්‍රී ලංකා ජාතික විද්‍යා පදනම

**ආචාර්ය සී වී එල් ජයසිංහ -** කෘෂිකර්ම, වන හා ආහාර විද්‍යාව / තාක්ෂණය පිළිබඳව පොදුරජ මඩුළු විශ්වවිද්‍යාල සංවිධානය විසින් 2013 වර්ෂයේදී ප්‍රදානය කරන ලද සීමාසහිත ජෝර්ජ් වෙස්ටර්න්, කැනඩා අධි ශිෂ්‍යත්වය

# 18. ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## 18.1 හැඳින්වීම

ගෝලීය මට්ටමින් බලන කළ ශාස්ත්‍රීය සහ ක්‍රීඩා යනු විශ්වවිද්‍යාල අධ්‍යාපනයේ එක හා සමාන වැදගත් අංග දෙකකි. ක්‍රීඩාවෙන් ලබා ගන්නා දැනුම සිසුන්ගේ චරිතය සාරවත් කර, උසස් ගෞරවාන්විතව සමාජයට සේවය කරන පුද්ගලයෙක් බවට මනාව සූදානම් කරදීම ද සිදු කරනු ලබයි.

ශිෂ්‍යයෙකුගේ වෘත්තීය ජීවිතයට අමතරව එදිනෙදා ජීවිතයට හොඳ වටිනාකමක් ලබා දෙන එක් වැදගත් අංගයකි විද්‍යාලයේදී ක්‍රීඩාවල නිරතවීම.

වයඹ විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකය අධ්‍යාපනය හා ක්‍රීඩාව යන අංග දෙකෙන්ම පිරිපුන් තරුණ උපාධිධාරියෙක් සමාජයට දායාද කිරීම සඳහා විශිෂ්ඨ කාර්යයභාරයක් කරනු ලබයි. එම කාර්යභාරය මූලිකවම කරනු ලබන්නේ විවිධාකාර ශාරීරික වැඩසටහන් හා ක්‍රියාකාරකම් මඟිනි.

ක්‍රීඩාවලට සහභාගීත්වය, ජයග්‍රහන ලබා ගැනීම හා ක්‍රීඩා කුසලතා දියුණු කරලීම තුළින් සියලුම ශිෂ්‍යයන්ගේ ජීවිතයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අපගේ අපේක්ෂාවයි.

ශාරීරික අධ්‍යාපන ඒකකය නව ජවයක් හා වෙනසක් ඇති කිරීමට බැඳී සිටී.

විශ්වවිද්‍යාලය තුළ ඇති ක්‍රීඩා පද්ධතිය මඟින් සිසුන්ගේ දක්ෂතා වැඩිදියුණු කිරීම හා ඔවුන් යම් යම් දේවල්වලට උපරිම ලෙස සහභාගී කරවා ගැනීම පහසුවෙන් සිදුකරනු ලැබේ. එය විශ්වවිද්‍යාල සේවක මණ්ඩලයට පවා විවෘතව ඇත.

අපගේ දෙපාර්තමේන්තුව මූලික කරුණු තුනක් මත ක්‍රියාත්මක වේ.

- යටිතල පහසුකම් සැපයීම - සැලසුම් නිර්මාණය කිරීම ක්‍රීඩා හා විනෝදාංශ පහසුකම්වල ගුණාත්මක භාවය කළමණාකරනය කිරීම. උදා :- ක්‍රීඩා පිටි, ගෘහස්ථ ක්‍රීඩාගාර, ක්‍රීඩා භාණ්ඩ හා උපකරණ, ක්‍රීඩා ඇඳුම් ආදිය


- පුද්ගල සංවර්ධනය - පාරිපාලනය, නිලධාරීන්, පුහුණුකරුවන් හා ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වන්නන් සපයන සේවාවන් මඟින් ක්‍රීඩාවල නිරත පුද්ගලයන්ට තොරතුරු, උපදෙස් හා දැනුම ලබා දීම.

- ක්‍රීඩා තරඟාවලි සංවිධානය හා බාහිර තරඟාවලි සඳහා සිසුන් සහභාගී කරවීම

මෙම උපායමාර්ගික අභිප්‍රායන් ක්‍රියාත්මක කිරීම මඟින් ක්‍රීඩාව උපරිම ලෙස යොදාගෙන සමාජයට භෞතිකව හා මානසිකව ක්‍රියාකාරී පුද්ගලයන් නිර්මාණය කරදීම දෙපාර්තමේන්තුවේ අරමුණු වේ.

මෙම වාර්තාව මඟින් 2013 වර්ෂය තුළ වූ ක්‍රියාකාරකම්, මතකයන් සහ ජයග්‍රහණයන් ආදියෙහි සාරාංශයක් ඔබවෙත ලබා දේ. ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ශාරීරික අධ්‍යාපන ඒකකයේ වෘත්තීය දැක්ම තුළ 2013 වර්ෂය තවත් නොමැකෙන වසරකි.

### 18.2 ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ව්‍යුහය




### 18.3 කාර්යය මණ්ඩල ව්‍යුහය

2013 වර්ෂය තුළදී ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවට සුදුසුකම් ලත් බාහිර උපදේශකවරුන් 07 දෙනෙකු බඳවා ගන්නා ලද අතර, පහත සඳහන් ක්‍රීඩා පුහුණු කිරීම්වලට ඔවුන්ගේ උපරිම දායකත්වය ලැබී ඇත.

| ක්‍රීඩාව | නම | අදාළ ක්‍රීඩාව සඳහා සුදුසුකම් |
|---|---|---|
| 1 චෙස් | ජේ.එම්.සී.බී. රත්ගල්ල මහතා | විශ්වවිද්‍යාල කණ්ඩායමේ හිටපු ක්‍රීඩක සහ විශ්වවිද්‍යාලයේ වර්ණ ප්‍රදානයේ ජයග්‍රාහකයා |
| 2 එල්ලේ | ජී. විමලසිරි මහතා | වයඹ පළාත් විශිෂ්ඨ ජාතික ක්‍රීඩකයා |
| 3 හොකි | ඩබ්ලිව්.එස්.එම්.ඩී. බොතේජු මහතා | ශ්‍රී ලංකා ගුවන් සේවා හොකි කණ්ඩායමේ සමාජිකත්වය |
| 4 රගර් | බී.එම්.බී.ඩී. බණ්ඩාර මහතා | සුදුසුකම්ලත් දෙවන තලයේ රග්බි පුහුණුකරු |
| 5 පිහිනුම් | එන්.එම්.ජේ.කේ. නවරත්න මහතා | පිහිනුම් පුහුණුකරු – ශිල්ප ශාලිකා |
| 6. මේස පන්දු | ටී.එම්.කේ.පී.බී. තෙන්නකෝන් මහතා | පාසල් පුහුණුකරු |
| 7 බර එසවීම | එල්.ආර්.සී.එල්.කේ. ලියනගෙදර මහතා | ජාතික ක්‍රීඩක |

**18.4** 2013 වර්ෂය තුළ ලැබූ ජයග්‍රහන

18.4.1 **විශ්වවිද්‍යාල වර්ණ ප්‍රධානෝත්සවය**

හතරවැනි විශ්වවිද්‍යාල වර්ණ ප්‍රධානෝත්සවය 2013 දෙසැම්බර් මස 04 වැනි දින ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ දී පැවැත්විය. අදාළ ක්‍රීඩා ඉසව් සඳහා තම දක්ෂතාවය දක්වමින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් 101 දෙනෙක් ක්‍රීඩා ඉසව් 17 කට පිදුම් ලැබූහ. වයඹ විශ්වවිද්‍යාල ක්‍රීඩා සමාජය සහ ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් මෙම උත්සවය සංවිධානය කරන ලදී.

**විශ්වවිද්‍යාල වර්ණ ජයග්‍රහකයන් 2011/2012**

2011 - ක්‍රීඩක ක්‍රීඩිකාවන් 53

2012 - ක්‍රීඩක ක්‍රීඩිකාවන් 48

**විශේෂ ප්‍රදාන ලබා ගැනීම් - 2011**

**පිරිමි**

01. ඩී.එම්.ඊ.පී.බී. දසනායක

02. එස්. සාරංග

**කාන්තා**

01. ඒ.ආර්. සිෆායා

**විශේෂ ප්‍රදාන ලබා ගැනීම් - 2012**

**පිරිමි**

01. බී.එස්.ඒ. තිලකරත්න

02. ආර්.ඒ.ඒ. ප්‍රියන්ත

**විශිෂ්ට ක්‍රීඩකයා - 2011**

ඩී.එම්.ඊ.පී.බී. දසනායක

**විශිෂ්ට ක්‍රීඩිකාව - 2011**

ඒ.ආර්. සිෆායා

**විශිෂ්ට ක්‍රීඩකයා - 2012**

ආර්.ඒ.ඒ. ප්‍රියන්ත

**18.5 වාර්ෂික ක්‍රීඩා වැඩසටහන්**

**18.5.1 *අන්තර් පීඨ නවක සිසුන්ගේ ශූරතාව – 2013***


අලුත් කණ්ඩායමක සිටින තරුණ පිරිස අලුත් පරිශ්‍රයකට පියවරක් තබන විට ඔවුන්ව ක්‍රීඩා කටයුතු සඳහා සහභාගි කර ගැනීමට නව්‍යකරණ විසඳුම් අවශ්‍ය විය. මෙම අවශ්‍යතාවය තේරුම් ගැනීමෙන් අනතුරුව නවක සිසුන්ව විශ්වවිද්‍යාල ක්‍රීඩා කටයුතුවලට දිරිමත් කිරීම සඳහා ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව අන්තර් පීඨ නවක ශූරතාවය සංවිධානය කරනු ලබයි.

මෙම වර්ෂයේද දෙපාර්තමේන්තුව විසින් ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා ක්‍රීඩා අංග 18ක් ඇතුලත් කරමින් අන්තර් පීඨ නවක ශූරතාවය සංවිධානය කරනු ලැබීය.

01. බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා)
02. චෙස් (පිරිමි/කාන්තා)
03. පාපන්දු
04. අත්පන්දු (පිරිමි/කාන්තා)
05.පැසිපන්දු (පිරිමි/කාන්තා)
06. ක්‍රිකට්
07 දැල්පන්දු
08. බර එසවීම
09. කැරම් (පිරිමි/කාන්තා)
10. එල්ලේ (පිරිමි/කාන්තා)
11. මේසපන්දු (පිරිමි/කාන්තා)

2013 ජූනි 17 දින සිට 27 දින දක්වා කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රවලදී මෙම ක්‍රීඩා තරග පැවැත්විය.

***අන්තර් පීඨ නවක සිසුන්ගේ ලකුණු සටහන***





**අන්තර් පීඨ ශූරතාව *-2013***

අන්තර් පීඨ ශූරතාව 2013 ජූලි 29 සිට අගෝස්තු 08 දක්වා විශ්වවිද්‍යාල පරිශ්‍රයේදි සහ ශිල්ප ශාලිකා ක්‍රීඩා සංකීර්ණයේදි පැවැත්විණි. පිහිනීම් (කාන්තා/පිරිමි), ජවන සහ පිටියේ ක්‍රීඩා ඇතුලත්ව ක්‍රීඩා අංග 23ක් පැවැත්විණි.

**අන්තර් පීඨ සහභාගිත්වය**


| 2013 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ (APM) | ව්‍යවහාරික විද්‍යා (AS) | ව්‍යාපාර අධ්‍යනය සහ මූල්‍ය (BSF) | පශු සම්පත්, ධීවර හා පෝෂණ (LFN) | |
| පිරිමි | 35 | 51 | 78 | 32 | 198 |
| ගැහැණු | 45 | 44 | 62 | 28 | 179 |
| එකතුව | 82 | 95 | 140 | 60 | 377 |
| ලියාපදිංචි වූ ප්‍රමාණය 2013 | 137 | 143 | 490 | 138 | 908 |
| සහභාගි වූ ප්‍රතිශතය | 59% | 66% | 28% | 43% | 41% |

**අන්තර් පීඨ සහභාගිත්වය 2013**




අන්තර් පීඨ ශූරතාවලිය සඳහා සිසුන්ගේ සහභාගිවීමේ ප්‍රතිශතය ක්‍රීඩා කටයුතුවලට සහභාගි වී සිටින විශ්වවිද්‍යාලයේ මුළු ශිෂ්‍ය සංඛ්‍යාවෙන් කොපමණදැයි පෙන්නුම් කරයි. සංසන්දනය කිරීමේදී මෙම අගය ඉතා අඩු මට්ටමක පවතී.

2013 අන්තර් පීඨ ශූරතාවලියේ අවසන් ප්‍රතිඵල පහත පරිදි වේ.



## 18.5.2 ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තරඟාවලිය -2013

11 වැනි ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල තරඟාවලිය 2013 මැයි 02 වන දින සිට මැයි මස 12 දින දක්වා මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කර තිබුණි.

ක්‍රීඩා අංග 34ක් මොරටුව විශ්වවිද්‍යාලයේ සහ වෙනත් ස්ථානවල සංවිධිනය කර තිබුණි.

### ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තරඟාවලියේ ජයග්‍රහණ - 2013

සමස්ථ ජයග්‍රහණ : විශ්වවිද්‍යාල 14 ක් අතරින් 8 වෙනි ස්ථානය දිනා ගැනීම සහ ක්‍රීඩා ඉසව් 30 කට සහභාගි වීම.

***තනි ඉසව්***

| නම | ක්‍රීඩාව | ලැබූ ස්ථානය |
|---|---|---|
| ආර්.ඒ.ඒ. ප්‍රියන්ත | මල්ලව පොර 60 Kg | රන් පදක්කම |
| එස්.ඒ.ඩී.එස්.ආර්. ප්‍රියාන් | මල්ලව පොර 84 Kg | රිදී පදක්කම |
| ඊ.එම්.ඒ.එම්.කේ. ඒකනායක | මල්ලව පොර 60 Kg | ලෝකඩ පදක්කම |
| ඩී.එන්.ඩී. කුමාරසිංහ | මල්ලව පොර 96 Kg | ලෝකඩ පදක්කම |
| ඒ.එම්.එස්.ඩී. ආරියරත්න | මල්ලව පොර 74 Kg | ලෝකඩ පදක්කම |
| බී.ඒ.එස්.ඒ. තිලකරත්න | බර එසවීම 56.0 Kg | ලෝකඩ පදක්කම |
| ආර්.ඒ.ඒ. ප්‍රියන්ත | බර එසවීම 62 Kg | ලෝකඩ පදක්කම |
| එන්.කේ.එච්. හන්සිකා | ජවන හා පිටිය | රන් පදක්කම |
| අයි.ජී.ජී.කේ. ගමගේ | ජවන හා පිටිය | රිදී පදක්කම |
| ආර්.එම්.එස්. රණසිංහ | කරාටේ - පිරිමි 84 Kg යටතේ | රිදී පදක්කම |
| එම්.ඒ.යූ.යූ. ද සිල්වා | කරාටේ - පිරිමි 84 Kg ට වැඩි | රිදී පදක්කම |
| ඩබ්ලිව්.ඩී.එල්. කුරේරා | කරාටේ - කාන්තා 55 Kg යටතේ | ලෝකඩ පදක්කම |

***කණ්ඩායම් තරඟ***

| ***ක්‍රීඩාව*** | ***ලැබූ ස්ථානය*** |
|---|---|
| එල්ලේ (පිරිමි) | අනුශූරතාවය |

තරඟ 20කට සහභාගී වී කණ්ඩායම් 10 ක් අර්ධ අවසාන තරඟ සඳහා සුදුසුකම් ලැබූහ.


1. බැඩ්මින්ටන් (පිරිමි/කාන්තා)
2. එල්ලේ (පිරිමි/කාන්තා)
3. දැල් පන්දු
4. කැරම් (පිරිමි/කාන්තා)
5. පාපන්දු (පිරිමි)
6. මේස පන්දු (කාන්තා)
7. ක්‍රිකට් (පිරිමි)
8. හොකී (කාන්තා)
9. රග්බි

**ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තරඟාවලිය - 2013 සහභාගීත්වය**

| 2013 | පීඨය | | | | එකතුව |
|---|---|---|---|---|---|
| | කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන | ව්‍යවහාරික විද්‍යා | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය | පශුසම්පත්, ධීවර හා පෝෂණ | |
| පිරිමි | 23 | 60 | 70 | 18 | 171 |
| ගැහැණු | 11 | 37 | 44 | 10 | 102 |
| එකතුව | 34 | 97 | 114 | 28 | 273 |
| ලියාපදිංචි වූ ප්‍රමාණය 2013 | 439 | 428 | 1312 | 393 | 2572 |
| සහභාගි වූ ප්‍රතිශතය 2013 | 8% | 23% | 9% | 7% | 11% |
| සහභාගි වූ ප්‍රතිශතය 2012 | 9% | 27% | 9% | 8% | 12% |

ව්‍යවහාරික විද්‍යා පීඨය , 23% ක් වූ ඉහළම සහභාගිත්ව ප්‍රතිශතයක් පෙන්වූ අතර අනෙකුත් පීඨ තුනෙහිම අඩු අගයන් පෙන්වූහ.

**ශ්‍රී ලංකා විශ්වවිද්‍යාලයීය තරඟාවලිය - සහභාගීත්වය**




**18.6 අනෙකුත් ක්‍රීඩා වැඩසටහන්**

**විශ්වවිද්‍යාල මට්ටමේ අනෙකුත් තරඟ**

අපේ සිසුන් ,ඔවුන්ගේ අත්දැකීම් සහ හැකියාවන් වර්ධනය කර ගැනීම සඳහා පහත සඳහන් බාහිර තරඟාවලි සඳහා පසුගිය වර්ෂය තුළදී සහභාගි වූහ.

- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ UMiF බැඩ්මින්ටන් තරඟාවලිය - 2013
- අපගේ විශ්වවිද්‍යාල පරිශ්‍රය තුළ සංවිධානය කරන ලද විවිධ තරඟ
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Mora Six a Side ක්‍රිකට් තරඟාවලිය - 2013
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Mora Hockey 7'S ශූරතාවලිය - 2013
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Mora Football 7'S ශූරතාවලිය - 2013

- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ 13 වන Mora Sevens රග්බි තරගාවලිය - 2013
- කැළණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ FASTERS බැඩ්මින්ටන් තරගාවලිය - 2013
- කැළණිය විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ SIEG 2013 අන්තර් විශ්වවිද්‍යාලයීය මේස පන්දු ශූරතාවලිය
- මොරටුව විශ්වවිද්‍යාලය විසින් සංවිධානය කළ Mora SMASHES මේස පන්දු තරගාවලිය -2013

**ජාතික මට්ටමේ අනෙකුත් තරඟ**

- ශ්‍රී ලංකා ආධුනික බේස්බෝල සංගමය විසින් සංවිධානය කරනු ලැබූ ජාතික විවෘත බේස්බෝල ශූරතාවලිය - 2013
- ශ්‍රී ලංකා කැරම් සංගමය විසින් පවත්වනු ලැබූ ජනාධිපති කුසලාන කැරම් ශූරතාවලිය - 2013
- ශ්‍රී ලංකා කැරම් සංගමය විසින් සංවිධානය කරනු ලැබූ 45වන ජාතික කැරම් ශූරතාවලිය සහ ලංකා පිඟන් කැරම් ශූරතාවලිය - 2013
- ශ්‍රී ලංකා කැරම් සංගමය විසින් සංවිධානය කරන ලද ආධුනික කැරම් ශූරතාවලිය - 2013 සහ ලංකා පිඟන් කැරම් ශූරතාවලිය - 2013
- ශ්‍රී ලංකා කැරම් සංගමය විසින් සංවිධානය කරන ලද 11වැනි විවෘත RANGERS කැරම් ශූරතාවලිය
- කුරුණෑගල දිස්ත්‍රික් ක්‍රිකට් සංගමය විසින් පවත්වනු ලැබූ කොට්ඨාශ 111 ක්‍රිකට් තරගාවලිය - 2013

**ජාත්‍යන්තර මට්ටමේ අනෙකුත් තරඟ**

- අන්තර්ජාතික කරාටේ සංගමය විසින් සංවිධානය කරන ලද TAKIMOTO YOZO අන්තර්ජාතික විවෘත කරාටේ තරගාවලිය - 2013
- මලයාසියාවේ දී පවත්වන ලද 8වන වාර්ෂික UiTM ක්‍රීඩා උත්සවය – 2013

වාර්ෂික UiTM ක්‍රීඩා උත්සවය – 2013 , මලයාසියාවේ UiTM විශ්වවිද්‍යාලය මඟින් 2013 අගෝස්තු 29 දින සිට සැප්තැම්බර් 02 දින දක්වා සෙලන්ගර් හිදී පැවැත්වීමට සංවිධානය කර තිබුණි. අප විශ්වවිද්‍යාලයේ සිසුන් 14 දෙනෙකු බැඩ්මින්ටන් සහ රග්බි ඉසව් සඳහා සහභාගී විය.

ඔවුන්ට කිසිම ඉසව්වකින් ජයග්‍රහනය ලබා ගැනීමට නොහැකි වුවත් ඔවුන්ගේ උපරිම දක්ෂතාවය පෙන්වන ලදි. උසස් කුසලතාවයන්, විවිධ ශිල්පක්‍රම, උපායමාර්ග ඩැහැ ගැනීමටත් ජාත්‍යන්තර මට්ටමේ අත්දැකීම් ලබා ගැනීමටත් මෙම චාරිකාව බොහෝ ප්‍රයෝජනවත් විය.

## 18.7 විශේෂ වැඩසටහන්

**හඳුන්වාදීමේ වැඩසටහන/ ශාරීරික යෝග්‍යතා වැඩසටහන සහ ඇරෝබික් ව්‍යායාම වැඩසටහන**

සෞඛ්‍ය සම්පන්න සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සමාජයට බිහි කිරීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් දායකත්වය දක්වනු ලබයි. ඒ අනුව, සිසුන් සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා පුළුල් වැඩසටහන් කිහිපයක්ම සංවිධානය කරන ලදි.

**අනුස්ථාපනය කිරීමේ වැඩසටහන (හඳුන්වාදීමේ)**

ශාරීරික අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙහි අභිප්‍රාය, දැක්ම සහ පරමාර්ථය, ශාරීරික අධ්‍යාපන කටයුතුවලට සම්බන්ධ වීමට ඇති හැකියාව සහ එහි අනාගත වාසි, විශ්වවිද්‍යාලය තුළ ක්‍රීඩා කටයුතුවලට සම්බන්ධ වීමේ ප්‍රවණතාවයන් පිළිබඳව දැනුවත් කිරීම සඳහා නවක සිසුන් වෙනුවෙන් මෙම වැඩසටහන පවත්වනු ලැබීය.

**ඇරෝබික් ව්‍යායාම වැඩසටහන සහ ශාරීරික යෝග්‍යතා වැඩසටහන**

සෞඛ්‍ය සම්පන්න සේවකයින්, සෞඛ්‍ය පිරිහුණු සේවකයින්ට වඩා තුන් ගුණයක් ඵලදායි බව පරීක්ෂණ තුළින් පෙන්වා දෙයි.

"සෞඛ්‍ය සම්පන්න සේවකයින්ගේ නිවාඩු සහ සෞඛ්‍ය පිරිහුණු සේවකයින්ගේ නිවාඩු සංසන්දනය කර බලන විට සෞඛ්‍ය සම්පන්න සේවකයින්ගේ නිවාඩු 02කට සෞඛ්‍ය පිරිහුණු සේවකයින් ලෙඩ නිවාඩු 18ක් ලබා ගනී. රැකියා ස්ථාන තුළ සෞඛ්‍ය පිළිබඳව වැඩසටහන් පැවැත්වීම මඟින් ලෙඩ නිවාඩු 30% කින් අඩු කර ගත හැකි බවත්, එමෙන්ම ඵලදායිතාවය 53%කින් වැඩි කර ගත හැකි බවත්, ලෝක සෞඛ්‍ය සංවිධානය මඟින් කළ පරීක්ෂණ තුළින් පෙන්වා දෙයි.

දෙපාර්තමේන්තුව විසින් මෙම ඇරෝබික් ව්‍යායාම වැඩසටහන ආරම්භ කරනු ලැබුවේ ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම් සඳහා කාර්ය මණ්ඩලය දිරිමත් කිරීමට සහ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලයේ යහපැවැත්ම වෙනුවෙන් ක්‍රීඩාවට උනන්දු සංස්කෘතියක් ළඟා කර ගැනීම යන පරමාර්ථ දෙක මතය.

මෙම අවස්ථාව සඳහා සිසුන් සහ කාර්ය මණ්ඩලය යන දෙපාර්ශවයම සහභාගි වූහ. වර්ෂය පුරාවටම සෑම ක්‍රීඩකයෙකුම ශාරීරික යෝග්‍යතාව ඉහළ මට්ටමක පවත්වාගත යුතුය. එම නිසා විශ්වවිද්‍යාල ක්‍රීඩකයින් සඳහා අතිරේක ශාරීරික යෝග්‍යතා වැඩසටහනක් ආරම්භ කරන ලදි.

**18. 8 යහපත් අනාගතයක් සඳහා පහත කරුණු සළකා බැලීම සුදුසු වේ.**

1) නවීන ක්‍රීඩා උපකරණ සහ සියලු පහසුකම්වලින් සමන්විත ගෘහස්ථ ක්‍රීඩාගාරයක් ආරම්භ කිරීම.

2) එකම කාලයක් තුළ සියලුම පීඨවල අධ්‍යයන කටයුතු ආරම්භ කිරීම.

3) සිසුන් ප.ව. 4.30න් පසු අධ්‍යයන කටයුතුවලින් නිදහස් කිරීම.

4) අධ්‍යයන කාර්යය මණ්ඩලය මඟින් සිසුන් ක්‍රීඩාව සඳහා දිරිගැන්වීමට හැකි නම් එය ක්‍රීඩා අංශයට මහගු සහයෝගයකි.

5) සිසුන් ක්‍රීඩා කටයුතු සඳහා විශ්වවිද්‍යාලය නියෝජනය කරන විට දී අධ්‍යයන කටයුතුවලට සහනයක් ලබා දීම.

## 19. වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ මූලිකත්වයෙන් ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය 2003 ජනවාරි මස දී ස්ථාපිත කරන ලදි. විශ්වවිද්‍යාල සිසුන් හා රැකියා උත්පාදකයින් අතර සම්බන්ධය වඩා ශක්තිමත් කිරීම, විශ්වවිද්‍යාල සිසුන්ගේ නිපුනතා වැඩි දියුණු කිරීම හා වෘත්තීය කුසලතාවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීම මෙහි අරමුණවේ. මෙම ඒකකය සෘජුවම උපකුලපතිවරයාගේ අධීක්ෂණයට යටත් වන අතර ආරම්භයේ සිටම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මඟින් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමටත් ඒ සඳහා පහසුකම් සැපයීමත් කරනු ලැබේ.

වෘත්තීය මාර්ගෝපදේශන ඒකකය මඟින් සිසුන්ට තම වෘත්තීය අභිමතාර්ථයන් කරා ලඟාවීමට හැකිවන පරිදි අධ්‍යයන කටයුතු කරගෙන යාම සඳහා අන්‍යෝන්‍ය සහයෝගය දෙනු ලැබේ. මෙම ඒකකය මඟින් විවිධාකරණ සේවාවන් සැපයීමත්, අධ්‍යාපනික වැඩ සටහන් පැවැත්වීමත් හා සම්පත් දායකත්වයන් ලබා දීමත් සිදු කරනු ලැබේ.

- ඵලදායි රැකියාවක් ලබා ගැනීමේ අවස්ථාව
- සේවාවන් පුහුණුවීමට අවස්ථාව ලබා ගැනීම
- සිසුන්ගේ වෘත්තීය අභිමතාර්ථ හා බද්ධ වූ අතිරේක දැනුමක් ලබා ගැනීමට අවස්ථාව ලබා දේ

පුද්ගල පෞර්ෂ සංවර්ධනය මඟින් ඔවුන්ට ජගත් තලයේ තම රදා පැවැත්ම තහවුරු වීමට අදාල ක්ෂේත්‍ර නිපුනතා සම්බන්ධයෙන් වැඩමුළු සහ සම්මන්ත්‍රණ, ව්‍යවසායකත්ව සහ වෙනත් අදාල ක්ෂේත්‍ර සම්බන්ධ වැඩ සටහන් සඳහා සිසුන් තෝරා සහභාගී කරගෙන ඇත. සමාගම් මඟින් මෙම උපාධි අපේක්ෂකයින් තෝරාගෙන ඇත්තේ පෞද්ගලික සම්මුඛ පරීක්ෂණ මඟිනි.

### 19.1 දැක්ම

යාවජීව අධ්‍යාපනය, ආර්ථික සමෘද්ධිමත්භාවය, මානසික ස්ථාවරත්වය සහ සමාජ සංචලනය සහ අවසන් ඉලක්කය කරා මෙහෙය වෙන සංකීර්ණ කාර්යමය ලෝකයේ ප්‍රශස්ත වෘත්තීය අවස්ථා ලඟාකර දෙන, තත්වයෙන් උසස් සහ අත්‍යවශ්‍ය වෘත්තීය සහ මෘදු කුසලතාවලින් සමන්විත උපාධිලාභීන් පිරිසක් ලෙස දැනුවත්භාවය ඇතිකිරීම සහ සවිබලගැන්වීම.


### 19.2 මෙහෙවර

වෘත්තීය සහ මෘදු කුසලතා වර්ධනය කරගැනීමට උපකාරී වන වැඩසටහන් මෙන්ම ආයතනික සම්බන්ධතාව වර්ධනය කිරීම මඟින් සිසුන් තත්වයෙන් උසස් වෘත්තිකයන් බවට පත් කරලීමෙන් උද්‍යෝගී ගෝලීය පුරවැසියන්වීමට අවස්ථාව අපි සලසා දෙන්නෙමු.

### 19.3 අරමුණු

- වෘත්තීය සංවර්ධනය වෙනුවෙන් සම්මන්ත්‍රණ, වැඩමුළු, දේශන සහ පුහුණුවීම් වැනි විවිධ ක්‍රියාකාරකම් සංවිධානය කිරීම.
- සිසුන්ට ගැලපෙන හා තාත්වික වෘත්තීයක් තෝරාගැනීමට සහ වෘත්තීය මඟපෙන්වීමට සහාය වීම
- අධ්‍යාපනික සංවර්ධනය උදෙසා දායක වීමට තරුණයන් පෙළඹ වීම
- සිසුන්ට ඔවුන්ගේ අධ්‍යයන ගමන සාර්ථක කර ගැනීම සඳහා ඔවුන්ගේ කෙටි කාලීන සහ දිගු කාලීන අරමුණු පෙළ ගැස්සවීමට මඟ පෙන්වීම
- අන්තර්ජාලය හරහා වෘත්තීය පුහුණු අවස්ථා සහ රැකියා අවස්ථා පිළිබඳ දත්ත ගබඩාවක් ඇති කිරීම
- ශිෂ්‍යත්ව/පුහුණු වැඩසටහන්/රැකියා සහ ඉගෙන ගැනීමේ අවස්ථා පිළිබඳ කළමණාකරනය කිරීම සහ තොරතුරු ලබා දීම
- සම්මුඛ පරීක්ෂණ සඳහා සූදානම් වීමට, ජීව දත්ත සකස්කිරීමට සහ සිසුන්ගේ සන්නිවේදන කුසලතා වැඩි දියුණු කර ගැනීමට උදවු වීම

### 19.4 අපගේ සංයුක්ත සැලැස්ම




### 19.5 පවත්වන ලද පුහුණු/දැනුවත් කිරීමේ වැඩසටහන් - 2013

ඒකකය මගින් සිදුකරන ලද වැඩසටහන් 19.1 වගුවේ දැක්වේ.

## 19.1 මෙහෙයවන ලද පුහුණු කිරීම් / දැනුවත් කිරීමේ වැඩසටහන් - 2013

| අනු අංකය | වැඩසටහන | සම්පත් සහ තාක්ෂණික දායකත්වය | කේන්ද්‍රීය ක්ෂේත්‍රය | ඉලක්ක කණ්ඩායම | දිනය | සහභාගීත්වය (සිසුන්) | ස්ථානය |
|---|---|---|---|---|---|---|---|
| 1. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Fertifarma | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.01.21 | 20 | මාකඳුර පරිශ්‍රය |
| 2. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Mushkidz | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.01.21 | 20 | මාකඳුර පරිශ්‍රය |
| 3. | "ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම - 1" වැඩමුළුව | බී පී ඒ ජයවීර මහතා, අංශ ප්‍රධාන, පශුසම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | රැකියා කුසලතා වැඩි කිරීම / පුහුණු කිරීම්, පර්යේෂණ සහ සංවර්ධනය | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.02.20 | 100 | කුලියාපිටිය පරිශ්‍රය |
| 4. | "ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම - 2" වැඩමුළුව | බී පී ඒ ජයවීර මහතා, අංශ ප්‍රධාන, පශුසම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | රැකියා කුසලතා වැඩි කිරීම / පුහුණු කිරීම්, පර්යේෂණ සහ සංවර්ධනය | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් | 2013.02.20 | 100 | කුලියාපිටිය පරිශ්‍රය |
| 5. | විශ්වවිද්‍යාල භූමියෙන් පිටත පුහුණු වැඩසටහන් / නායකත්ව සංවර්ධන කඳවුරු (ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය) HETC | මොහාන් පල්ලියගුරු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂක, ව්‍යාපාර සංවර්ධන සේවා උපදේශක මණ්ඩලය | රැකියා කුසලතා වැඩි කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් | 2013.02.23 සහ 2013.02.24 | 50 | මීරිගම බාලදක්ෂ කඳවුර |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 6. | "ඔබේ දෙපයින් නැගී සිටින්න " හඳුන්වාදීමේ වැඩසටහන | මොහාන් පල්ලියගුරු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂක, ව්‍යාපාර සංවර්ධන සේවා උපදේශක මණ්ඩලය | රැකියා කුසලතා වැඩි කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් | 2013.03.01 | 100 | කුලියාපිටිය පරිශ්‍රය |
| 7. | කොළඹ කොටස් වෙළඳපල සම්බන්ධ වැඩමුළුව - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | තුසිත මීගහකුඹුර මහතා, කළමණාකරු, කොළඹ තොග හුවමාරු මධ්‍යස්ථානය, කුරුණෑගල ශාඛාව | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් | 2013.03.06 | 300 | කුලියාපිටිය පරිශ්‍රය |
| 8. | ජාත්‍යන්තරයට ගැලපෙන තරඟකාරී උපාධිධාරියෙකු වීම | දමිත් සමරක්කොඩි මහතා, උපදේශක අධ්‍යක්ෂක (Earth Dreams International (PVT) Ltd)<br><br>ඊ ඒ සී පී කරුණාරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කර්මාන්ත කළමණාකරන අංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය | රැකියා කුසලතා වැඩි කිරීම සඳහා උපදේශනය | ව්‍යවහාරික විද්‍යා පීඨයේ සිව්වන වසර සහ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් (කර්මාන්ත කළමණාකරනය හදාරන) | 2013.03.22 | 50 | කුලියාපිටිය පරිශ්‍රය |
| 9. | " ජීවිතය දැකීම සඳහා අරමුණු පිහිටුවා ගැනීම" වැඩමුළුව | මොහාන් පල්ලියගුරු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂක, ව්‍යාපාර සංවර්ධන සේවා උපදේශක මණ්ඩලය | රැකියා කුසලතා වැඩි කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.04.06 | 80 | කුලියාපිටිය පරිශ්‍රය |
| 10. | ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව | මොහාන් පල්ලියගුරු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂක, ව්‍යාපාර | රැකියා කුසලතා වැඩි කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ සහ ව්‍යවහාරික විද්‍යා පීඨයේ | 2013.04.06 | 80 | කුලියාපිටිය පරිශ්‍රය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | සංවර්ධන සේවා උපදේශක මණ්ඩලය | | දෙවන වසර උපාධි අපේක්ෂකයින් | | | |
| 11. | ජීව දත්ත සැකසීමේ වැඩමුළුව | සමන් රූපසංහ මහතා, මානව සම්පත් සහ පාලන, කළමණාකරු, ස්ලිම් ටෙක්ස් පුද්ගලික සමාගම, කුලියාපිටිය | රැකියා කුසලතා වැඩි කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ අවසන් වසර උපාධි අපේක්ෂකයින් | 2013.05.21 | 200 | කුලියාපිටිය පරිශ්‍රය |
| 12. | රැකියා වෙළඳ පොළ - 2013 - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රාජ්‍ය සහ පෞද්ගලික සංවිධාන | රැකියා කුසලතා වැඩි කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මුල්‍ය පීඨයේ අවසන් වසර උපාධි අපේක්ෂකයින් | 2013.05.30 | 145 | කුලියාපිටිය පරිශ්‍රය |
| 13. | අනාගත අදහස් - 2013 | නාලන්දා ආදි ශිෂ්‍ය සංගමය | - | - | 2013.06.29 සහ 2013.06.30 | - | |
| 14. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Fertifarma | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.07.10 | 13 | මාකඳුර පරිශ්‍රය |
| 15. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Mushkidz | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.07.10 | 19 | මාකඳුර පරිශ්‍රය |
| 16. | විශ්වවිද්‍යාල භූමියෙන් පිටත පුහුණු වැඩසටහන් /නායකත්ව සංවර්ධන කඳවුර (කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨය සහ පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය) - HETC | මොහාන් පල්ලියගුරු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂක, ව්‍යාපාර සංවර්ධන සේවා උපදේශක මණ්ඩලය | රැකියා කුසලතා වැඩි කිරීම | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.07.13 සහ 2013.07.14 | 50 | මීරිගම බාලදක්ෂ කඳවුර |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 17. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Fertifarma | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.07.17 | 13 | මාකඳුර පරිශ්‍රය |
| 18. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Mushkidz | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.07.17 | 19 | මාකඳුර පරිශ්‍රය |
| 19. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Fertifarma | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.07.24 | 13 | මාකඳුර පරිශ්‍රය |
| 20. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Mushkidz | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.07.24 | 19 | මාකඳුර පරිශ්‍රය |
| 21. | උපාධිධාරීන්ගේ විභාගවල වලංගුභාවය -01 | ඊ ඒ සී පී කරුණාරත්න මහතා, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය, කර්මාන්ත කළමණාකරන අංශය, ව්‍යවහාරික විද්‍යා පීඨය | රැකියා කුසලතා වැඩි කිරීම/ පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් | 2013.08.05 | 100 | කුලියාපිටිය පරිශ්‍රය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 22. | “තේ රස හඳුනාගැනීමේ” වැඩමුළුව | ඒ උපාලි ප්‍රේමලාල් මහතා, නියෝජ්‍ය සාමාන්‍ය කළමනාකරු, සීමා සහිත කහවත්ත වැවිළි සමාගම | රාජකාරී පළපුරුද්ද සඳහා පුහුණුව/ පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය | කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨයේ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් | 2013.08.06 | 15 | මාකඳුර පරිශ්‍රය |
| 23. | "JA/YESL ආයතනයේ නිශ්පාදන එළිදැක්වීම සහ HETC OBT සහතිකපත්‍ර ප්‍රධානය | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) මොහාන් පල්ලියගුරු මහතා, වැඩසටහන් අධ්‍යක්ෂක, ව්‍යාපාර සංවර්ධන සේවා උපදේශක මණ්ඩලය | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පළමු, දෙවන සහ තුන්වන වසර උපාධි අපේක්ෂකයින් | 2013.08.07 | 132 | මාකඳුර පරිශ්‍රය |
| 24. | උපාධිධාරීන්ගේ විභාගවල වලංගුභාවය -02 | බී පී ඒ ජයවීර මහතා, අංශ ප්‍රධාන, පශුසම්පත් හා පක්ෂි විද්‍යා අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | රැකියා කුසලතා වැඩි කිරීම/ පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය | ව්‍යවහාරික විද්‍යා පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් | 2013.08.12 | 100 | කුලියාපිටිය පරිශ්‍රය |
| 25. | කවිතා කුසලතා වැඩසටහන- 2013 /පළමු වටය (සිංහල මාධ්‍ය) | උසස් අධ්‍යාපන අමාත්‍යාංශය | - | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්ෂකයින් | 2013.08.15 | 52 | මාකඳුර පරිශ්‍රය |
| 26. | දැනුවත් කිරීමේ වැඩසටහන - වෘත්තීය මග පෙන්වීම | ආචාර්ය ඩී සී අබේසිංහ, අධ්‍යක්ෂක, වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | - | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් | 2013.08.21 | 200 | කුලියාපිටිය පරිශ්‍රය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 27. | Establishment of Incubator cum Technology Commercialization and Transfer Centre - 1 | ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන බල මණ්ඩලය | - | විශ්වවිද්‍යාල අධ්‍යයන කාර්යය මණ්ඩලය සහ පර්යේෂණ මධ්‍යස්ථාන කාර්යය මණ්ඩලය | 2013.09.09 | 42 | මාකඳුර පරිශ්‍රය |
| 28. | උපාධිධාරීන්ගේ විභාගවල වලංගුභාවය | ආචාර්ය ඩී සී අබේසිංහ, අධ්‍යක්‍ෂක, වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය, ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය | පුහුණු, පර්යේෂණ සහ සංවර්ධනය | කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨයේ පළමු වසර උපාධි අපේක්‍ෂකයින් | 2013.09.10 | 66 | මාකඳුර පරිශ්‍රය |
| 29. | Establishment of Incubator cum Technology Commercialization and Transfer Centre - 2 | ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන බල මණ්ඩලය | - | ප්‍රදේශයේ සුළු හා මධ්‍යම ව්‍යවසායකයින් | 2013.09.11 | 28 | මාකඳුර පරිශ්‍රය |
| 30. | Establishment of Incubator cum Technology Commercialization and Transfer Centre - 3 | ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන බල මණ්ඩලය | - | ප්‍රදේශයේ සුළු හා මධ්‍යම ව්‍යවසායකයින් | 2013.10.07 | 10 | මාකඳුර පරිශ්‍රය |
| 31. | "නායකත්ව සංවර්ධනය" වැඩමුළුව | ඩෙබ්රා ඩ්‍රිස්කෝල් මිය, ඕස්ට්‍රේලියානු පුහුණුකරු, (නායකත්ව සංවර්ධන) | රැකියා කුසලතා වැඩි කිරීම | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ දෙවන වසර උපාධි අපේක්‍ෂකයින් | 2013.11.02 සහ 2013.11.03 | 65 | කුලියාපිටිය පරිශ්‍රය |
| 32. | ජීවිතයට සිනමාව | ජාතික චිත්‍රපටි සංස්ථාව | - | ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ උපාධි අපේක්‍ෂකයින් | 2013.11.21 | 100 | මාකඳුර පරිශ්‍රය |
| 33. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමූහික වැඩසටහන" – කුලියාපිටිය | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | කුලියාපිටිය පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්‍ෂකයින් | 2013.11.27 | 64 | කුලියාපිටිය පරිශ්‍රය |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 34. | "නායකත්ව සංවර්ධනය" වැඩමුළුව | නෙවිල් පෙරේරා මහතා, අංශ ප්‍රධාන, බෙදාහැරීමේ සහ විකුණුම් පුහුණුකරු, බහාර්ටි එයාර්ටෙල් ලංකා පුද්ගලික සමාගම<br><br>ශකිලා කමලේන්ද්‍රන් මිය, අංශ ප්‍රධාන, ඒකාබද්ධ සහ ස්වදේශීය සන්නිවේදන, බහාර්ටි එයාර්ටෙල් ලංකා පුද්ගලික සමාගම | රැකියා කුසලතා වැඩි කිරීම | කෘෂිකර්ම හා වැවිළි කළමණාකරන පීඨයේ පළමු වසර උපාධි අපේක්ෂකයින් | 2013.11.27 | 65 | කුලියාපිටිය පරිශ්‍රය |
| 35. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – කුලියාපිටිය | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | කුලියාපිටිය පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.12.12 | 64 | කුලියාපිටිය පරිශ්‍රය |
| 36. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Fertifarma | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.12.30 | 13 | මාකඳුර පරිශ්‍රය |
| 37. | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Mushkidz | පැට්‍රික් අමරසිංහ මහතා, සභාපති, ශ්‍රී ලංකා යෞවන ව්‍යවසායකයන් (YESL) | ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය | මාකඳුර පරිශ්‍රයේ පළමු සහ දෙවන වසර උපාධි අපේක්ෂකයින් | 2013.12.30 | 19 | මාකඳුර පරිශ්‍රය |

## 19.6 වර්ෂය තුළ පවත්වන ලද වැඩසටහන්වල සංක්ෂිප්ත වාර්තාව

2013 වර්ෂය තුළ පීඨ හතරෙහි සිසුන් සඳහා ක්‍රියාකාරකම් 37 ක් පැවැත්වීමට වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයට හැකි විය.

| පීඨය | පවත්වන ලද ක්‍රියාකාරකම් ගණන |
|---|---|
| කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | 07 |
| ව්‍යවහාරික විද්‍යා පීඨය | 03 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 07 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - |
| මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක | 07 |
| කුලියාපිටිය පරිශ්‍රයේ පීඨ දෙක | 06 |
| විශ්වවිද්‍යාලයේ පීඨ හතර | 07 |
| අනෙකුත් විශ්වවිද්‍යාල | - |
| එකතුව | 37 |

## 19.7 අපගේ වැඩසටහන් සඳහා සහභාගී වී සිසුන් ලබා ගත් ප්‍රතිලාභ සහ ඉඩප්‍රස්ථා - 2013

- නායකත්ව පුහුණු
- ශිෂ්‍ය සමූහ වැඩසටහන්
- විශ්වවිද්‍යාල භූමියෙන් පිටතදී කරන ලද පුහුණුවීම්
- කාර්මික පුහුණු වැඩසටහන්
- රැකියා අවස්ථා
- ජීව දත්ත සැකසීම
- පෞද්ගලික උපදේශන
- ශිෂ්‍ය දත්ත ගබඩාව
- රැකියා වෙළඳ පොල
- පෞරුෂය / ආකල්ප සංවර්ධනය

## 19.8 විශේෂ ජයග්‍රහන - 2013

- වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයට නව වෘත්තීය උපදේශකවරයෙකු බඳවා ගැනීම
- ශිෂ්‍ය සමාගම් විසින් නව නිශ්පාදනයක් එළි දැක්වීම (JA/YESL වැඩසටහන)
- වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සඳහා වෙබ් අඩවියක් එළිදැක්වීම
- කුලියාපිටිය පරිශ්‍රයේ වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සඳහා නානකාමරයක් ඉදි කිරීම
- කුලියාපිටිය පරිශ්‍රයේ රැකියා පොළක් සංවිධානය කිරීම
- EDEX සහ අනාගත අදහස් අධ්‍යාපන පොළ සඳහා සහභාගී වීම
- "ජීවිතයට සිනමාව" වැඩසටහන සංවිධානය කිරීම
- වර්ෂය තුළ වැඩසටහන් 37ක් පැවැත්වීම
- වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සඳහා නව ලාංඡනයක් හඳුන්වා දීම
- රැකියා අවස්ථා සඳහා ශිෂ්‍ය දත්ත ගබඩාවක් වැඩිදියුණු කිරීම

## 19.9 සංවර්ධන වැඩසටහන් - 2013

- **වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය සඳහා මානව සම්පත් සංවර්ධනය**
  - පර්යේෂණ ක්‍රියාකාරකම්වල නිරත වීම
  - නව පුහුණු සහ සංවර්ධන වැඩසටහන්වලට සහභාගී වීම
  - උසස් අධ්‍යාපන කටයුතු සහ ක්ෂේත්‍ර චාරිකාවල නිරත වීම

- **තනතුරු ප්‍රමාණය වැඩි කිරීම**
  - වෘත්තීය මාර්ගෝපදේශකයෙකු බඳවා ගැනීම
  - පරිගණක යෙදුම් සහකාරවරයෙකු බඳවා ගැනීම
  - කම්කරු තනතුරු දෙකක් සඳහා බඳවා ගැනීම

- **භෞතික සම්පත් සංවර්ධනය**

| අයිතමය | ප්‍රමාණය |
|---|---|
| වර්ණ ලේසර් මුද්‍රණ යන්ත්‍ර | 02 |
| කැම්කෝඩර් | 01 |
| ලැප් ටොප් | 10 |
| යූ පී එස් | 03 |
| පරිගණක මේස | 20 |
| පරිගණක පුටු | 20 |
| නානකාමර | 01 |
| වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයේ පුස්තකාලය සඳහා පොත් සහ සඟරා | - |
| වානේ අල්මාරි (6'×4'×1.5) | 01 |

## 19.10 සියලුම වැඩසටහන් සඳහා මුළු වියදම

| අනු අංකය | වැඩසටහනේ නම | වෘත්තීය මාර්ගෝපදේශ ඒකකයෙන් වෙන් කිරීම්(Rs.) | HETC ව්‍යාපෘතියේ අරමුදල් (Rs.) |
|---|---|---|---|
| 1 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Fertifarma | නැත | නැත |
| 2 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" - Mushkidz | 1593.00 | නැත |
| 3 | "ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම - 1" වැඩමුළුව | 715.00 | නැත |
| 4 | "ඉදිරිපත් කිරීමේ හැකියාවන් වර්ධනය කිරීම - 2" වැඩමුළුව | නැත | නැත |
| 5 | විශ්වවිද්‍යාල භූමියෙන් පිටත පුහුණු වැඩසටහන් / නායකත්ව සංවර්ධන කඳවුරු (ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සහ ව්‍යවහාරික විද්‍යා පීඨය) HETC | නැත | 275000.00 |
| 6 | "ඔබේ දෙපයින් නැගී සිටින්න " හඳුන්වාදීමේ වැඩසටහන | නැත | නැත |
| 7 | කොළඹ කොටස් වෙළඳපල සම්බන්ධ වැඩමුළුව - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 1640.00 | නැත |

| | | | |
|---|---|---|---|
| 8 | ජාත්‍යන්තරයට ගැලපෙන තරඟකාරී උපාධිධාරියෙකු වීම කිරීම | 5200.00 | නැත |
| 9 | " ජීවිතය දැකීම සඳහා අරමුණු පිහිටුවා ගැනීම" වැඩමුළුව | 9110.00 | නැත |
| 10 | ආකල්ප වර්ධනය කිරීමේ වැඩමුළුව | 5000.00 | නැත |
| 11 | ජීව දත්ත සැකසීමේ වැඩමුළුව | 9573.00 | නැත |
| 12 | රැකියා වෙළඳ පොළ - 2013 - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 67448.00 | නැත |
| 13 | අනාගත අදහස් ප්‍රදර්ශනය - 2013 | 418.00 | නැත |
| 14 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Fertifarma | 467.00 | නැත |
| 15 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Mushkidz | නැත | නැත |
| 16 | විශ්වවිද්‍යාල භූමියෙන් පිටත පුහුණු වැඩසටහන් /නායකත්ව සංවර්ධන කඳවුර (කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨය සහ පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය) - HETC | නැත | 275000.00 |
| 17 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Fertifarma | නැත | නැත |
| 18 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Mushkidz | 425.00 | නැත |
| 19 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Fertifarma | 270.00 | නැත |
| 20 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Mushkidz | නැත | නැත |
| 21 | උපාධිධාරීන්ගේ විභාගවල වලංගුභාවය -01 | 3500.00 | නැත |
| 22 | "තේ රස හඳුනාගැනීමේ" වැඩමුළුව | 3489.00 | නැත |
| 23 | "JA/YESL ආයතනයේ නිශ්පාදන එළිදැක්වීම සහ HETC OBT සහතිකපත්‍ර ප්‍රධානය | 22049.00 | නැත |
| 24 | උපාධිධාරීන්ගේ විභාගවල වලංගුභාවය -02 | 3500.00 | නැත |
| 25 | කවිතා කුසලතා වැඩසටහන- 2013 /පළමු වටය (සිංහල මාධ්‍ය) | 30961.00 | නැත |
| 26 | දැනුවත් කිරීමේ වැඩසටහන - වෘත්තීය මඟ පෙන්වීම | නැත | නැත |
| 27 | Establishment of Incubator 1 | නැත | නැත |
| 28 | උපාධිධාරීන්ගේ විභාගවල වලංගුභාවය | නැත | නැත |
| 29 | Establishment of Incubator 2 | නැත | නැත |
| 30 | Establishment of Incubator 3 | 414.00 | නැත |
| 31 | "නායකත්ව සංවර්ධනය" වැඩමුළුව | 23490.00 | නැත |
| 32 | ජීවිතයට සිනමාව | 2209.00 | නැත |
| 33 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – කුලියාපිටිය | 4360.00 | නැත |
| 34 | "නායකත්ව සංවර්ධනය" වැඩමුළුව | 1943.00 | නැත |
| 35 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – කුලියාපිටිය | නැත | නැත |
| 36 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Fertifarma | 687.00 | නැත |
| 37 | "JA/YESL විශ්වවිද්‍යාල සිසුන්ගේ සාමුහික වැඩසටහන" – Mushkidz | නැත | නැත |
| | **එකතුව** | **198461.00** | **550000.00** |

### 19.11 සිසුන් සඳහා නව වැඩසටහන්

- **EXED** සහ අනාගත අදහස් අධ්‍යාපනික පොළට සහභාගීවීම
- සමාජ වගකීම් වැඩසටහන සහ සේවා
- ක්ෂේත්‍ර චාරිකා සහ පර්යේෂණ සඳහා සම්බන්ධවීම
- ශිෂ්‍ය තොරතුරු ජාලගත කිරීම
- ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන්
- රැකියා සඳහා බඳවා ගැනීමේ ආයතන සමඟ සම්බන්ධවීම

### 19.12 සමාප්තිය

වෘත්තීය මාර්ගෝපදේශ ඒකකය මඟින් වැඩසටහන් 37ක් 2013 වර්ෂය තුළ දී පවත්වා ඇත. මෙම වැඩසටහන් මඟින් අපගේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට ඔවුන්ගේ පහත දැක්වෙන පෞද්ගලික කුසලතාවයන් වැඩිදියුණු කර ගැනීමට හැකි වී ඇත.

| | | |
|---|---|---|
| ධනාත්මක ආකල්ප | කාර්යක්ෂමතාවය | වගකීම |
| නවෝත්පාදන | සමර්ථ | කාර්යශීලී |
| උද්‍යෝගය | චිත්තෝත්පාදකය | සංයමය |
| නිර්මාණහැකියාව | ස්වයං අභිප්‍රේරණය | උපායශීලීබව |
| විචක්ෂණ හැකියාව | නම්‍යශීලීබව | පුද්ගල ආචාරධර්ම |
| චිත්තප්‍රකෘතිය | අවංක බව | |

## 20 තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය

## කුලියාපිටිය පරිශ්‍රය

### 20.1 හැඳින්වීම

කුලියාපිටිය පරිශ්‍රයේ තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය මඟින් කුලියාපිටිය පරිශ්‍රයේ විශ්වවිද්‍යාල ප්‍රජාව සඳහා තොරතුරු තාක්ෂණික සේවාව සහ තොරතුරු තාක්ෂණ පුහුණු වැඩසටහන් ලබා දෙනු ලැබේ. මෙහි විද්‍යාගාරය කොටස් තුනකින් යුක්ත වන අතර එක කොටසක් අන්තර්ජාල පහසුකම් හා අනෙක් කොටස් දෙක ප්‍රායෝගික කටයුතු සඳහා වෙන් කර ඇත. සාමාන්‍යයෙන් මෙම විද්‍යාගාරය රාජකාරී කාලය තුළ විවෘතව පවතින අතර සිසුන් සඳහා පස්වරු 8.00 දක්වා විවෘතය. ඊට අමතරව සති අන්තයේ දී සහ නිවාඩු දිනවලදී ද විවෘතව ඇත. තවද, තොරතුරු සන්නිවේදන තාක්ෂණ ඒකකය මඟින් වෙබ් අඩවි සහ ඉලෙක්ට්‍රොනික තැපැල, අන්තර්ජාල දුරකථන පද්ධතිය (IP Phone) සහ WiFi පද්ධතිය පාලනය කිරීම සිදු කරයි.

### 20.2 මෙහෙයවන ලද පුහුණු කිරීම් / දැනුවත් කිරීමේ වැඩසටහන් /පවත්වන ලද පාඨමාලා

- ව්‍යවහාරික විද්‍යාපීඨයේ සිසුන් සඳහා තොරතුරු තාක්ෂණ ඩිප්ලෝමාව
- ජාල නිර්මාණ (Web Design) සහතිකපත්‍ර පාඨමාලාව
- බාහිර පාර්ශවය සඳහා වන තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව (ගාස්තු අය කෙරේ)

### 20.3 කාර්යය මණ්ඩලය

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්ෂණ | - 03 |
| පරිගණක යෙදුම් සහකාර | - 02 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |
| කාර්මික නිලධාරී | - 01 |

### 20.4 අයවැය

| | | |
|---|---|---|
| ප්‍රාග්ධන | - | මිලියන 1.9 |
| පුනරාවර්තන | - | මිලියන 4.6 |

### 20.5 වසර තුළ ලැබූ ප්‍රගතිය

- තොරතුරු තාක්ෂණ පාඨමාලාව හදාරනු නොලබන ව්‍යවහාරික විද්‍යා පීඨ සිසුන් සඳහා තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් හඳුන්වා දීම
- විද්‍යාගාරයේ පරිගණක ප්‍රතිස්ථාපනය කිරීම හා වැඩි දියුණු කිරීම

- රැහැන් රහිත ජාලය පුළුල් කිරීම
- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ යෝග්‍යතා පරීක්‍ෂණය (UCTIT) අන්තර්ජාලය හරහා (Online) පැවැත්වීම
- විශ්වවිද්‍යාලයේ අන්තර්ජාල කලාප පළල වැඩිදියුණු කිරීම

**20.6 අනෙකුත් දුෂ්කරතාවයන්**

- යටිතල පහසුකම් සඳහා ලබා දෙන ප්‍රතිපාදන ප්‍රමාණාත්මක නොවීම
- ශිෂ්‍යය සංඛ්‍යාවේ වැඩිවීමේ ප්‍රමාණයට සරිලන ආකාරයට පරිගණක විද්‍යාගාර පහසුකම් වැඩිකිරීමට ඉඩකඩ ප්‍රමාණවත් නොවීම.
- කාර්යය මණ්ඩලයට ලබා දෙන පුහුණු පාඨමාලා ප්‍රමාණවත් නොවීම.
- අධ්‍යයන කාර්යය මණ්ඩලය ප්‍රමාණවත් නොවීම.
- විදුලිය බිඳ වැටීම් නිසා සර්වර් (Servers) අක්‍රීය වීම

**20.7 ඉදිරි සංවර්ධනය සඳහා යෝජනා**

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ සහතික පත්‍ර පාඨමාලාව තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමාව දක්වා වැඩිදියුණු කිරීම.
- ඉගෙනීම් කළමණාකරන පද්ධතිය (LMS) අධ්‍යයන කාර්යය මණ්ඩලයට හඳුන්වා දීම.
- වැඩිවන ශිෂ්‍ය කණ්ඩායම්වලට ගැලපෙන ආකාරයට පරිගණක විද්‍යාගාර පහසුකම් වැඩි කිරීම.
- රැහැන් රහිත ජාල පහසුකම් පුළුල් කිරීම.
- කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- සාමාන්‍ය තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ සහතික පත්‍ර විභාගය සඳහා සිසුන් පුහුණු කිරීම.

**20.8 අනෙකුත් අදාල තොරතුරු**

විශ්වවිද්‍යාලයට හා බාහිර ප්‍රජාවට විවිධ සේවා සපයන මධ්‍යස්ථානයක් බවට තොරතුරු සන්නිවේදන තාක්ෂණ මධ්‍යස්ථානය දියුණු කිරීමට අවශ්‍යව ඇත.

# 21. තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය

## මාකඳුර පරිශ්‍රය

### 21.1 හැඳින්වීම

සිසුන්ගේ සීඝ්‍රයෙන් දියුණුවන විෂය ක්ෂේත්‍රවලට අදාල තොරතුරු තාක්‍ෂණ අභියෝගයන්ට මුහුණ දිය හැකි සේවාවක් සැපයීම සඳහා මාකඳුර තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය පිහිටුවා ඇත. එමෙන්ම මේ නිසා ඔවුන්ට පරිගණක සාක්‍ෂරතාවය මෙන්ම ඉහළ වෘත්තීය කාර්යය සාධනයක් ලබා ගැනීමට පහසුකම් සැලසී ඇත.

මෙම ඒකකය මඟින් කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය සඳහා තොරතුරු තාක්‍ෂණ හා උසස් පරිගණක භාවිතාව පිළිබඳ පාඨමාලා ඉදිරිපත් කරන අතර පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය සඳහා පරිගණක තාක්‍ෂණ පාඨමාලාව පවත්වනු ලැබේ. එමෙන්ම අධ්‍යයනාංශ මඟින් පවත්වන සංඛ්‍යානය ආශ්‍රිත පාඨමාලා සඳහා විශේෂයෙන්ම ප්‍රායෝගික පරීක්‍ෂණවලදී මෙම ඒකකය මඟින් සහයෝගය දෙනු ලැබේ. ඊට අමතරව විශ්වවිද්‍යාලය මඟින් පවත්වනු ලබන වැවිළි කළමනාකරණ (බාහිර) උපාධිය හදාරන සිසුන්ට පරිගණක තාක්‍ෂණය සහ විද්‍යුත් වාණිජ්‍ය හා තොරතුරු කළමනාකරණ පද්ධති යන පාඨමාලා දෙක පවත්වනු ලැබේ. එමෙන්ම වයඹ පළාතේ ප්‍රජාවට ප්‍රයෝජනවත්වන පරිදි පරිගණක තාක්‍ෂණයට සම්බන්ධ පාඨමාලා කීපයක්ම පවත්වමින් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය මඟින් කරනු ලබන සේවා පුළුල් කර ඇත.

මෙම පරිගණක තාක්‍ෂණ මධ්‍යස්ථානය සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 8.00 දක්වාත්, සෙනසුරාදා දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 5.00 දක්වාත්, විභාග කාලය තුලදී සතියේ දිනවල පෙරවරු 8.00 සිට පස්වරු 10.00 දක්වාත් විවෘත කර ඇත.

### 21.2 මෙහෙයවන ලද පුහුණු කිරීම් / දැනුවත් කිරීමේ වැඩසටහන්

- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ සහ පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ සිසුන් සඳහා නොමිලයේ පවත්වනු ලබන "පරිගණක දෘඩාංග එකලස් කිරීම" පිළිබඳව එක් දින වැඩමුළුව- 2013 මාර්තු
- පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ හතරවන කණ්ඩායම පාඨමාලාව සම්පූර්ණ කරන ලදි - 2013 මැයි
- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ පළමු සහ දෙවන කණ්ඩායම් පාඨමාලාව සාර්ථකව නිම කර ඇත. - 2013 දෙසැම්බර්
- UDG / HETC ව්‍යාපෘතිය යටතේ සිසුන්, කාර්යය මණ්ඩලය සහ කාර්මික නිලධාරීන් සඳහා පැවැත් වූ "Introduction of e-Lerning System" පිළිබඳ වැඩමුළු තුනක් සාර්ථකව නිම කරන ලදි.
- UDG / HETC ව්‍යාපෘතිය යටතේ අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා පැවැත් වූ "Introduction of e-Lerning System" පිළිබඳ වැඩමුළු දෙකක් සාර්ථකව නිම කරන ලදි.
- පරිගණක භාවිතය පිළිබඳ නිපුණතා සහතික පත්‍ර පාඨමාලාවේ පස්වන කණ්ඩායම ආරම්භ කිරීම - 2013 ඔක්තෝබර්
- තොරතුරු තාක්‍ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ තුන්වන කණ්ඩායම ආරම්භ කිරීම - 2013 නොවැම්බර්
- තොරතුරු තාක්ෂණ නොවන උපාධිධාරීන් සඳහා මහාචාර්ය කේ පී හේවාගමගේ මහතාගේ දායකත්වයෙන් නව තොරතුරු තාක්ෂණ විෂය මාලාවක් ඇති කිරීම

## 21.3 කාර්යය මණ්ඩලය

| | |
|---|---|
| පද්ධති ඉංජිනේරු | - 01 |
| උපදේශක - පරිගණක තාක්‍ෂණ | - 01 |
| කථිකාචාර්ය (ආධුනික) පරිගණක තාක්‍ෂණ | - 02 |
| පරිගණක යෙදුම් සහකාර | - 01 |
| විද්‍යාගාර සහායක | - 01 |
| කම්කරු | - 01 |

- තාවකාලික පදනම මත පරිගණක උපදේශකවරයෙක් ලෙස සේවය කරන, එච් ඩබ්ලිව් එච් ප්‍රේමචන්ද්‍ර මහතාගේ සේවා කාළය 2013 පෙබරවාරි 18 සිට මාස 06කට දික් කරන ලද අතර නැවත වරක් 2013 අගෝස්තු 13 දින සිට තවත් මාස 06කින් දීර්ඝ කරන ලදී.
- තාවකාලික පදනම මත පරිගණක උපදේශකවරයෙක් ලෙස සේවය කරන, එස් බී එම් සී පී හේරත් මහතාගේ සේවා කාලය 2013 දෙසැම්බර් මස 02 දින සිට වසරක කාලයක් සඳහා දීර්ඝ කරන ලදී.
- ඩබ්ලිව් ඩී සමන්වික්‍රම, පද්ධති ඉංජිනේරු මහතා 2012 ජනවාරි 25 දින සිට ක්‍රියාත්මක වන පරිදි පද්ධති ඉංජිනේරු I ශ්‍රේණියට උසස් කරන ලදි.

## 21.4 අයවැය

රුපියල් මිලියන 2.0 ක මුදලක් තොරතුරු සන්නිවේදන තාක්‍ෂණ මධ්‍යස්ථානය සඳහා වෙන් කරන ලද අතර එම මුදල පරිගණක වැඩි දියුණු කිරීම සඳහා යොදවන ලදි.

## 21.5 වසර තුළ ලැබූ ප්‍රගතිය

- HETC ව්‍යාපෘතියේ අරමුදල් යොදවා විශ්වවිද්‍යාලයේ WiFi ජාලය ස්ථාපිත කිරීම
- HETC ව්‍යාපෘතියේ අරමුදල් යොදවා ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා කුඩා පරිගණක විද්‍යාගාර දෙකක් ස්ථාපිත කිරීම
- 2013 අප්‍රේල් මාසයේ දී මාකඳුර පරිශ්‍රයේ පරිගණක සඳහා වෛරස් ආරක්ෂක මෘදුකාංග ස්ථාපිත කිරීම
- 2013 මැයි මාසයේ දී විශ්වවිද්‍යාල e-Learning Management System වැඩිදියුණු කිරීම

### අනෙකුත් දුෂ්කරතාවයන්

- පරිගණක විද්‍යාගාර සඳහා දැනට පවතින ඉඩකඩ ප්‍රමාණවත් නොවීම
- දේශණ ශාලා සහ කාර්යය මණ්ඩල කාමර පහසුකම් ප්‍රමාණවත් නොවීම

## 21.6 වැඩිදුර සංවර්ධනය සඳහා යෝජනා

තොරතුරු සන්නිවේද තාක්‍ෂණ මධ්‍යස්ථානය සඳහා වර්ග මීටර 2000 ක පමණ වෙනම ගොඩනැගිල්ලක් ඉදිකිරීම

### 21.7 අනෙකුත් අදාල තොරතුරු

2013 ජූනි මස දී HETC ව්‍යාපෘතිය මඟින් සංවිධානය කරන ලද පරිගණක ජාලගත කිරීම සහ ලිනක්ස් සර්වර් පරිපාලනය සම්බන්ධ පුහුණු වැඩමුළුවකට ඩබ්ලිව් ඩී සමන්වික්‍රම මහතා සහභාගී විය.

2013 ජූලි මස 31 දින සහ 2013 අගෝස්තු මස කැළණිය විශ්වවිද්‍යාලයේ තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථානය මඟින් සංවිධානය කරන ලද Learing Management Systems for Web Administrators (LMS) සම්බන්ධයෙන් පැවති පුහුණු වැඩමුළුවකට ඩබ්ලිව් ඩී සමන්වික්‍රම මහතා සහභාගී විය.

# 22. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - කුලියාපිටිය පරිශ්‍රය

## 22.1 දැක්ම

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ දැක්ම වනුයේ ශ්‍රී ලංකාවේ උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමේ ප්‍රධාන මධ්‍යස්ථානය බවට පත් වීමය.

## 22.2 මෙහෙවර

ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකයේ මෙහෙවර වනුයේ ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම හා ඉගෙන ගැනීම සම්බන්ධ තෝරාගත් ක්‍රමවේද මගින් උපාධි අපේක්ෂකයින්ගේ භාෂා ප්‍රවීණතාවය වැඩි දියුණු කිරීම.

- ඵලදායී ක්‍රමවේද මගින් කතාව, කියවීම, ලිවීම සහ සවන්දීම පිළිබඳ මනා පුහුණුවක් ලබාදීම.
- ශාස්ත්‍රීය, සමාජීය, හා වෘත්තීය ප්‍රජාවේ ක්‍රියාකාරී කොටසක් බවට පත්වීම සඳහා සිසුන් පෙළඹවීම.
- ජාතික සංවර්ධනයට අවශ්‍ය මානව සම්පත් දියුණු කිරීම සඳහා පහසුකම් සැලසීම පිණිස ඵලදායි සංනිවේදන කුසලතා ලබා දීම.

කුලියාපිටිය ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මගින් සිසුන්ට ඔවුන්ගේ අනාගතය හමුවේ ඇති අභියෝගවලට මුහුණ දීම සඳහා අවශ්‍ය භාෂා නිපුණතාවය ලබා ගැනීමටත්, ඔවුන්ගේ අවංකභාවය වැඩි දියුණු කර, අනුවර්තනීය සහ සක්‍රීය ඵලදායී පුරවැසියන් ලෙස රටට බිහිකිරීම අපේක්ෂා කරනු ලැබේ. ජාතික සංවර්ධනය සඳහා විශාල වශයෙන් දායක වීමට සහ අන්‍යෝන්‍ය සම්බන්ධතාවය වර්ධනය කිරීම තුළින් මෙම පාඨමාලාව හැදෑරීම තුළින් ක්‍රියාකාරකම් පුරුකක් වශයෙන් ක්‍රියාත්මක වනු ඇත. ශිෂ්‍ය කේන්ද්‍රගත ඉගැනුම් ක්‍රම හඳුන්වාදීම තුළින් ශිෂ්‍ය ක්‍රියාකාරකම්වලට වැඩි අවස්ථාවක් ලබා දීමෙන් ඉංග්‍රීසි භාෂාව ප්‍රවීනත්වය ලබා ගැනීම සඳහා සිසුනට උසස් බලාපොරොත්තුවක් ඇති කර තිබීම.

## 22.3 කාර්යය මණ්ඩලය

### අධ්‍යයන කාර්යය මණ්ඩලය

ඊ එම් එච් ජේ එදිරිසිංහ මහතා - සමායෝජක

එම් කේ එස් එම් සමරනායක මහතා - කථිකාචාර්යය

ඩබ්ලිව් එස් ඒ ප්‍රනාන්දු මිය - කථිකාචාර්යය

කේ එම් දිසානායක මහතා - කථිකාචාර්යය (අධ්‍යයන නිවාඩු ලබා සිටියි)

### තාවකාලික උපදේශකවරු

ඩී ලීලචන්ද්‍ර මෙය

ඒ ප්‍රියදර්ශනී මෙය

එල් ජයවික්‍රම මෙය

එල් බණ්ඩාරනායක මයා

### අනධ්‍යයන කාර්යය මණ්ඩලය

ඩී ජී ආර් එම් විජේසිංහ මෙය (පරිගණක යෙදුම් සහකාර)

ඩබ්ලිව් පී ඩී සිරිවර්ධන මයා (කම්කරු)

**22.4 වසරේදී පවත්වන ලද පාඨමාලා**

**I) ව්‍යවහාරික විද්‍යා පීඨය සඳහා**

- නවක සිසුන් සඳහා කඩිනම් ඉංග්‍රීසි පාඨමාලාව.
- පළමු මට්ටමේ සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පාඨමාලාව
- දෙවන මට්ටමේ සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතා පාඨමාලාව
- තුන්වන මට්ටමේ සිසුන් සඳහා ව්‍යාපාර ඉංග්‍රීසි පිළිබඳ සහතිකපත්‍ර පාඨමාලාව
- තුන්වන මට්ටමේ සිසුන් සඳහා ඉංග්‍රීසි භාෂා උසස් මට්ටමේ ප්‍රවීනතා පාඨමාලාව.

**II) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය.**

- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි I ව්‍යාකරණ පදනම් පාඨමාලාව (ELTU 1110)
- ප්‍රථම වසර සිසුන් සඳහා ඉංග්‍රීසි II රචනය පාඨමාලාව (ELTU 1210)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන I පාඨමාලාව (BSF 2131)
- දෙවන වසර සිසුන් සඳහා ව්‍යාපාර සන්නිවේදන II පාඨමාලාව (BSF 2251)

උපාධි අපේක්ෂකයින්ගේ ඉංග්‍රීසි ප්‍රවීනතාව සඳහා විශ්වවිද්‍යාලය තුළ පවත්වන ලද පාඨමාලාවලට අමතරව බාහිර ප්‍රජාව සඳහා ද 2013 වසරේදී විවිධ බාහිර පාඨමාලාවන් හා වැඩමුළු සංවිධානය කර ඇත. පාසල් සිසුන් සඳහා අ.පො.ස (සා.පෙළ) විභාග සඳහා සම්මන්ත්‍රණ හා වැඩමුළු පවත්වා ඇත. එක් අවුරුදු ඉංග්‍රීසි ඩිප්ලෝමා 7වන කණ්ඩායම 2013 දී සම්පූර්ණ කරන ලද අතර සිසුන් 249 දෙනෙකු පමණ සාර්ථකව පාඨමාලාව නිම කර ඇත.

යුනිවෙලා පුද්ගලික ආයතනයේ සහභාගීත්වයෙන් තුන්වන වසරේ උපාධි අපේක්ෂකයින්ට සම්මුඛ පරීක්ෂණවලට පෙනී සිටීමට අවශ්‍ය කුසලතා වර්ධනය කිරීම සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කර ඇති අතර ඒවා ශිෂ්‍යයන්ට ඉතාමත් ඵලදායී වී ඇත.

සහකාර ලේඛකාධිකාරී/සහකාර මූල්‍යාධිකාරී තනතුරු සඳහා බඳවා ගැනීමේ විභාගයට සූදානම් වන මාකඳුර සහ කුලියාපිටිය පරිශ්‍රයේ අනධ්‍යයන කාර්යය මණ්ඩලයේ මහත්ම මහත්මීන් සඳහා තුන් මාසයක ඉංග්‍රීසි භාෂා ප්‍රවීණතා පාඨමාලාවක් පවත්වන ලදි.

**22.5 සැලසුම් කර ක්‍රියාත්මක කරන ලද බාහිර ක්‍රියාකාරකම්**

උපාධි අපේක්ෂයන්ගේ ඉංග්‍රීසි භාෂා ප්‍රවීනතාවය සහ හැකියාවන් වැඩි දියුණු කිරීම සඳහා පහත ක්‍රියාකාරකම් සැලසුම් කර ඇත.

අ. ඉංග්‍රීසි භාෂා විෂය මාලාව ප්‍රතිශෝධනය (දැනට ප්‍රතිශෝධනය කරමින් පවතී)

ආ. ඉංග්‍රීසි භාෂා මධ්‍යස්ථානයේ පහසුකම් සංවර්ධනය කිරීම (භාෂා ඉගැන්වීමේ මෘදුකාංග සවිකිරීම නිම කරන ලදි)

ඇ. විෂය මාලාවට ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා ඉගැන්වීම අන්තර්ගත කිරීම (ව්‍යාපාර ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව සඳහා සම්පූර්ණ කර ඇත)

ඈ. ඉංග්‍රීසි අංශයේ ගුරුවරුන් සඳහා පුහුණු වැඩසටහන් සංවිධානය කිරීම (වැඩසටහන් දෙකක් සම්පූර්ණ කර ඇත)

ඉ. භාෂා කඳවුරු සංවිධානය කිරීම (සාර්ථකව නිම කර ඇත)

ඊ. ඉංග්‍රීසි දින තරඟ සංවිධානය (පීඨ මට්ටමින් පවත්වන ලද තරඟ සාර්ථකව නිම කරන ලද අතර විශ්වවිද්‍යාල මට්ටමින් පැවැත්වීමට නියමිතය)

උ. බිත්ති පුවත්පත්/සඟරා/වාර සඟරා යනාදිය නිර්මාණය කිරීම සඳහා උපාධි අපේක්ෂකයන් යොමු කිරීම (නිම කරන ලදි )

**22.6 දුෂ්කරතා**

සෑම වසරකම ඒ ඒ පීඨ සඳහා බඳවා ගන්නා ශිෂ්‍ය ප්‍රමාණය වැඩිකරනු ලැබුවද අවශ්‍ය සේවක ප්‍රතිපාදන ඇති කිරීම හෝ කථිකාචාර්යවරුන් බඳවා ගැනීම හෝ කර නැත. එසේ තිබියදී කථිකාචාර්යයවරුන් තුන්දෙනෙකු මෙම පීඨ සඳහා තම උපරිම ශක්ති ප්‍රමාණයෙන් සිසුන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම දියුණු කිරීම සඳහා කැපවී සිටිති. නව කථිකාචාර්යවරුන් ලබා දෙන්නේ නම් වඩාත් හොඳ සේවාවක් ලබා දිය හැකි අතර ස්ථිර ආචාර්ය තනතුරු හිඟය නිසා ඇතිවන ගැටළු එවිට අවම වනු ඇත. එමෙන්ම මධ්‍යස්ථානය නිසි පරිදි ක්‍රියාත්මක වීම සඳහා කථිකාචාර්යයවරුන්ගේ සේවය ද අත්‍යාවශ්‍යව ඇත.

භාෂා විද්‍යාගාරයේ පවත්වන වැඩසටහන් නිසියාකාරව සිදුකිරීම සඳහා කාර්මික නිලධාරීවරයෙකු නොමැතිකම විශාල ගැටළුවකි. එම නිසා භාෂා විද්‍යාගාරය සඳහා කාර්මික නිලධාරිවරයෙකු පත් කිරීම පිළිබඳව ඉක්මනින් අවධානය යොමු කළ යුතුව ඇත.

# 23. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය - මාකඳුර පරිශ්‍රය

## 23.1 හැඳින්වීම

මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකක 1, 2 සහ 3 වසර සිසුන් සඳහා ඉංග්‍රීසි පාඨමාලා පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 1 වසර සිසුන් සඳහා "පදනම් ඉංග්‍රීසි" පාඨමාලාවද, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ 1 වසර සිසුන්ට "විද්‍යාව සඳහා ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත් වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 2 වසර සිසුන් සඳහා "ශාස්ත්‍රීය ලිවීම" පාඨමාලාව ද, පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ 2 වසර සිසුන් සඳහා "ශාස්ත්‍රීය ඉංග්‍රීසි" පාඨමාලාව ද පවත්වනු ලැබේ. කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ 3 වසර 2 වන සමාසිකයේ සිසුන් සඳහා "වෘත්තීය ඉංග්‍රීසි" පාඨමාලාව පවත්වනු ලැබේ. මූලික ඉංග්‍රීසි පාඨමාලාව මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙක සඳහා අලුතින් බඳවා ගන්නා ලද සිසුන් සඳහා 2013 අප්‍රේල් මස දී සාර්ථකව පවත්වන ලදි.

## 23.2 පවත්වන ලද පුහුණුවීම් හා දැනුවත්වීම් වැඩ සටහන්

2013 වසර සඳහා ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය විසින් කෘෂිකර්ම පීඨ පරිශ්‍රයේදී භාෂා කඳවුරක් පවත්වන ලදි. මෙය පවත්වන ලද්දේ මාකඳුර ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකයේ කාර්ය මණ්ඩලය විසිනි. මාකඳුර පරිශ්‍රයේ පීඨ දෙකෙහි සිසුන් 80 දෙනෙකු මෙම එක් දින වැඩමුළුව සඳහා සහභාගි වූහ. HETC ව්‍යාපෘතිය විසින් විශ්වවිද්‍යාලයේ ඉංග්‍රීසි භාෂා තරගය සංවිධානය කරන ලදි. ලිඛිත හා අන්තර්ජාලය හරහා පවත්වනු ලබන විභාග මැයි මාසයේ දී පවත්වන ලද අතර කථාකිරීමේ විභාගය නොවැම්බර් මාසයේ දී පවත්වන ලදි. අනෙකුත් විශ්වවිද්‍යාලවලින් පැමිණි පරීක්ෂකවරුන් සඳහා මාකඳුර ඉංග්‍රීසි අංශය පහසුකම් සපයන ලදි. පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය මඟින් සංවිධානය කරන ලද දෙදින උපදේශන වැඩසටහනට මෙම ඒකකයේ කාර්යය මණ්ඩලය සහභාගී විය. ඉංග්‍රීසි ඉගැන්වීමේ ඒකකය මඟින් එහි කාර්යය මණ්ඩලය සඳහා ඉලෙක්ට්‍රොනික මාධ්‍ය හරහා ඉගැන්වීමේ වැඩමුළුව HETC ව්‍යාපෘතිය යටතේ සංවිධානය කර ඇත. මෙම වැඩසටහන සඳහා ඉංග්‍රීසි අංශයේ උපදේශකවරුන් තුන්දෙනෙක් සහභාගී විය. HETC ව්‍යාපෘතිය මඟින් සංවිධානය කරන ලද, උපදේශක ආචාර්ය අශාන්ත අත්තනායක මහතා සමඟ පැවති විෂය මාලා සංශෝදනය කිරීමේ වැඩමුළුවට ඉංග්‍රීසි අංශයේ සියළුම කාර්යය මණ්ඩලය සහභාගී විය. ඉංග්‍රීසි දින තරගය නිමිතිකොට ගෙන ඉංග්‍රීසි අංශයේ උපදේශකවරුන් විසින් වාචික ඉදිරිපත් කිරීම් සහ ලිවීමේ ක්‍රියාකාරකම් සඳහා සිසුන් පුහුණු කරවන ලදි.

## 23.3 කාර්යය මණ්ඩලය

මෙම ඒකකය සඳහා එක් ස්ථිර ඉංග්‍රීසි උපදේශකවරයෙකු සහ තාවකාලික ඉංග්‍රීසි උපදේශකවරුන් හතරදෙනෙක් සිටිති. එමෙන්ම ඉංග්‍රීසි අංශය මඟින් බාහිර උපදේශකවරයෙකුගේ ද සේවය ලබා ගනියි. ඊට අමතරව පරිගණක යෙදුම් සහකාරවරයෙකු සහ කම්කරු ශ්‍රේණියේ සේවකමහතෙකු අනුයුක්ත කොට ඇත.

## 23.4 වසර තුළ ලබා ඇති ප්‍රගතිය

දෙසැම්බර් මාසයේ දී පීඨ මට්ටමින් ඉංග්‍රීසි තරඟ පවත්වන ලදි. විශ්වවිද්‍යාල මට්ටමින් පවත් වන ලද තරඟවලදී දී බොහෝ සිසුන් පීඨය වෙනුවෙන් ස්ථානයක් ලබා ගැනීමට සමත්විය. සියළුම ඉංග්‍රීසි වැඩසටහන් සාර්ථකව පවත්වන ලදි. බාහිර අයදුම්කරුවන් වෙනුවෙන් ඉලෙක්ට්‍රොනික් මාධ්‍ය හරහා ඉංග්‍රීසි ඉගැන්වීම සහතිකපත්‍ර පාඨමාලාව පවත්වන ලදි. කෘෂිකර්ම හා වැවිලි කළමණාකරන පීඨයේ අභ්‍යන්තර සිසුන් සඳහා ව්‍යාපාර ඉංග්‍රීසි සහතික පත්‍ර පාඨමාලාව හඳුන්වා දෙන ලදි. මෙම පාඨමාලාව හැදෑරීමට කැමැත්තක් දක්වන සිසුන්ට අදාළ විභාග සඳහා පෙනී සිට සහතික ලබා ගත හැකිය. ඉංග්‍රීසි අංශයේ සේවය කළ පරිගණක යෙදුම් සහකරු කාර්මික නිලධාරී ලෙස උසස්වීමක් ලබා කුලියාපිටිය පරිශ්‍රයට මාරු වී යන ලදි. ඩබ්ලිව් එම් සී ප්‍රනාන්දු මිය ජ්‍යෙෂ්ඨ ඉංග්‍රීසි උපදේශක වශයෙන් උසස් වීමක් ලැබී ය.

### 23.5 දුෂ්කරතා

මූලික දුෂ්කරතාවයවනුයේ ඉංග්‍රීසි භාෂා ඉගැන්වීමේ ඒකකය සඳහා ප්‍රමාණවත් තරම් ස්ථිර ගුරුවරුන් නොමැති වීමය.

### 23.6 යෝජනා

මෙම ඒකකය සඳහා දේශන පැවැත්වීමට අවශ්‍ය ස්ථිර කාර්යය මණ්ඩලයක් බඳවා ගැනීමට යෝජනා කරන අතර HETC ව්‍යාපෘතිය යටතේ සැළසුම් කරන ලද ක්‍රියාකාරකම් නිම කිරීමට නියමිතය.

## 24. වෛද්‍ය මධ්‍යස්ථානය

වයඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය මධ්‍යස්ථාන දෙකක් කුලියාපිටිය සහ මාකඳුර පරිශ්‍රවල ස්ථාපිත කර ඇති අතර එම මධ්‍යස්ථානය මඟින් 2012 වසරේදී මෙන් 2013 වසරේදී ද සෞඛ්‍ය ප්‍රවර්ධනය සම්බන්ධයෙන් ඉතා කැපී පෙනෙන භූමිකාවක් ඉටු කර ඇත.

කුලියාපිටිය වෛද්‍ය ඒකකය 2010 වසරේදී නව ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇති අතර දැනට ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

මාකඳුර පරිශ්‍රයේ වෛද්‍ය මධ්‍යස්ථානය 2011 ඔක්තෝබර් මාසයේ අලුත් ගොඩනැගිල්ලක ස්ථාපිත කර ඇත. එදින සිට එහි කටයුතු සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ.

කුලියාපිටිය පරිශ්‍රයේ කාර්යය මණ්ඩලය 2012 වසරේදී මෙන් හෙද නිලධාරියෙක්, මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයෙක්, ඖෂධවේදියෙක්, යතුරු ලේඛිකාවක්, සාත්තුසේවකයෙක් සහ කම්කරුවෙකු යන කාර්යය මණ්ඩලයකින් සමන්විත වේ. මාකඳුර පරිශ්‍රයේ ද යතුරු ලේඛිකාවක් හැර මෙවැනිම කාර්යය මණ්ඩලයක් සේවය කරති.

එමෙන්ම වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් නවක සේවකභවතුන් සහ සේවා දීර්ඝ කිරීම සඳහා අයදුම්කරන සේවකභවතුන් වෙත වෛද්‍ය පරීක්ෂණ වාර්තා ලබා දෙන ලදි.

වෛද්‍ය මධ්‍යස්ථානය මඟින් සිසුන් සහ කාර්ය මණ්ඩලයේ සුළු අසනීප සඳහා ප්‍රතිකාර කරන ලද අතර විශේෂඥ වෛද්‍ය අවධානය අවශ්‍ය වූවන් කුලියාපිටිය මූලික රෝහල වෙත යොමු කරන ලදි.

2013 වසරේදී කරන ලද සෞඛ්‍ය ප්‍රවර්ධන වැඩ සටහන් පහත දැක්වේ.

1. බෝනොවන රෝග සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ සුවනාරී සායනයක් පැවැත්වීම
2. දඩාවතේ යන සුනඛයින් වන්ධ්‍යකරණය කිරීම
3. මදුරු මර්ධන වැඩ සටහන්

2013 වසරේදී වෛද්‍ය මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩලය කණ්ඩායමක් ලෙස සීමිත ප්‍රතිපාදන යටතේ වැඩ කිරීමෙන් කුලියාපිටිය හා මාකඳුර පරිශ්‍ර දෙකෙහිම සමස්ථ විශ්වවිද්‍යාල ප්‍රජාවටම සේවය ලබා දීමට හැකිවිය.

## 25. පුනරාවර්තන වියදම් විස්තර

| විෂය | 2012 රු. | 2013 රු. |
|---|---|---|
| අ. පුද්ගල වැටුප් හා වේතන | 314,206,381 | 386,682,763 |
| ආ. ගමන් වියදම් | 875,428 | 1,762,597 |
| ඇ. සැපයුම් | 19,492,978 | 30,631,815 |
| ඈ. නඩත්තු | 8,881,711 | 9,551,845 |
| ඉ. ගිවිසුම් ගත සේවා | 99,703,430 | 114,608,404 |
| ඊ. අනෙකුත් | 10,542,783 | 17,779,217 |
| **එකතුව** | **453,702,711** | **561,016,641** |

## 26. මූලධන වියදම් විස්තර

| විෂය | 2012 රු. | 2013 රු. |
|---|---|---|
| අ. ගෘහභාණ්ඩ සහ කාර්යාලීය උපකරණ අත්පත්කර ගැනීම් | 48,918,403 | 53,389,781 |
| ආ. යන්ත්‍ර අත්පත්කර ගැනීම් | - | - |
| ඇ. ගොඩනැගිලි සහ සවිකිරීම් අත්පත්කර ගැනීම් | - | - |
| ඈ. ඉඩකඩම් අත්පත්කර ගැනීම් | - | 4,013,750 |
| ඉ. අනෙකුත් (පොත් සහ අනෙකුත් භාණ්ඩ) | 9,267,227 | 9,668,442 |
| **එකතුව** | **58,185,630** | **67,071,973** |

## 27. මූල්‍ය ප්‍රගතියේ විස්තර (වියදම්)

| විෂය | 2013 සඳහා ප්‍රතිපාදන රු. | 2013 වර්ෂය තුළ වියදම් කිරීම් රු. | ඉතිරිකිරීම් /අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. ව්‍යාපෘති හැර පුනරාවර්තන | 619,625,000 | 561,016,641 | 58,608,359 |
| ආ. ව්‍යාපෘති හැර මූලධන | 162,636,000 | 101,904,372 | 60,731,628 |
| ඇ. ව්‍යාපෘති – දේශීය අරමුදල් | 392,000,000 | 252,473,096 | 139,526,904 |
| ඈ. ව්‍යාපෘති - විදේශීය අරමුදල් | 15,303,143 | 11,806,130 | 3,497,013 |
| **එකතුව** | **1,189,564,143** | **927,200,239** | **262,363,904** |

## 28. මූල්‍ය ප්‍රගතියේ විස්තර (උපයන ලද ආදායම්)


| ආදායම් ප්‍රභවය | 2013 සඳහා ප්‍රතිපාදන රු. | 2013 වර්ෂයේ රැස්කිරීම් රු. | ඌනතාවය/අතිරික්තය රු. |
|---|---|---|---|
| අ. උපාධිඅපේක්ෂක අධ්‍යයන | - | 5,470,000 | - |
| ආ. පශ්චාත් උපාධි අධ්‍යයන | - | 17,582,200 | - |
| ඇ. උපදේශන | - | - | - |
| ඈ. අනෙකුත් | - | 46,009,848 | - |
| **එකතුව** | **-** | **69,062,048** | **-** |

## 29. මූල්‍ය ප්‍රගති සමාලෝචනය – 2013

| විෂය | සමීකරණය | එක් ශිෂ්‍යයෙකු සඳහා වියදම රු. |
|---|---|---|
| අ. ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් | ඒක ශිෂ්‍ය පුනරාවර්තන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 218,124.67 |
| ආ. ඒක ශිෂ්‍ය මූලධන වියදම් | ඒක ශිෂ්‍ය මූලධන වියදම් / ශිෂ්‍ය සංඛ්‍යාව | 26,077.75 |
| **එකතුව** | | |

## 30. පීඨ අනුව එක් ශිෂ්‍යයෙකුට වියදම 2010 - 2013 (මහපොළ සහ ශිෂ්‍යාධාර ගෙවීම් ද ඇතුළුව)

| පීඨය | ඒක ශිෂ්‍ය වියදම (රු.) | | | |
|---|---|---|---|---|
| | **2010** | **2011** | **2012** | **2013** |
| කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ | 256,350.77 | 288,119.98 | 336,214.07 | 331,148.20 |
| ව්‍යවහාරික විද්‍යා | 250,292.34 | 270,115.82 | 323,446.62 | 312,817.53 |
| ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | 163,537.26 | 178,654.05 | 208,554.66 | 195,487.07 |
| පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | 295,012.88 | 322,380.81 | 374,896.40 | 349,456.13 |



## 31. ව්‍යාපෘති පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම සහ විස්තරය | ණය/ප්‍රතිපාදන | අරමුදල් ප්‍රභවය | මුළු පිරිවැයේ එකතුව රු. | RFA රු. | DF රු. |
|---|---|---|---|---|---|
| දේශන ශාලා (දෙවන අදියර – පළමු කොටස සහ දෙවන අදියර – දෙවන කොටස) ව්‍යවහාරික විද්‍යා පීඨය, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 118,200,000 | - | - |
| දේශන ශාලා (දෙවන අදියර – පළමු කොටස සහ දෙවන අදියර – දෙවන කොටස) පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය | - | ශ්‍රී ලංකා රජය | 97,000,000 | - | - |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය දෙවන අදියර - කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 17,500,000 | - | - |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය පළමු අදියර - මාකඳුර | | | 7,500,000 | | |
| දේශන ශාලා පළමු අදියර – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 165,000,000 | - | - |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා තනිකඩ නේවාසිකාගාර, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 | - | - |
| අධ්‍යයන කාර්යය මණ්ඩලය සඳහා තනිකඩ නේවාසිකාගාර, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 49,000,000 | - | - |
| දේශන ශාලා දෙවන අදියර - කෘෂිකර්ම හා වැවිළි කළමනාකරණ පීඨය, මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 125,000,000 | - | - |
| නේවාසිකාගාර හතරවන අදියර- කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |
| නේවාසිකාගාර පස්වන අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |
| නේවාසිකාගාර හයවන අදියර - මාකඳුර | - | ශ්‍රී ලංකා රජය | 69,000,000 | - | - |
| මාකඳුර පරිශ්‍රයේ පිවිසුම් මාර්ගය | - | ශ්‍රී ලංකා රජය | 23,400,000 | - | - |
| ක්‍රීඩාගාරයේ වැඩිදියුණු කිරීම්, කුලියාපිටිය | - | ශ්‍රී ලංකා රජය | 50,000,000 | - | - |
| පීඨ ගොඩනැගිල්ල – පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය-මාකඳුර (තුන්වන අදියර) | - | ශ්‍රී ලංකා රජය | 169,500,000 | - | - |
| ගෘහස්ථ ක්‍රීඩාංගනය | - | ශ්‍රී ලංකා රජය | 250,000,000 | - | - |
| ශ්‍රවණාගාරය | - | ශ්‍රී ලංකා රජය | 205,000,000 | - | - |
| නැනෝ තාක්ෂණ විද්‍යාගාරය | - | ශ්‍රී ලංකා රජය | 30,000,000 | - | - |

## 32. ව්‍යාපෘතිවල වියදම් පිළිබඳ විස්තර (දේශීය අරමුදල්)

| නම | මුළු පිරිවැයේ එකතුව රු. | 2012 වර්ෂයේ වියදම රු. | 2013 වර්ෂයේ වියදම රු. | 31.12.2013 වර්ෂය වන විට මුළු වියදම | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|---|---|
| **පවත්වාගෙන යන ඉදිකිරීම් ව්‍යාපෘති** | | | | | |
| පීඨ ගොඩනැගිල්ල – ව්‍යවහාරික විද්‍යා පීඨය - කුලියාපිටිය දෙවන අදියර (පළමු සහ දෙවන කොටස) | 118,200,000 | - | 2,849,595 | 2,849,595 | 100% |
| පීඨ ගොඩනැගිල්ල – පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය-මාකඳුර (පළමු සහ දෙවන අදියර ) | 97,000,000 | - | 687,962 | 687,962 | 100% |
| පීඨ ගොඩනැගිල්ල – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය - කුලියාපිටිය (පළමු අදියර ) | 165,000,000 | 39,216,487 | 27,775,426 | 96,242,202 | 100% |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය පළමු අදියර - මාකඳුර | 7,500,000 | 2,058,052 | - | 5,177,635 | 100% |
| සෞඛ්‍ය මධ්‍යස්ථානය දෙවන අදියර- කුලියාපිටිය | 17,500,000 | 1,794,550 | 4,013,960 | 5,870,876 | 100% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, කුලියාපිටිය | 49,000,000 | 8,533,521 | 1,891,645 | 10,425,166 | 75% |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය III අදියර - කුලියාපිටිය | - | 14,499,527 | - | 14,499,527 | 100% |
| මාකඳුර පරිශ්‍රයේ පිවිසුම් මාර්ගය පළමු අදියර | 23,400,000 | | 15,618,632 | 15,618,632 | 100% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, මාකඳුර | 49,000,000 | 3,326,811 | 16,042,762 | 21,267,670 | 100% |
| පීඨ ගොඩනැගිල්ල – කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය - මාකඳුර (පළමු අදියර) | - | 9,265,369 | - | 86,732,269 | 100% |
| පීඨ ගොඩනැගිල්ල – කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය - මාකඳුර (දෙවන අදියර) | 125,000,000 | 17,596,623 | 21,789,729 | 39,386,352 | 90% |
| පරිපාලන සංකීර්ණය - කුලියාපිටිය | - | 871,919 | - | 85,313,297 | 100% |

| | | | | | |
|---|---|---|---|---|---|
| නේවාසිකාගාර ව්‍යාපෘතිය හතරවන අදියර - කුලියාපිටිය | 69,000,000 | 8,356,466 | 18,642,177 | 26,998,643 | 100% |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය පස්වන අදියර - මාකඳුර | 69,000,000 | 161,280 | 21,828,178 | 21,989,458 | 25% |
| නේවාසිකාගාර ව්‍යාපෘතිය හයවන අදියර - මාකඳුර | 69,000,000 | - | 16,067,689 | 16,067,689 | 15% |
| කුලියාපිටිය ක්‍රීඩා භූමියේ තණකොළ වැවීම හා අනෙකුත් සංවර්ධන කටයුතු | 50,000,000 | 9,214,240 | 7,578,665 | 16,792,906 | 75% |
| **නව ඉදිකිරීම් ව්‍යාපෘති** | | | | | |
| පීඨ ගොඩනැගිල්ල – පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය- මාකඳුර (තුන්වන අදියර) | 169,500,000 | - | 27,416,906 | 27,416,906 | 5% |
| **දායට කිරුළ ව්‍යාපෘති** | | | | | |
| ගෘහස්ථ ක්‍රීඩාංගනය | 250,000,000 | - | 42,499,680 | 42,499,680 | 50% |
| ශ්‍රවණාගාරය | 205,000,000 | - | 24,776,786 | 24,776,786 | 50% |
| නැනෝ තාක්ෂණ විද්‍යාගාරය | 30,000,000 | - | 2,993,304 | 2,993,304 | 50% |
| **එකතුව** | | **114,894,845** | **252,473,096** | **563,606,553** | |

## 33. යටිතල පහසුකම් ලැබීම් පිළිබඳ විස්තර - 2013

| යටිතල පහසුකම් පිළිබඳ විස්තර | වියදම රු. | භෞතික ප්‍රගතිය |
|---|---|---|
| පීඨ ගොඩනැගිල්ල - පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය<br>දෙවන අදියර (පළමු කොටස)<br>දෙවන අදියර (දෙවන කොටස) | - | 100% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යවහාරික විද්‍යා පීඨය<br>දෙවන අදියර (පළමු කොටස)<br>දෙවන අදියර (දෙවන කොටස) | - | 100% |
| පීඨ ගොඩනැගිල්ල - කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය දෙවන අදියර | 8,800,000 | 90% |
| පීඨ ගොඩනැගිල්ල - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය පළමු අදියර | 24,700,000 | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය පළමු අදියර - මාකඳුර | - | 100% |
| වෛද්‍ය මධ්‍යස්ථානය දෙවන අදියර – කුලියාපිටිය | 3,660,000 | 100% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, මාකඳුර | 11,040,000 | 100% |
| අධ්‍යයන කාර්යය මණ්ඩල තනිකඩ නේවාසිකාගාර, කුලියාපිටිය | 3,610,000 | 75% |
| නේවාසිකාගාර හතරවන අදියර, කුලියාපිටිය | 17,260,000 | 100% |
| නේවාසිකාගාර පස්වන අදියර, මාකඳුර | 23,300,000 | 25% |
| නේවාසිකාගාර හයවන අදියර, මාකඳුර | 15,500,000 | 15% |
| මාකඳුර පරිශ්‍රයේ පිවිසුම් මාර්ගය | 14,000,000 | 100% |
| ක්‍රීඩාගාරය සංවර්ධනය කිරීම, කුලියාපිටිය | 15,200,000 | 75% |
| පීඨ ගොඩනැගිල්ල - පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය තුන්වන අදියර | 30,500,000 | 5% |
| ගෘහස්ථක්‍රීඩාංගනය | 42,500,000 | 50% |
| ශ්‍රවණාගාරය | 24,780,000 | 50% |
| නැනෝ තාක්ෂණ විද්‍යාගාරය | 2,990,000 | 50% |

## 1971 අංක 38 දරණ මුදල් පනතේ 13(6) ඡේදයේ ප්‍රකාර ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2013වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික ගිණුම් ප්‍රකාශන පිළිබඳ ව්‍යවස්ථාපිත වාර්තාව

1. මෙම මූල්‍ය ප්‍රකාශය 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 106(1) සහ 107(බී) ඡේදයන්ට හා කලින් කල නීතිගත කරන ලද සංශෝධනවලට හා 1971 අංක 38 දරණ මුදල් පනතට අනුව පිළියෙල කොට ඉදිරිපත් කරනු ලැබේ.

   (i) ගිණුම් ප්‍රකාශන ඉදිරිපත් කිරීම හා අර්ථ නිරූපනය කිරීම සංගතතාවයක් පවත්වා ගනිමින් හා රාජ්‍ය අංශයේ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත හා විශ්වවිද්‍යාලයේ වාර්ෂික ගිණුම් වාර්තා ඉදිරිපත් කිරීමේදී සාමාන්‍යයෙන් පිළිපදිනු ලබන පොදුවේ පිළිගත් පරිචයන්ට අනුකූලව මෙම ගිණුම් අර්ථ නිරූපනය හා ඉදිරිපත් කිරීම සිදු කොට ඇත.

අ **<u>මූල්‍ය හෙළිදරව්ව</u>**

(1) **රජයේ ප්‍රතිපාදන**

| | | 2013 | 2012 |
|---|---|---|---|
| | රු. | **2013** | **2012** |
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 536,532,163.00 | 431,000,000.00 |
| මහපොළ ශිෂ්‍යත්ව ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 16,271,250.00 | 12,459,350.00 |
| ශිෂ්‍යාධාර ගෙවීම් සඳහා රජයේ ප්‍රතිපාදන | රු. | 16,145,800.00 | 8,727,200.00 |
| මූලධන101 පුනරුත්තාපන වැඩසටහන | රු. | 33,800,000.00 | 50,000,000.00 |
| මූලධන 102 වත්කම් අත්පත් කර ගැනීම | රු. | 65,300,000.00 | 57,000,000.00 |
| මූලධන 103 ස්ථිර ඉදිකිරීම් | රු. | 255,250,000.00 | 115,000,000.00 |
| තොරතුරු තාක්ෂණය සඳහා විශේෂ මූලධන ප්‍රතිපාදන | රු. | 800,000.00 | 4,915,000.00 |
| **එකතුව** | රු. | **924,099,213.00** | **679,101,550.00** |

| පශ්චාත් උපාධි පාඨමාලා | | 2013 | 2012 |
|---|---|---|---|
| ව්‍යාපාර පරිපාලනපති පාඨමාලාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 7,940,000 | 2,709,175 |
| පශ්චාත් උපාධි ඩිප්ලෝමා - ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 9,642,200 | 5,899,500 |
| **බාහිර උපාධි පාඨමාලා** | | | |
| කෘෂිකර්ම කළමනාකරණ පාඨමාලාව – මාකඳුර | රු. | 5.470,000 | 2,565,000 |
| **ඩිප්ලෝමා පාඨමාලා** | | | |
| ඉංග්‍රීසි ඩිප්ලෝමාව | රු. | 9,753,200 | 12,268,260 |
| රක්ෂණ ඩිප්ලෝමාව – ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | රු. | 4,732,500 | 2,660,875 |
| රක්ෂණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව | | 1,619,000 | - |
| **සහතික පත්‍ර පාඨමාලා** | | | |
| තොරතුරු තාක්ෂණය පිළිබඳ සහතික පත්‍ර – කුලියාපිටිය | රු. | 550,600 | 292,500 |
| බාහිර පරිගණක පාඨමාලා – මාකඳුර | රු. | 4,753,300 | 3,368,700 |
| **පර්යේෂණ ප්‍රතිපාදන** | | | |
| NSF ප්‍රතිපාදන | රු. | 3,697,000 | 1,543,989 |
| **අනෙකුත් ප්‍රතිපාදන** | | | |
| IDRC | රු. | 20,904,248 | 24,507,460 |
| **එකතුව** | රු. | **69,062,048** | **61,421,345** |

(2) 2013 වර්ෂයේදී ආදායම ඉක්මවා ගිය වියදම වූ රු. (135,852,594.55) 2012 වර්ෂයේදී රු. (125,110,996.85). මෙය ප්‍රධාන වශයෙන්ම ගිණුම්කරණ ක්ෂය වීම නිසා සිදුව ඇත.

(3) පසුගිය වසරේ විශ්වවිද්‍යාල කාර්ය මණ්ඩලය සඳහා ගෙවූ ණය හා අත්තිකාරම් මුදලින් අයකර ගත යුතු වූ රු. 26,516,893.87 මුදල මෙම වසරේදී රු. 27,861,660.21.

(4) 2012 වසරේදී රු. 16,841,710.51 වූ විශ්වවිද්‍යාලය මඟින් රැස් කරන ලද අරමුදල ආයෝජනයෙහි වටිනාකම ශේෂ පත්‍ර දිනය වන විට රු. 22,696,269.16 ක් විය.

(5) අභ්‍යන්තර ආදායම් ප්‍රභවය

| 2012 රු. | 2013 රු. | වෙනස රු. | වෙනස ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| 7,460,135.46 | 9,595,083.80 | 2,134,948.34 | 28.62% |

**a)** විශ්ව විද්‍යාලය මඟින් පවත්වාගෙන යනු ලබන බැංකු ගිණුම් වල 2013.12.31 දිනට ශේෂයන් එදිනට අදාළ මුදල් පොත් සමඟ සසඳන ලද අතර ශේෂ තහවුරු කිරීම් විගණකාධිපති වෙත සෘජුවම යොමු කරන ලෙස අදාළ බැංකුවලට උපදෙස් දෙන ලදී. මෙම ශේෂයන් කෙටි කාලීන බැදීම්වලට සමාන වේ.

**b)** ශේෂ පත්‍රයේ ගබඩා තොග ලෙස දක්වා ඇති ශේෂ වන රු. 22,729,103.05 ගබඩා තොග භෞතික සත්‍යාපනයෙන් ලබාගත් ශේෂය වන අතර අතිරික්ත හා ඌණ ශේෂයන් තොග ගැලපුම් ගිණුමට ගලපන ලදී. තොග සත්‍යාපනය වත්කම් වල හිමිකම පැවැත්ම හා වටිනාකම අනුව ගණනය කළ අතර තොග වෙනුවෙන් විශ්ව විද්‍යාලයේ පවත්වාගෙන යන ගිණුම් ලේඛන සමඟ සසඳන ලදී.

**c)** මූලධන කෙරීගෙන යන වැඩ ගිණුමෙහි 2013.12.31 දිනට ශේෂ පත්‍රයේ සඳහන් වන රු. 291,447,873.42 අගයන ලද්දේ ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිති අනුවය.

**d)** පොදු සංචිත ගිණුමේ 2013.12.31 දිනට ශේෂය රු. 846,625,186.66 ක් වන අතර 2012 වර්ෂයේදී රු. 712,425,487.27 කි. මෙය 2013 වර්ෂයෙන් වෙන් කළ විශ්‍රාම පාරිතෝෂික හා ස්ථාවර වත්කම් ක්ෂය වීම් පොදු සංචිතයට ගැලපීමේ ප්‍රතිඵලයක් ලෙස දැක්විය හැක.

කෙසේ වෙතත් වාර්ෂික ගිණුම් වාර්තාවලට ස්ථාවර වත්කම් ක්ෂය කිරීමේ සංකල්පය යොදා ගැනීම වි.වි.ප්‍ර.කො. අංක 649 දරණ 05.10.1995 දිනැති චක්‍රලේඛය මගින් හඳුන්වාදෙන ලද අතර 2013 වර්ෂයේ ස්ථාවර වත්කම් ක්ෂය ගැලපීම රු. 120,963,200.40 කි.

**e)** 2013.12.31 දිනට විශ්‍රාම පාරිතෝෂික දීමනා වෙන් කිරීමට රු. 75,041,347.32 ක් වන අතර එය විශ්‍රාම පාරිතෝෂික දීමනා පිළිබඳ පනත හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උපදෙස් අනුව වෙන් කර ඇත.

### ආ) <u>අයවැය පාලනය</u>

වැඩසටහන් අයවැය ලේඛණය 2013 වර්ෂයේදී ද ඵලදායි කළමණාකරන උපක්‍රමයක් ලෙස භාවිතා කරන ලදී.

### ඇ) <u>දේපල, පිරියත හා කාර්යාලීය උපකරණ පිළිබඳ ස්ථාවර වත්කම් ලේඛනය</u>

මෙම ස්ථාවර වත්කම් ලේඛන පිළියෙල කිරීම ක්‍රියාත්මක වෙමින් පවතී.

### ඈ) <u>පාලන ගිණුම් සැසඳීම</u>

උපලේඛන හා සියලුම පාලන ගිණුම් සසඳන ලද අතර එම සසඳන ලද උපලේඛන ගිණුම් වාර්තා සමඟ ඉදිරිපත් කර ඇත.

### පොදු කරුණු

අවසාන වශයෙන් 2013 වර්ෂය තුළ විශ්වවිද්‍යාලයට පාලනය කල නොහැකි කපා හැරීම් සීමා කිරීම් හා මිල උච්චාවචනයන් වැනි දුෂ්කරතා යටතේ වැඩකටයුතු සිදුකරගෙන යාමට සිදු වූ නමුත් එම බාධා මැඩගෙන 2013 වර්ෂයට අදාල අධ්‍යයන හා අනධ්‍යයන සැලසුම් වල සාර්ථකත්වය ළඟාකර ගත් බව දන්වනු කැමැත්තෙමි.

මහාචාර්ය S.J.B.A.ජයසේකර
උපකුලපති
වයඹ විශ්වවිද්‍යාලය
18 පෙබරවාරි 2014

# 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය තත්ත්වය

රු ' 000

| | සටහන | 2013 දෙසැම්බර් 31 දිනට | | 2012 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|
| **වත්කම්** | | | | | |
| **ජංගම වත්කම්** | | | | | |
| බැංකු ගිණුම් ශේෂය | 1 | 59,274 | | 28,732 | |
| ඉතිරිකිරීම් තැන්පත් | 2 | 376 | | 342 | |
| වෙළඳ හා වෙනත් ලැබීම් | 3 | 1,088 | | 999 | |
| වට්ටෝරුගත/ගබඩාගත | 4 | 22,729 | | 17,517 | |
| ඉදිරියට කළ ගෙවීම් | | 2,151 | | 1,341 | |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් | 5 | 595 | | 967 | |
| මූලධන අත්තිකාරම් | 6 | 173,754 | | 59,911 | |
| සේවා සහ සැපයුම් සඳහා අත්තිකාරම් | 7 | 2,252 | | 1,140 | |
| අනෙකුත් ජංගම වත්කම් | 8 | 6,723 | | 4,935 | |
| | | | 268,942 | | 115,884 |
| **ජංගම නොවන වත්කම්** | | | | | |
| දිගුකාලීන ආයෝජන | 9 | 22,696 | | 16,842 | |
| දේපල, පිරියත සහ උපකරණ | 10 | 957,663 | | 978,065 | |
| නොනිමි වැඩ | 11 | 291,448 | | 109,004 | |
| කාර්යය මණ්ඩල ණය | 12 | 27,267 | 1,299,074 | 25,550 | 1,129,461 |
| **වත්කම්වල එකතුව** | | | 1,568,016 | | 1,245,345 |
| **වගකීම්** | | | | | |
| **ජංගම වගකීම්** | | | | | |
| විවිධ ණය හිමියෝ | 13 | 23,729 | | 13,981 | |
| තැන්පත් | 14 | 2,269 | | 2,891 | |
| වියදම් ණය හිමියෝ | 15 | 22,868 | | 14,372 | |
| වෙනත් | 16 | 110,654 | 159,520 | 49,137 | 80,381 |

| | | | | | |
|---|---|---|---|---|---|
| **ජංගම නොවන වගකීම්** | | | | | |
| මූලධන - වැයවූ මූලධන ප්‍රතිපාදන | | 1,631,610 | | 1,453,863 | |
| මූලධන - වැයවූ ප්‍රතිපාදන / නොනිමි වැඩ | | 291,448 | | 109,004 | |
| වැය නොවූ මූලධන ප්‍රතිපාදන | **17** | 39 | | 562 | |
| විශේෂ ප්‍රතිපාදන | | 200,373 | | 200,047 | |
| පරිත්‍යාග අරමුදල් | **18** | 666 | | 396 | |
| විශේෂ අරමුදල් | **19** | 21,729 | | 12,530 | |
| පාරිතෝෂික වෙන්කිරීම් | | 75,041 | 2,220,906 | 66,772 | 1,843,174 |
| **වගකීම්වල එකතුව** | | | **2,380,426** | | **1,923,555** |
| **ශුද්ධ වත්කම්වල එකතුව** | | | **(812,410)** | | **(678,210)** |
| **ශුද්ධ වත්කම් / කොටස්** | | | | | |
| ඒකාබද්ධ අරමුදල | | (846,626) | | (712,426) | |
| සංචිත | | 34,216 | (812,410) | 34,216 | (678,210) |
| **ශුද්ධ වත්කම්/කොටස්වල එකතුව** | | | **(812,410)** | | **(678,210)** |

| | | |
|---|---|---|
| ................................ | ................................ | .................................... |
| (මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර) | (ජී පියරත්න මයා) | (ඩී ඒ යූ ධර්මදාස මයා) |
| උපකුලපති | ලේඛකාධිකාරී | වැඩ බලන මූල්‍යාධිකාරී |

## 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය

| මෙහෙයුම් ආදායම | මෙම වර්ෂය 2013 (රුපියල් '000) | පසුගිය වර්ෂය 2012 (රුපියල් '000) |
|---|---|---|
| පුනරාවර්තන වියදම් සඳහා රජයේ ප්‍රතිපාදන | 536,532 | 431,000 |
| ශිෂ්‍යාධාර සඳහා රජයේ ප්‍රතිපාදන | 16,146 | 8,727 |
| මහපොළ ශිෂ්‍යත්ව සඳහා රජයේ ප්‍රතිපාදන | 16,271 | 12,459 |
| පුනරාවර්තන ප්‍රතිපාදන (පුනරුත්තාපන ස්වභාවයේ) | 1,119 | 247 |
| ආයෝජන පොලිය | 34 | 220 |
| කාර්ය මණ්ඩල ණය පොලිය | 1,057 | 960 |
| දේපල කුලිය | 808 | 551 |
| පැරණි භාණ්ඩ අලෙවිය | 1,621 | 1,123 |
| එලදා විකිණීම | 642 | 589 |
| විවිධ ලැබීම් | 3,530 | 3,814 |
| ලියාපදිංචි ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 1,730 | 85 |
| විභාග ගාස්තු (උපාධි අපේක්ෂකයින්) | 62 | 23 |
| පුස්තකාලයීය දඩ | 111 | 95 |
| **මෙහෙයුම් ආදායම් එකතුව** | **579,663** | **459,893** |
| **මෙහෙයුම් වියදම (ක්ෂයවීම් ඇතුළුව)** | | |
| පුද්ගල වැටුප් හා වේතන (සටහන 01) | 386,683 | 314,206 |
| ගමන් වියදම් | 1,763 | 875 |
| සැපයුම් හා පාරිභෝජන | 30,632 | 19,493 |
| නඩත්තු | 9,552 | 8,882 |
| ගිවිසුම්ගත සේවා | 114,608 | 99,703 |
| ක්ෂයවීම් | 120,963 | 109,869 |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | 17,779 | 10,543 |
| මහපොළ හා ශිෂ්‍යාධාර ගෙවීම් | 32,417 | 21,187 |
| පුනරුත්තාපන වියදම් (පුනරාවර්තන ස්වභාවයේ) | 1,119 | 247 |
| **සමස්ත මෙහෙයුම් වියදම** | **715,516** | **585,005** |

| | | |
|---|---|---|
| **ශුද්ධ අතිරික්තය (ඌනතාව) ගත වූ කාලය තුළ** | **(135,853)** | **(125,112)** |
| | | |
| ඉදිරියට ගෙනා පෙර වර්ෂ ශේෂය | (712,426) | (587,314) |
| වර්ෂයේ ඌනතාව | (135,853) | (125,112) |
| එකතු කිරීම් - පෙර වර්ෂයේ ආදායම් | | |
| වෙනත් ගැලපීම් | 1,653 | |
| අඩු කිරීම් - පෙර වර්ෂයේ වියදම් | | |
| වෙනත් ගැලපීම් | | |
| **ඉ/ගෙ පොදු සංචිතය** | (**846,626**) | (**712,426**) |
| | | |
| සටහන 01 | | |
| වැටුප් හා වේතන | 173,101 | 151,073 |
| අතිකාල හා නිවාඩු දින ගෙවීම් | 11,517 | 7,751 |
| වෙනත් දීමනා | 144,539 | 102,134 |
| විශ්‍රාම ප්‍රතිලාභ (වි.වි.අ.අ., සේ.නි.භා.අ., විශ්‍රාම වැටුප්, පාරිතෝෂික) | 57,526 | 53,248 |
| **සමස්ත පුද්ගල ගෙවීම්** | **386,683** | **314,206** |

……………………………… ………………………………. ……………………………….

(මහාචාර්ය එස් ජේ බී ඒ ජයසේකර) (ජී පියරත්න මයා) (ඩී ඒ යූ ධර්මදාස මයා)

උපකුලපති ලේඛකාධිකාරී මූල්‍යාධිකාරී

## 2013 දෙසැම්බර් මස 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2013 දෙසැම්බර් 31 දිනට රු ' 000 | 2012 දෙසැම්බර් 31 දිනට රු ' 000 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | | |
| අතිරික්තය/(ඌනතාවය) සාමාන්‍ය ක්‍රියාකාරීත්වය | (135,853) | (125,112) |
| **එකතු කිරීම්: සංචලනය නොවන මුදල්** | | |
| ක්ෂය | 120,963 | 109,869 |
| පාරිතෝෂික වෙන්කිරීම් | 11,197 | 12,683 |
| පාරිතෝෂික ගෙවීම් | (2,927) | (251) |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් ලද ආදායම් | | |
| පෙර වර්ෂයේ ගැලපීම් - පෙර වර්ෂය වෙනුවෙන් කළ ගෙවීම් | | |
| තොගයේ වැඩිවීම්/අඩුවීම් | (5,213) | (538) |
| ණයගැතියෝ වැඩිවීම්/අඩුවීම් | (89) | (810) |
| කාර්යය මණ්ඩල ණය වැඩිවීම්/අඩුවීම් | (1,717) | (269) |
| කාර්යය මණ්ඩල අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | 372 | (359) |
| සැපයුම් සහ සේවා අත්තිකාරම් වැඩිවීම්/අඩුවීම් | (1,112) | 1,873 |
| ඉදිරියට කළ ගෙවීම් වැඩිවීම්/අඩුවීම් | (810) | 200 |
| අනෙකුත් ජංගම වත්කම් වැඩිවීම්/අඩුවීම් | (1,788) | (1,621) |
| විවිධ ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | 8,788 | (419) |
| තැම්පත් වැඩිවීම්/අඩුවීම් | (622) | 2,079 |
| වියදම් ණයහිමියෝ වැඩිවීම්/අඩුවීම් | 8,496 | (1,467) |
| අනෙකුත් ජංගම වගකීම් වැඩිවීම්/අඩුවීම් | 34,202 | (92) |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | 33,887 | (4,234) |
| **ශුද්ධ මෙහෙයුම් ක්‍රියාකාරීත්වයෙන් ලද මුදල් ප්‍රවාහය** | 33,887 | (4,234) |
| **ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| පිරියත හා උපකරණ මිලදී ගැනීම් | (361,310) | (230,622) |
| සීමිත අරමුදල් ආයෝජන | (5,854) | (4,567) |
| පරිත්‍යාග අරමුදල් | 270 | 7 |
| **ශුද්ධ ආයෝජන ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | (366,894) | (235,182) |

| | 2013දෙසැම්බර් 31 දිනට රු ' 000 | 2012දෙසැම්බර් 31 දිනට රු ' 000 |
|---|---|---|
| **මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | | |
| මූලධන ප්‍රතිපාදන - පුනරුත්තාපන හා වැඩිදියුණු කිරීම් | 32,000 | 50,000 |
| මූලධන ප්‍රතිපාදන - වත්කම් අත්පත්කර ගැනීම් | 65,300 | 57,000 |
| මූලධන ප්‍රතිපාදන - ස්ථිර ඉදිකිරීම් | 255,250 | 115,000 |
| විශේෂ ප්‍රතිපාදන | 1,800 | 8,349 |
| විශේෂ ලැබීම් | 9,199 | 6,202 |
| CARP අරමුදල | - | - |
| **ශුද්ධ මූල්‍ය ක්‍රියාකාරීත්වයේ මුදල් ප්‍රවාහය** | **363,549** | **236,551** |
| **ශුද්ධ වැඩිවීම්/(අඩුවීම්)** | **30,542** | **(2,865)** |
| | **28,732** | **31,597** |
| | **59,274** | **28,732** |

| **මුදල් සහ මුදල් සමාන දෑ පිළිබඳ විශ්ලේෂණය** | 2013 දෙසැම්බර් 31 දිනට | 2012 දෙසැම්බර් 31 දිනට |
|---|---|---|
| මහජන බැංකුව කුලියාපිටිය - ගි. අ. 028100151586123 | 15,904 | 11,754 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000171 | 9,460 | 4,023 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140000165 | 304 | 441 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0002874770 | 10,985 | 1,400 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 00001473507 | 6,933 | 5,651 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473508 | 738 | 613 |
| ලංකා බැංකුව කුලියාපිටිය - ගි. අ. 0001473388 | 39 | 476 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100120000963 | 4,240 | 1,826 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100130041538 | 1,027 | 1,138 |
| මහජන බැංකුව මාකඳුර - ගි. අ. 100140044857 | 9,644 | 1,410 |
| එකතුව | 59,274 | 28,732 |

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එන්ඩබ්ලිව්/පීටීඩී/ඩබ්ලිව්යූ/1/13/18    ඔබේ අංකය / உமது இல. / Your No. }    දිනය / திகதி / Date } 2015 මාර්තු 17 දින

උපකුලපති,
ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලය.

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 108 (1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.

---

ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 107 (5) උප වගන්තිය සහ 108 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. විශ්වවිද්‍යාල පනතේ 108 (1) උප වගන්තිය ප්‍රකාර විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. විශ්වවිද්‍යාල පනතේ 108 (2) උප වගන්තිය ප්‍රකාර විස්තරාත්මක වාර්තාව යථා කාලයේදී නිකුත් කරනු ලැබේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

### 1.3 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.



අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34   +94-11-2887223   oaggov@sltnet.lk   www.auditorgeneral.gov.lk

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්ති වලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

02. මූල්‍ය ප්‍රකාශන

---

2.1 තත්ත්වාගණනය කළ මතය

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---

2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

---

පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ වාර්තාවට අනුව පැවැත්ම තහවුරු නොවූ රු. 323,664 ක් වටිනා භාණ්ඩ වර්ග 108 ක වටිනාකම සහ බාහිර පාඨමාලා දෙකක් සඳහා ප්‍රධාන ශාඛාවෙන් නිකුත් කර තිබුණු රු. 252,542 ක් වටිනා ද්‍රව්‍යවල වටිනාකම වශයෙන් එකතුව වූ රු. 576,206 ක් සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විවිධ ව්‍යාපෘති සහ බාහිර පාඨමාලා සඳහා විශ්වවිද්‍යාල අරමුදලින් දරා තිබුණු වියදම්වල එකතුව වූ රු. 598,719 ක් විශ්වවිද්‍යාලයට ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කිරීම වෙනුවට වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කාර්යයන් සඳහා භාවිතා කරනු ලබන සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද පිරිවැය රු. 95,864,363 ක් වූ ස්ථාවර වත්කම් විෂයයන් 10 ක් ප්‍රත්‍යාගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) විශ්වවිද්‍යාලය වෙත බාහිර පාර්ශවයක් විසින් ලබාදී තිබුණු රු.1,000,000 ක මුදල ස්ථාවර තැන්පතුවල ආයෝජනය කිරීම මත 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු පොළිය වූ රු.130,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

### 2.2.2 පැහැදිලි නොකළ වෙනස්කම්

මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය අනුව වර්ෂයේ ක්ෂය කිරීම් රු. 120,963,189 ක් වූ අතර, ඊට අදාල උපලේඛණය අනුව එම වටිනාකම රු. 119,689,250 ක් වූයෙන් ඒ අතර රු. 1,273,949 ක වෙනසක් අනාවරණය විය. තවද ඉදිරිපත් කළ මුදල් ප්‍රවාහ ප්‍රකාශය අනුව ස්ථාවර වත්කම්වලට එකතු කිරීම් රු100,561,348 ක් ලෙස වාර්තා කර තිබුණද ඊට අදාල උපලේඛණය අනුව එම වටිනාකම රු. 99,287,399 ක් ලෙස දක්වා තිබීමෙන් රු. 1,273,949 ක වෙනසක් අනාවරණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂ 1996 සිට 2012 වර්ෂය දක්වා කාලය තුළ පුස්තකාල පොත් සහ සඟරා මිලදී ගැනීම සඳහා ලබා දෙන ලද රු. 929,684 ක අත්තිකාරම්ද, 2011 වර්ෂයේදී ලබාදී තිබූ රු. 3,136,709 ක කොන්ත්‍රාත් අත්තිකාරම්ද, වර්ෂ 02 සිට වර්ෂ 08 දක්වා කාලයකට පෙර ලබාදී තිබූ රු. 340,206 ක සේවා අත්තිකාරම්ද, නිලධාරීන් 12 දෙනෙකු වෙත 2009 වර්ෂයට පෙර ලබාදී තිබූ රු. 200,551 ක අත්තිකාරම් මුදල්ද වශයෙන් එකතුව වූ රු.4,607,150 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් පියවා නොතිබුණි.

(ආ) දීර්ඝ කාලයක සිට පරිශේෂව පැවති රු. 74,545 ක ණයගැති ශේෂයන් හා රු. 16,187 ක ණයහිමි ශේෂ සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් පියවා ගෙන නොතිබුණි.

(ඇ) 2013 දෙසැම්බර් 31 දිනට පැවති රු.25,992,699 ක්වූ ගෙවිය යුතු ගිණුම් ශේෂය තුළ වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන රු.3,123,018 ක්ද විය.

2.4 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය 3 පරිච්ඡේදයේ 24.8 වගන්තිය | තාවකාලික ආචාර්යවරුන්ගේ සම්පූර්ණ සේවා කාලය වර්ෂ 02 කට නොවැඩි විය යුතු වුවද, එයට පටහැනිව තාවකාලික කථිකාචාර්යවරුන් 128 දෙනෙකු වෙත වර්ෂ 02 ක් ඉක්මවා පත්වීම් ලබාදී තිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 271 (2) (අ) (ආ) | 1995 වර්ෂයේ සිට 2012 දෙසැම්බර් 31 දක්වා නොගෙවන ලද රු. 342,766 ක් වටිනා වැටුප් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ) | අතුරු අග්‍රිමයක් වශයෙන් එක් අවස්ථාවකදී ලබා දිය හැකි උපරිම මුදල රු. 20,000 ක් වුවද, එම සීමාව ඉක්මවා අවස්ථා 09 කදී රු.567,050 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ලබාදී තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 396 (ඇ) | වටිනාකම රු. 358,180 ක් වූ නිකුත් කරන ලද දින සිට මාස 06 ක කාලයක් ඉක්ම වූ ගෙවීම සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් 47 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (iv) මුදල් රෙගුලාසි 571 (2) | තැන්පත් කළ දින සිට වර්ෂ දෙකක් ඉක්ම වූ රු. 1,308,558 ක් වටිනා විවිධ තැන්පතු 110ක් සම්බන්ධයෙන් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. |
| (v) මුදල් රෙගුලාසි 1645 හා 1646 | සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය භාවිතා කල වාහන 06 ක් වෙනුවෙන් නිකුත් කළ රු.604,866 ක් වටිනා ඉන්ධන වියදම් සනාථ කිරීම සඳහා අවශ්‍ය දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ රෙගුලාසි ප්‍රකාරව විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.13 ඡේදය | යාන්ත්‍රික ඉංජිනේරුවරයකුගෙන් වාර්තා ලබා ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය තුළ අවස්ථා 09 කදී වාහන අළුත්වැඩියාව සඳහා රු. 691,665 ක් ගෙවා තිබුණි. |
| (ඈ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා අත්පොත | |
| (i) 3.5 හා 9.3 මාර්ගෝපදේශ සහ ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 ඡේදය හා මුදල් රෙගුලාසි 135 | අවස්ථා 02 කදී රු. 439,065 ක වාහන අලුත්වැඩියා වියදම් සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ උපදෙස් හා මුදල් රෙගුලාසි 135 යටතේ වූ විශ්වවිද්‍යාලයේ බලය පැවරීම පිළිබඳව සීමාවන් උල්ලංඝණය කර තිබුණි. |
| (ii) ප්‍රසම්පාදන අත්පොතෙහි 8.13.4 ඡේදය හා 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛය | ව්‍යවහාරික විද්‍යා පීය ගොඩනැගිල්ල Stage II, Phase II ඉදිකිරීමේදී කොන්ත්‍රාත් වටිනාකමින් සියයට 13.78 ක් දක්වා වූ විචලනයන් වෙනුවෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරියා වශයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය ලබා නොගෙන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශය මත පමණක් රු.3,786,021 ක් ගෙවා තිබුණි. |
| (ඉ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය | නව වාහන මිලදී ගැනීමෙන් පසුව කුළී වාහන ඉවත් කළ යුතු වුවද, වයඹ විශ්වවිද්‍යාලය විසින් නව වාහන පහක් මිලදීගෙන තිබුණද සමාලෝචිත වර්ෂය තුළදී කුළී වාහන වෙනුවෙන් රු.1,821,666 ක් ගෙවා තිබුණි. |
| (ඊ) මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 මාර්තු 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 44 (03)(ආ) ඡේදය | සමාලෝචිත වර්ෂයේදී කථිකාචාර්යවරුන් 11 දෙනෙකු වෙත පර්යේෂණ දීමනා වශයෙන් රු.1,502,392 ක් ගෙවා තිබූ අතර, එම වසර තුළ කරන ලද අවසාන පර්යේෂණ වාර්තාව හා වසර 02 ක් අවසානයේ ප්‍රසිද්ධ කළ යුතු වාර්තාව අදාල පාර්ශවයන් වෙත ඉදිරිපත් කිරීමෙන් තොරව ඔවුන් වෙත සමාලෝචිත වර්ෂය ඉක්මවාද අදාල දීමනාව අඛණ්ඩව ගෙවා තිබුණි. |

## 03. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය තුළ විශ්වවිද්‍යාලයේ කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු. 135,853,000 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.125,112,000 ක ඌනතාවයක් විය. ඒ අනුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.10,741,000 ක පිරිහීමක් නිරීක්ෂණය විය.

3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය කාර්යසාධනය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය කාර්යසාධනය සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i). සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලය විසින් උපයාගත් ආදායම් සියයට 29 කින් වර්ධනය වී තිබුණද, එහි ඇතුළත් ආයෝජන ආදායම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී රු. 186,000 කින් අඩුවී තිබූ අතර, එහි ප්‍රතිශතය සියයට 547 ක් විය. එහෙත් ආයෝජනවල වටිනාකම පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 26 කින් වර්ධනය වී තිබුණි. පෙර වර්ෂය තුළදී ජංගම ගිණුම්වල තිබූ අතිරික්ත ශේෂයන් කෙටි කාලීනව ආයෝජනය කර පොළී ආදායමක් උපයාගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය තුළදී එම ක්‍රියාමාර්ග අනුගමනයකර නොතිබීම මෙම තත්ත්වයට හේතුවී තිබුණි.

(ii). සමාලෝචිත වර්ෂය තුළදී විශ්වවිද්‍යාලයේ මුළු වියදම් සියයට 22 කින් වර්ධනය වී තිබූ අතර, පෙර වර්ෂය සමඟ සැසඳීමේදී එහි ඇතුළත් ගමන් වියදම් රු. 875,000 සිට රු. 1,763,000 දක්වා සියයට 101 කින් වර්ධනය වී තිබුණි.

(iii). ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී වැටුප් හා වේතන, ගමන් වියදම් හා යැපීම් දීමනා, සැපයුම් හා පාරිභෝජ්‍ය ද්‍රව්‍ය, කොන්ත්‍රාත් සේවා, අනෙකුත් පුනරාවර්තන වියදම් සහ ශිෂ්‍යාධාර යන වියදම් විෂයයන්හි රු. 117,874,295 ක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර, ඒවායේ ප්‍රතිශතය සියයට 15 සිට සියයට 101 ක් දක්වා වූ පරාසයක පැවතුණි.

(ආ) මූල්‍ය තත්ත්වය

විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කෙරේ.

(i). සමාලෝචිත වර්ෂය අවසානයට ජංගම වත්කම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 132 කින් වර්ධනය වී තිබූ අතර, ප්‍රාග්ධන අත්තිකාරම් ශේෂය රුපියල් මිලියන 59 සිට රුපියල් මිලියන 173 දක්වා සියයට 193 කින් වර්ධනය වීම මීට බලපා තිබුණි.

(ii). ජංගම වගකීම් පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 98 කින් වර්ධනය වී තිබූ අතර, නොනිමි කාර්යයන් සඳහා වූ ප්‍රාග්ධන ප්‍රදාන සියයට 67 කින් වර්ධනය වීම මීට බෙහෙවින් බලපා තිබුණි.

(iii). සමුච්චිත අරමුදල දිගින් දිගටම හීන වෙමින් පැවති අතර, සමාලෝචිත වර්ෂය අවසානයට තවදුරටත් රුපියල් මිලියන 134 කින් හීන වී තිබුණි. එහි ප්‍රතිශතය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී සියයට 19 ක් විය.

3.3 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

විශ්වවිද්‍යාලය සමඟ 2012 වර්ෂයේදී රු. 27,000,952 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත කුලියාපිටිය පරිශ්‍රයේ තනි පුද්ගල නේවාසිකාගාරයක් ඉදිකිරීම සඳහා ගිවිසුමකට එළඹ, කොන්ත්‍රාත්තුව අතරමඟ නතර කර දැමූ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවකු විසින්, ඔහුගේ ඇපකරවල වටිනාකම වූ රු. 6,000,000 ක් අය කිරීම අත්හිටුවන ලෙසට 2014 මාර්තු 17 දින විශ්වවිද්‍යාලයට එරෙහිව අධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචන

4.1 කාර්යසාධනය

(අ) ඒක ශිෂ්‍ය පිරිවැය

සමාලෝචිත වර්ෂයේදී හා පෙර වර්ෂයේදී එක් එක් පීඨයන් සඳහා දරා ඇති වියදම, ශිෂ්‍ය සංඛ්‍යාව සහ ඒක ශිෂ්‍ය පිරිවැය පිළිබඳ වූ තොරතුරු පහත දැක්වේ.

| | පීඨය | විස්තරය | පෙර වර්ෂය 2012 රු. | සමාලෝචිත වර්ෂය 2013 රු. | වැඩිවීම ප්‍රතිශතයක් ලෙස සියයට |
|---|---|---|---|---|---|
| (i) | ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය | වියදම | 49,046,407 | 73,543,884 | 50 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 1042 | 1312 | 26 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 47,069 | 56,055 | 19 |
| (ii) | ව්‍යවහාරික විද්‍යා පීඨය | වියදම | 59,621,296 | 74,208,889 | 24 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 375 | 428 | 14 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 158,990 | 173,385 | 09 |
| (iii) | කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය | වියදම | 65,611,393 | 84,163,292 | 28 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 382 | 439 | 15 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 171,758 | 191,716 | 12 |
| (iv) | පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨය | වියදම | 66,078,130 | 82,539,376 | 25 |
| | | ශිෂ්‍ය සංඛ්‍යාව | 314 | 393 | 25 |
| | | ඒක ශිෂ්‍ය පිරිවැය | 210,440 | 210,024 | - |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2013 වර්ෂය තුළ පශු සම්පත් ධීවර හා පෝෂණ පීඨය සහ කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය අනෙකුත් පීඨවලට සාපේක්ෂව ඉහළ අගයක් ගෙන තිබුණු අතර, එය ප්‍රතිශතයක් ලෙස පිළිවෙලින් සියයට 34 ක් හා සියයට 30 ක් විය.

(ii) ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ සියයට 19 කින්ද, ව්‍යවහාරික විද්‍යා පීඨයේ සියයට 09 කින්ද, කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ සියයට 12 කින්ද පසුගිය වර්ෂයට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය වැඩි වී තිබුණි.

(ආ) විභාග පැවැත්වීම සහ ප්‍රතිඵල නිකුත් කිරීම

2013 වර්ෂයේදී විශ්වවිද්‍යාලයේ පැවති පීඨ 4 මගින් පවත්වා තිබුණ විභාග සඳහා පෙනී සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 397 ක්වූ අතර, ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ සිදුකරනු ලැබේ.

(i) විශ්වවිද්‍යාලයේ පශු සම්පත්, ධීවර හා පෝෂණ විද්‍යා පීඨය මගින් 2013 වර්ෂයේදී පවත්වන ලද විභාග සඳහා ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 13 කට ආසන්න කාලයක් ගතකර තිබුණු අතර, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය විසින් ඒ සඳහා මාස 8 කට ආසන්න කාලයක් ගතකර තිබුණි.

(ii) ව්‍යවහාරික විද්‍යාපීඨය හා කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය විසින් 2013 වර්ෂයේ පවත්වන ලද විභාගවලින් සියයට 11 කට ආසන්න ශිෂ්‍ය සංඛ්‍යාවක් විභාගවලින් අසමත්ව තිබුණු අතර, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය සහ පශුසම්පත්, ධීවර හා පෝෂණ පීඨය විසින් පවත්වන ලද විභාගවලින් සිසුන් අසමත්වීමේ ප්‍රතිශතය පිළිවෙලින් සියයට 6 ක් හා සියයට 5 ක් විය.

(ඇ) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ පැවති අධ්‍යයන පීඨ 04 හි 2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා ලියාපදිංචිව සිටි 1037 ක්වූ ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 122 ක් හෙවත් සියයට 12 කට ආසන්න ප්‍රමාණයක් වෙනත් විශ්වවිද්‍යාල වෙත මාරු වී ගොස් තිබුණු අතර, මාරුවීයාමට හේතුව ශිෂ්‍යයින් සඳහා වෙන්වී තිබුණු පහසුකම් ඵලදායී ලෙස උපයෝජනය කිරීමට විධිමත් පියවර ගෙන නොතිබුණි.

(ඈ) ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ ශිෂ්‍ය සංඛ්‍යාව හා අධ්‍යයන කාර්ය මණ්ඩලය සංඛ්‍යාව අතර පැවතිය යුතු සම්මත අනුපාතය 18:1 ක් වුවද, එහි තථ්‍ය අනුපාතය 37:1ක් විය. එසේම කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ එම සම්මත අනුපාතය 10:1 ක් විය යුතු වුවද, තථ්‍ය අනුපාතය 13:1 ක් විය. අනෙකුත් පීඨ දෙකෙහි සම්මත අනුපාතයට වඩා තථ්‍ය අනුපාතය සුළු ප්‍රමාණයකින් වැඩිවී තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ සේවයේ නියුතුව සිටි ආචාර්යවරුන් දෙදෙනෙකු විදේශගත වීමේදී, එකඟ වූ ගිවිසුම් කඩකිරීම හේතුවෙන් තවදුරටත් අයවිය යුතුව තිබූ රු. 1,542,625 ක් අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී කටයුතු කර නොතිබුණි.

(ආ) බාහිර දේශකවරුන් ඉටුකළ දේශන පිළිබඳ වාර්තා පොතෙහි සටහන් හා ඔවුන් වෙත ගෙවීම් කරන ලද වවුචර්වල දක්වා තිබූ සටහන් නොගැලපෙන අවස්ථා පැවතීම හා ශිෂ්‍ය අත්සන් ලේඛනවල අත්සන් තබා නොතිබීම සහ ශිෂ්‍ය අත්සන් ලේඛන විගණනයට ඉදිරිපත් නොකිරීම ආදී දුර්වලතා මගහරවා ගැනීමට කළමනාකරණය කටයුතුකර නොතිබුණි.

(ඇ) විශ්වවිද්‍යාලයේ ඡායා පිටපත් කිරීමේ යන්ත්‍ර සේවා කිරීම්වලට අදාල සේවා ගිවිසුම් සඳහා ගෙවීම් කිරීමේදී සේවාව සැපයීමට පෙර අදාල ආයතනවලට ගෙවීම් කළයුතු බැවින්, විශ්වවිද්‍යාලය අදාල ආයතන සමඟ ගිවිසුම් ගතවිය යුතු වුවත්, එසේ කටයුතු කර නොතිබූ අවස්ථා නිරීක්ෂණය විය. සමාලෝචිත වර්ෂය සඳහා සේවා සැපයීම වෙනුවෙන් රු.821,571 ක් ගෙවීම් කර තිබුණද, ගිවිසුමට අනුව සේවාව සැපයීම සඳහා පැමිණ නොතිබූ අවස්ථා සම්බන්ධයෙන් බලධාරීන් කටයුතු කර නොතිබුණි.

(ඇ) Outrech Center අරමුදල යටතේ 2011 මැයි 06 දින මාකඳුර පරිශ්‍රයේ ගිණුම් අංශය විසින් ආරම්භ කර තිබූ රු. 250,000 බැගින් වූ රු. 1,000,000 ක් වටිනා ස්ථාවර තැන්පතු 04 ක කල් පිරෙන දිනයන් දක්වා නොතිබූ අතර, ස්ථාවර තැන්පත් පොළිය සියයට 5 ක් ලෙස සටහන් කර තිබුණි. ඉකුත් වර්ෂ කිහිපය තුළ බැංකු පොළී අනුපාතය ඉතා ඉහළ මට්ටමක පැවතියද විශ්වවිද්‍යාලය විසින් අදාල මුදල් ආයෝජනය කිරීමේදී එම තත්ත්වය සැලකිල්ලට ගෙන ඇති බවක් නිරීක්ෂණය නොවීය.

(ඉ) ශිෂ්‍යයින් 60 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයීම සඳහා රු.2,700,000 ක වාර්ෂික කුළියකට ගොඩනැගිල්ලක් කුළියට ගැනීම හේතුවෙන් එහි ඒක ශිෂ්‍ය නේවාසික කුළී පිරිවැය රු.45,000 ක් වී තිබුණි. මෙම ගොඩනැගිල්ල මහල් දෙකකින් සමන්විත වී තිබුණු අතර, එක් මහලක ශිෂ්‍යයින් 75 දෙනෙකුට නේවාසික පහසුකම් සැපයිය හැකිව තිබියදීත් ශිෂ්‍යයින් 60 දෙනෙකු සඳහා මහල් දෙකක් කුළියට ගැනීම කළමනාකරණ අකාර්යක්ෂමතාවයක් බව නිරීක්ෂණය විය. තවද ඉකුත් වර්ෂයේදී මෙම මහල් දෙක වෙන වෙනම කුළියට ගෙන තිබුණු අතර, එක් මහලක් සඳහා ගෙවා තිබුණු මුදල රු.1,242,000 ක් විය.

## 4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා

ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයේ බාහිර කථිකාචාර්යවරුන් දෙදෙනෙකුහට ඉගැන්වීම සඳහා වෙන්කර දී තිබුණු පැය ගණන 330 ක් වුවද, ඉන් ආවරණය කර තිබුණේ පැය 210.5 ක් පමණි. පැය 119.5 ක් අඩුවෙන් ඉගැන්වීම හේතුවෙන් සිසුන්ට අදාල විෂයය කරුණු පිළිබඳව අවබෝධයක් ලබාදීම සඳහා සැලසුම් කර තිබුණු ඉලක්කයන් ~~ළඟාද~~ යන්න විගණනයේදී බැහැර කළ නොහැකි විය.

## 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

කුලියාපිටිය පරිශ්‍රයේ එලිමහන් රංග පීඨය ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුවේ ඉංජිනේරු ඇස්තමේන්තු වටිනාකම රු. 7,736,775 ක්වූ අතර, අදාල ප්‍රසම්පාදන කටයුතු අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුනොකර, විශ්වවිද්‍යාල ප්‍රසම්පාදන කමිටුව මඟින් සිදුකිරීම සඳහා එම කාර්යය අදියර 03 ක් යටතේ වෙන් වෙන්ව ප්‍රසම්පාදන කටයුතු සිදුකර තිබුණි.

## 4.5 දෘශ්‍ය අක්‍රමිකතා

භාණ්ඩාගාර ලේකම්ගේ අංක.45 හා 2011 අප්‍රේල් 07 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛයේ යෝජිත පර්යේෂණ දීමනාව ආචාර්යවරුන් විසින් චක්‍රලේඛයේ සඳහන් විධිවිධාන මුළුමනින්ම උල්ලංඝණය කර තිබුණි. ඒ අනුව 2011 හා 2012 වර්ෂවලදී ජාතික පර්යේෂණ ආයතනයෙන් පිළිවෙලින් රු.5,000,000 ක් රු.4,630,522 ක් ලබාගත් විශ්වවිද්‍යාලයේ පශු සම්පත් ධීවර හා පෝෂණ විද්‍යා පීඨයට අනුයුක්තව ඇති ආචාර්යවරයකු හා මහාචාර්යවරයෙකු වෙත සමාලෝචිත වර්ෂයේදී විශ්වවිද්‍යාලය විසින් පිළිවෙලින් රු.176,504 ක් හා රු.191,672 ක් පරීක්ෂණ දීමනා ගෙවා තිබුණි.

## 4.6 හඳුනාගත් අලාභ

විශ්වවිද්‍යාලය විසින් රු.1,656,000 ක් කුළී ගෙවීමේ පදනම මත ලබා ගෙන තිබුණු නිවාස 05 ක පදිංචිකරුවන්ගෙන් නිවාස කුළී වශයෙන් අයකර තිබුණේ කාර්ය මණ්ඩල නේවාසිකාගාර කමිටු තීරණ පරිදි රු.175,200 ක් පමණි. ඒ අනුව විශ්වවිද්‍යාලයට දැරීමට සිදුවී තිබූ අතිරේක පිරිවැය වර්ෂයකට රු.1,480,800 ක් වූ අතර අවම වශයෙන් ආර්ථික කුළිය අයකළේ නම් මෙම අලාභය අවම කරගත හැකිව තිබුණි.

4.7 ආර්ථික නොවූ ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කුලියාපිටිය පරිශ්‍රයේ ශිෂ්‍ය නේවාසිකාගාර ගොඩනැගිල්ල බදු ගැනීමේදී එහි තක්සේරු වටිනාකම ඉක්මවා රු. 167,000 ක් ගෙවා තිබුණි.

(ආ) හැකිතාක් දුරට අවම පිරිවැයෙන් මෙයෙයුම් කටයුතු සිදුකිරීම කළමණාකරණයේ වගකීම වුවද කුළී පදනම මත ගොඩනැගිලි ලබාගැනීමේදී වර්ෂයකට වඩා වැඩි කාලයක් ප්‍රයෝජනයට ගන්නා ගොඩනැගිලි වෙනුවෙන් කුළිය වාර්ෂික කුළී තක්සේරු පදනම වෙනුවට මාසික කුළී පදනම මත ගැනීම නිසා විශ්වවිද්‍යාලයට අතිරේක පිරිවැයක් දැරීමට සිදුවී තිබුණි.

4.8 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මාකඳුර පරිශ්‍රයේ අව්වාහක අධ්‍යයන කාර්ය මණ්ඩල නේවාසිකාගාරය ඉදිකිරීම

(i). ඉහත කොන්ත්‍රාත්තුව 2012 අගෝස්තු මාසය වන විට අවසන් කළයුතු වුවත්, අවසන් වැඩ වාර්තා ඉදිරිපත් කර තිබුණේ 2013 මාර්තු මාසයේදීය. ඒ සඳහා වූ කල් දිගුව අනුමත කර තිබුණේ 2014 ජුනි 26 දිනදීය.

(ii). ඉදිකිරීම් කොන්ත්‍රාත්තුවක් සඳහා ගෙවීම් කිරීමේදී On Account Payment ලෙස යම් මුදලක් ගෙවිය හැකි වුවත්, කොන්ත්‍රාත්තුව සඳහා මිනුම් වාර්තා නොමැතිව 2013 දෙසැම්බර් 23 දින රු.1,911,073 ක් ගෙවා තිබුණි.

(iii). කොන්ත්‍රාත් ගිවිසුමට අනුව මිළ විචලනයන්ට අදාල ගෙවීම් කිරීම සඳහා වූ කොන්දේසි පැහැදිලිව ඇතුළත් කර නොතිබියදීත්, මිල විචලනයන් සඳහා රු. 1,785,119 ක් ගෙවා තිබුණි.

(ආ) කෙරීගෙන යන වැඩ

මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය අවසානයට කෙරීගෙන යන වැඩ ලෙස රු. 291,447,873 ක් වටිනා කාර්යයන් 26 ක් දක්වා තිබූ අතර, ඉන් රු. 3,270,150 ක් වටිනා කාර්යයන් 05 කට අදාලව 2012 දෙසැම්බර් 31 දිනට දක්වා තිබූ ශේෂයේ කිසිදු වෙනසක් සිදුනොවී සමාලෝචිත වර්ෂය තුළදීද පැවතීම හේතුවෙන් එම කාර්යයන්හි කිසිදු ප්‍රගතියක් සිදුවී ඇති බවක් නිරීක්ෂණය නොවීය.

4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

2013 දෙසැම්බර් 31 දිනට වයඹ විශ්වවිද්‍යාලයේ අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව සම්බන්ධයෙන් පහත නිරීක්ෂණය කෙරේ.

(අ) විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන කාර්ය මණ්ඩලය 272 ක් වුවද, තථ්‍ය අධ්‍යයන කාර්ය මණ්ඩල සංඛ්‍යාව 219 ක් විය. සමාලෝචිත වර්ෂයේදී සමහර අධ්‍යයන අංශවල ඇතැම් විෂයයන් සඳහා විශේෂ නිපුනතාවයක් ඇති ආචාර්යවරුන් නොමැති වීම හේතුවෙන් බාහිර දේශකයින් 44 දෙනෙකු බඳවා ගෙන ඔවුන්ට වැටුප් වශයෙන් රු. 2,928,925 ක් ගෙවා තිබුණි.

(ආ) අනුමත සේවක සංඛ්‍යාව අනුව සුළු සේවකයන් 26 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර, එය දෛනික කටයුතු කර ගෙන යාමට එතරම් බාධාවක් නොවුවද, විවිධ හේතු දක්වමින් බාහිර ශ්‍රම සේවා සපයන ආයතනයකින් කම්කරුවන් 15 දෙනෙකු බඳවා ගෙන ඔවුන්ගේ වැටුප් වශයෙන් සමාලෝචිත වර්ෂයේදී රු.4,765,596 ක් ගෙවා තිබුණි.

(ඇ) ලිපිකරු හා සමාන්තර සේවා වෙනුවෙන් අවිධිමත් ලෙස තාවකාලික ලිපිකරුවන් වශයෙන් 05 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

5.1 සංයුක්ත සැලැස්ම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් 2010 - 2015 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය තුළදී වසර 2013 - 2017 කාලපරිච්ඡේදය ආවරණය වන පරිදි නව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර තිබුණි. නව සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීමේදී පෙර සංයුක්ත සැලැස්මට ඇතුළත්ව තිබූ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතුවලට සෘජු බලපෑමක් ඇති කරවන ~~පහත සඳහන්~~ ඉලක්ක හා කාර්යයන් අත්හැර දමා තිබුණි.

(ආ) වයඹ විශ්වවිද්‍යාලය විසින් ඉදිරිපත් කර තිබූ 2013 - 2017 නව සංයුක්ත සැලැස්මට අනුව වයඹ විශ්වවිද්‍යාලයේ ස්වයං උත්පාදන මූල්‍ය ආයෝජන සියයට 15 සිට සියයට 25 දක්වා වාර්ෂිකව වර්ධනය කිරීම අපේක්ෂා කර තිබුණි. එහෙත් එම අරමුණ ඉටුකර ගැනීම සඳහා යෝජිතව තිබුණු කරුණු අතර ගාස්තු අයකර ගන්නා පාඨමාලා සඳහා දේශීය හා විදේශීය සිසුන් බඳවා ගැනීම හා කාර්ය මණ්ඩලයේ විශේෂඥ දැනුම බාහිර සමාජය වෙත ලබාදීම යන ක්‍රියාකාරකම් ඉටුවී නොතිබුණි. තවද ඒ සඳහා යෝජිතව තිබුණු රු. මිලියන 4 ක ප්‍රතිපාදනද සලසා දී නොතිබුණි.

5.2 ක්‍රියාකාරී සැලැස්ම

(අ) විශ්වවිද්‍යාලයේ අරමුණු ඉටුකර ගැනීම පිළිබඳ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් විධිමත්ව සකස් කර නොතිබුණු අතර, පුනරාවර්ථන සහ ප්‍රාග්ධන වියදම් කාර්තු පදනම මත වියදම් කරන ආකාරය පිළිබඳ විස්තරයක් පමණක් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් ලෙස ඉදිරිපත් කර තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීම

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) ක්‍රියාකාරී සැලැස්මට අනුව ගොඩනැගිලි පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් යටතේ සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 59,500,000 ක් වෙන් කර තිබූ අතර, එම ප්‍රතිපාදනය මඟින් ඉටුකිරීමට අපේක්ෂිත වැඩ විෂයයන් මොනවාද යන්න සැලසුම් කර නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී විවිධ වැඩ විෂයයන් 52 ක් සඳහා රු. 31,816,149 ක් එනම් ඒ සඳහා වූ ප්‍රතිපාදනයෙන් සියයට 64 ක් වැයකර තිබුණි.

(ii) ගොඩනැගිලි ඉදිකිරීම සඳහා රු. 242,000,000 ක් වටිනා වැඩ විෂයයන් ඉටු කිරීමට අපේක්ෂා කළද, සමාලෝචිත වර්ෂය අවසානයට ඒවායේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොවූ බව නිරීක්ෂණය විය. ඒ අනුව මාකඳුර සෞඛ්‍ය මධ්‍යස්ථානය ඉදිකිරීම සඳහා ලද ප්‍රතිපාදන වලින් සියයට 100 ක්ද, ව්‍යවහාරික විද්‍යා පීඨ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා ලද ප්‍රතිපාදනවලින් සියයට 71.16 ක්ද, මාකඳුර තනි පුද්ගල නේවාසිකාගාර ඉදිකිරීම සඳහා වූ ප්‍රතිපාදනවලින් සියයට 67.57 ක්ද යනාදී වශයෙන් වැඩ විෂයයන් 09 ක් සඳහා ලද ප්‍රතිපාදනවලින් රු. 16,807,559 ක් ඉතිරි කර තිබුණි. තවද ධීවර හා පශු පෝෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ පියවර II ඉදිකිරීම සඳහා ලද ප්‍රතිපාදන ඉක්මවා සියයට 328.77 ක් වැය කර තිබුණි.

5.3 අයවැය ලේඛණමය පාලනය

වැය විෂයයන් 32 කට අදාලව අධි ඇස්තමේන්තු පිළියෙල කර තිබූ අතර, වැය විෂයයන් 27 කට අදාලව අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා තිබුණි. වැය විෂයයන් 04 ක මුළු ප්‍රතිපාදිත මුදලම වියදම් කර නොතිබුණි. එහෙයින් විශ්වවිද්‍යාලය විසින් වාර්ෂික අයවැය ලේඛණය ඵලදායී පාලන කාරකයක් ලෙස භාවිතා කර ඇති බවක් නිරීක්ෂණය නොවීය.

5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක 02 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 වගන්තිය සහ 1971 අංක 38 දරන මුදල් පනතේ 14 (1) වගන්තිය අනුව අදාල වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත විශ්වවිද්‍යාලයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවද, විශ්වවිද්‍යාලය ඒ අනුව කටයුතු කර නොතිබුණි.

5.5 නොවිසඳී ඇති විගණන ඡේද

වයඹ විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් වෙත 2010 - 2011 කාලසීමාව තුළ ඒකාබද්ධ අරමුදලින් එක් ව්‍යාපෘති යෝජනාවක් ඉදිරිපත් කළ ආචාර්යවරයකු වෙත එම ව්‍යාපෘතිය වෙනුවෙන් රු. 99,882 ක් ගෙවා තිබූ අතර, එම ව්‍යාපෘතියට අදාල පර්යේෂණ වාර්තාව 2013 පෙබරවාරි අවසානයට ඉදිරිපත් කළ යුතු වුවත්, 2014 ජුනි 30 දින වන විටත් ඉදිරිපත් කර නොතිබුණි.

5.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම

වාවහාරික විද්‍යා පීඨය විසින් පිරිනමන උපාධිය විශේෂ උපාධියක් නොවීම හේතුවෙන් වර්ෂ 2007 සිට මේ වන තෙක් මෙම පීඨයෙන් පළමු පෙළ පන්ති සාමාර්ථ සහිත සාමාන්‍ය උපාධියක් ලබා පිටවූ උපාධිධාරීන් 40 දෙනෙකුට එම පීඨයේ හෝ වෙනත් විශ්වවිද්‍යාල වලද අධ්‍යයන කාර්ය මණ්ඩලයේ රැකියා අවස්ථා අහිමි වී තිබුණි. ඒ සඳහා හේතු වී තිබුණේ වයඹ විශ්වවිද්‍යාලය විසින් එම පාඨමාලාව සඳහා විද්‍යාවේදී විශේෂ උපාධි පාඨමාලාවක් ආරම්භ කර නොතිබීමයි. මේ හේතුව මත විශ්වවිද්‍යාලය විසින් එම පීඨයේ 2011/2012 අධ්‍යයන වර්ෂයේ සිට විශේෂ විද්‍යාවේදී උපාධි පාඨමාලා 03 ක් ආරම්භ කර තිබුණි.

6. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විගණනයේදී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින්වර උපකුලපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) අයවැය
(ආ) පුස්තකාල පොත් හා සඟරා මිලදී ගැනීම
(ඇ) ඉදිකිරීම් කොන්ත්‍රාත්තු
(ඈ) අත්තිකාරම් ලබාදීම
(ඉ) බාහිර පාඨමාලා පැවැත්වීම
(ඊ) තොග පාලනය
(උ) කාර්ය මණ්ඩල
(ඌ) ප්‍රසම්පාදන ක්‍රියාවලිය

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)

**ශ්‍රී ලංකා වයඹ විශ්වවිද්‍යාලයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ 1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල පනතේ 108(1) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව.**

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.**

**2.2.1 විගණන විෂය පථය සීමා වීම.**

**(අ)** මෙම වත්කම් වලින් බොහොමයක් අයිතමවල මිලදීගත් වටිනාකම දෙපාර්තමේන්තු වට්ටෝරු භාණ්ඩ ලේඛනවල ඇතුලත්ව නොමැත. 2013.12.31 දිනට පවතින සියළුම වත්කම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රත්‍යාගණනය කරමින් පවතින බැවින් ඉදිරියේදී මෙම ගැටළුව විසඳා ගත හැකිය.

බාහිර පාඨමාලා සඳහා ප්‍රධාන ගබඩාවෙන් නිකුත්කර තිබූ ද්‍රව්‍ය වෙනුවෙන් ලැබිය යුතු රුː **252,542.00** ක මුදල **2014** වර්ෂයේදී ලබා දී ඇති අතර 2014 වර්ෂයේ සිට බාහිර පාඨමාලා වෙනුවෙන් නිකුත් කරන භාණ්ඩ සඳහා ලැබිය යුතු මුදල් "ලැබිය යුතු මුදල්" ලෙස ගිණුම්ගත කිරීම ආරම්භ කර ඇත.

**(ආ)** විවිධ ව්‍යාපෘති සහ බාහිර පාඨමාලා වෙනුවෙන් වෙනම ලෙජර් ගිණුම් පවත්වාගෙන යනු ලබන අතර මෙම මුදල් 2013 වර්ෂයේදී ලැබිය යුතු මුදල් ලෙස ගිණුම්ගත කර 2014 වර්ෂයේදී පියවාගෙන ඇත.

**(ඇ)** 2013.12.31 දිනට පවතින සියළුම වත්කම් රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව මගින් ප්‍රත්‍යාගණනය කරමින් පවතින බැවින් ඉදිරියේදී මෙම ගැටළුව විසඳා ගත හැකිය.

**(ඈ)** මේ වන විට පොලී ආදායම ලෙස ලැබී ඇති රුː **166,986.28** ක මුදල ගිණුම්ගත කිරීමට කටයුතු කර ඇත.

**2.2.2 පැහැදිලි නොකල වෙනස්කම්**

**2014** වර්ෂයට අදාල ක්ෂය කිරීම් රුː **120,963,189.00** ක් වුවද එම වර්ෂයේ විකුණන ලද වත්කම් වලට අදාලව හා පෙර වර්ෂවල ක්ෂය සම්බන්ධයෙන් කරන ලද ගැලපීම් වලට අනුව උපලේඛනයේ ක්ෂය ප්‍රමාණය රුː **119,689,250.00** ක් ලෙස දක්වා ඇත.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**(අ) පුස්තකාල පොත් සහ වාර සඟරා මිලදී ගැනීම සඳහා ලබා දුන් අත්තිකාරම් රුː 929,684.00**

**1996-2012** කාලය තුල ලබා දෙන ලද පුස්තකාල පොත් හා වාර සඟරා මිලදී ගැනීමට අදාල අත්තිකාරම් වලින් මේ වන විට රුː**720,167.13** ක මුදලක් හැර ඉතිරි මුදල් පියවීමට කටයුතු කර ඇත.

**කොන්ත්‍රාත් අත්තිකාරම් රුඃ 3,136,709.00**

මෙම අත්තිකාරම් මුදල් සේවයට අනුගත කිරීමේ අත්තිකාරම් (Mobilization Advance) ලෙස ගෙවා ඇති අතර බිල්පත් නිදහස් කිරීමේදී අයකර ගන්නා ප්‍රමාණයන් අනුව ගෙවා ඇති අත්තිකාරම් පියවා ගනු ලැබේ. ඒ අනුව **2014-12-31** දින වන විට ඉහත දක්වා ඇති මුදලින් රුඃ **650,501.32** ක මුදලක් පියවාගෙන ඇත.

**සේවා අත්තිකාරම් රුඃ 340,206.00**

මෙම සේවා අත්තිකාරම් සියල්ලම **2014-12-31** වන විට පියවා අවසන් කර ඇත.

**නිළධාරීන් 12 දෙනෙකුට ලබා දුන් රුඃ 200,551.00**

මෙම රුඃ 200,551.00 ක මුදල සෑදී ඇති ආකාරය පිළිබඳ තොරතුරු ලබා ගෙන අවශ්‍ය ගැලපීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ) ණයගැති ශේෂය රුඃ 74,545.00**

මෙම මුදලින් රුඃ 35,352.00 මුදලක් 2014-12-31 දින වන විට පියවා ඇත.

**ණයහිමි ශේෂය රුඃ 16,187.00**

මෙම මුදලින් රුඃ **5,000.00** මුදලක් **2014-12-31** දින වන විට පියවා ඇති අතර ඉතිරි මුදල් පිළිබඳව සොයා බලා අවශ්‍ය පියවර ගැනීමට කටයුතු කරනු ලැබේ.

**(ඇ)** **2013-12-31** දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂ තුල වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන මුදල වන රුඃ **3,220,517.78** කින් **2014-12-31** දින වන විට රුඃ **2,275,689.73** ක මුදලක් නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

**2.4 <u>නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම</u>.**

**(අ) විශ්වවිද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතන සංග්‍රහය 3 පරිච්ඡේදයේ 24.8 වගන්තිය**

විශ්වවිද්‍යාලයේ පීඨ හතර හා ඊට අමතරව ඇති ඉංග්‍රීසි අධ්‍යයන අංශය හා පරිගණක තොරතුරු අධ්‍යයන අංශවල අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යෑම සඳහා ස්ථිර අධ්‍යයන කාර්ය මණ්ඩලයේ තනතුරු පුරප්පාඩුවලට හා අනුමත තාවකාලික ප්‍රදර්ශක, කථිකාචාර්ය තනතුරුවලට අනුව ඒ ඒ අංශ සඳහා තාවකාලිකව අධ්‍යයන කාර්ය මණ්ඩලයක් බඳවාගෙන ඇත. විගණන විමසුමේ සඳහන් පරිදි තාවකාලික කථිකාචාර්යවරුන් 128 දෙනෙකු බඳවාගෙන නොමැති අතර තාවකාලිකව බඳවාගෙන ඇත්තේ තාවකාලික උපදේශක, ප්‍රදර්ශක ආදී තනතුරු සඳහාය. එම අයගේ සේවා කාලය වසර දෙක ඉක්මවා

බඳවාගෙන ඇත්තේ ද විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයේ තුන්වන පරිච්ඡේදයේ 24.9 වගන්තියේ සඳහන් පරිදිය.

**(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

**(i) මුදල් රෙගුලාසි 271 (2) (අ) (ආ)**

මෙම මුදලින් **2014-12-31** දින වන විට රුඃ **300,098.33** ක මුදලක් මේ වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

**(ii) මුදල් රෙගුලාසි 371 (2) (ආ)**

පාලක සභා තීරණ අංක **143.4.20** අනුව උපරිම මුදල රුඃ **20,000.00** කට සීමා කර ඇත. එහෙත් අත්‍යාවශ්‍ය අවස්ථා වලදී නොවැලැක්විය හැකි හේතූන් මත විශේෂ අනුමැතිය යටතේ මෙම සීමාව ඉක්මවා අත්තිකාරම් ලබා දීමට සිදු වේ.

**(iii) මුදල් රෙගුලාසි 396 (ඈ)**

මෙම මුදල **2014-12-31** දින වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

**(iv) මුදල් රෙගුලාසි 571 (2)**

මෙම මුදල **2014-12-31** දින වන විට නිරවුල් කිරීමට කටයුතු කර ඇත.

**(V) මුදල් රෙගුලාසි 1645 හ 1646**

2013 වර්ෂයට අදාල සියළුම ධාවන සටහන් මේ වන විට විගණනයට ඉදිරිපත් කර ඇත.

**(ඇ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.13 ඡේදය**

ධාවනයේදී සිදු කරන ලබන සුළු අළුත්වැඩියාවන් හැර අනෙකුත් අළුත්වැඩියාවන් (2014 අගෝස්තු මාසයෙන් පසුව) යාන්ත්‍රික ඉංජිනේරුගේ වාර්තා ලබා ගෙන සිදුකරනු ලබන බැව් කාරුණිකව දන්වමි.

**(ඇ) 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය හා අත්පොත**

**(i) 3.5 හා 9.3 මාර්ගෝපදේශ සහ ප්‍රසම්පාදන අත්පොතෙහි 2.14.1 ඡේදය හා මුදල් රෙගුලාසි 135**

විගණනය පෙන්වා දීමෙන් පසු වාහන අළුත්වැඩියාවන් සිදු කිරීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ උපදෙස් හා මුදල් රෙගුලාසි ප්‍රකාරව අදාල පරිදි අනුමැතීන්ට යටත්ව සිදු කරනු ලබන බැව් කාරුණිකව දන්වමි.

**(ii) ප්‍රසම්පාදන අත්පොතෙහි 8.13.4 ඡේදය හා 2012 අගෝස්තු 07 දිනැති අංක 2/2012 රාජ්‍ය මුදල් චක්‍රලේඛය**

ශුද්ධ විචලනය **10%** සීමාව තුල පවතින බැවින් උපකුලපතිතුමාගේ අනුමැතිය මත ගෙවීම් කර ඇත.

**(ඉ) 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන අයවැය චක්‍රලේඛය**

අළුතින් වාහන මිලදීගැනීමෙන් අනතුරුව කුලී වාහන ඉවත් කල යුතු වුව ද, විශේෂයෙන් කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨයේ හා පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ සිසුන්ගේ ක්ෂේත්‍ර චාරිකා, ප්‍රායෝගික පුහුණුවීම් සහ අධ්‍යයන කාර්යමණ්ඩල වැඩමුළු හා සම්මන්ත්‍රණ සඳහා විශාල වශයෙන් සහභාගි වීමට සිදුවන අතර ඒ සඳහා විශ්වවිද්‍යාලය සතු වාහන ප්‍රමාණවත් නොවේ. එබැවින් අදාළ පීඨ විසින් කරන ලද ඉල්ලීම් ද සැලකිල්ලට ගෙන, වාහන කුලී පදනමින් ලබාගැනීමට සිදු වී ඇති බැව් කාරුණිකව දන්වා සිටිමි.

**(ඊ) මහා භාණ්ඩාගාරයේ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ 2011 මාර්තු 10 දිනැති කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 44(03) (ආ) ඡේදය**

පිලිතුරු ලබා දීමට තරම් ප්‍රමාණවත් තොරතුරු සපයා නොමැත.

**03 <u>මූල්‍ය සමාලෝචනය</u>**

**3.1 <u>මූල්‍ය ප්‍රතිඵල</u>**

**3.2 <u>විග්‍රාහාත්මක මූල්‍ය සමාලෝචනය</u>**

**(අ) මූල්‍ය කාර්යසාධනය**

**(i)** පොලී ප්‍රතිශතය අඩුවීමද මේ සඳහා හේතු වූ අතර 2014 වර්ෂයේදී ජංගම ගිණුම්වල ඇති මුදල් කෙටිකාලීනව ආයෝජනය කර මුදල් උපයා ගන්නා ලදී.

**(ii)** පෙර වර්ෂයට සාපේක්ෂව බැලීමේදී මෙම වර්ෂය තුල විදේශ ගමන් වැඩිවීම, සේවක සංඛ්‍යාව වැඩිවීම, ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම හා වෙළඳපොළෙහි භාණ්ඩවල වටිනාකම වැඩිවීම හේතුවෙන් මෙසේ වියදම් අසාමාන්‍ය ලෙස වැඩිවී ඇත.

**(iii)** පෙර වර්ෂයට සාපේක්ෂව බැලීමේදී මෙම වර්ෂය තුල විදේශ ගමන් වැඩිවීම, සේවක සංඛ්‍යාව වැඩිවීම, ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීම හා වෙළඳපොළෙහි භාණ්ඩවල වටිනාකම වැඩිවීම හේතුවෙන් මෙසේ වියදම් අසාමාන්‍ය ලෙස වැඩිවී ඇත.

**(ආ) මූල්‍ය තත්වය**

**(i)** නිරීක්ෂණය සමග එකඟ වේ.

**(ii)** නිරීක්ෂණය සමග එකඟ වේ.

**(iii)** නිරීක්ෂණය සමග එකඟ වේ.

**3.3 ආයතනයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි**

එම වාරණ නියෝගයට එරෙහිව විරෝධතා විශ්වවිද්‍යාලය විසින් අධිකරණයට ඉදිරිපත් කර ඇත.

## 4. මෙහෙයුම් සමාලෝචනය

### 4.1 කාර්ය සාධනය

**(අ) (i) (ii)**

**පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

2013 වර්ෂයේ පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයේ ඒකක ශිෂ්‍ය පිරිවැය ඉහල අගයක් ගැනීමට පහත සඳහන් කරුණු හේතු විය.

- නව පාඨමාලා විෂය සංකලනයන් අන්තර්ගතව පීඨය තුල පාඨමාලා දෙකක් ක්‍රියාත්මක වන බැවින් ඒ සඳහා වැඩි වශයෙන් බාහිර කථිකාචාර්යවරුන්ගේ සහාය ලබා ගැනීමට අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කිරීමට සිදු වීම.
- පීඨය තුල අංග සම්පූර්ණ සත්ව ගොවිපලක් (පශු සම්පත්/කරදිය හා මිරදිය මත්ස්‍ය) නොමැති වීම නිසා ඉතා විශාල වශයෙන් ක්ෂේත්‍ර චාරිකා හා ක්ෂේත්‍ර ඉගැන්වීම් කටයුතු සිදුකල යුතු වීම හා එවැනි ක්ෂේත්‍ර චාරිකා ඉතා ඈත ප්‍රදේශවල දී සිදු කිරීමට ඇති බැවින් ඒ සඳහා වන ප්‍රවාහන පහසුකම් හා අනෙකුත් සියළු අවශ්‍යතාවයන් සඳහා අවස්ථානුකූලව මූල්‍ය ප්‍රතිපාදන විශාල වශයෙන් වෙන් කරවීමට සිදු වීම.
- රසායනාගාර මට්ටමේ ප්‍රායෝගික පුහුණුව සඳහා වන අධ්‍යයන කටයුතුවලට අවශ්‍ය රසායනික ද්‍රව්‍ය මිල අධික බැවින් ඒ සඳහා මුදල් ප්‍රතිපාදන යෙදවීම.
- අනෙකුත් පීඨවල මෙන් නොව මෙම පීඨයේ උපාධි පාඨමාලා දෙකෙහිම සියළුම විභාගයන්හි ලිඛිත හා ප්‍රායෝගික පරීක්ෂණ සඳහා වන ප්‍රශ්න පත්‍ර මුද්‍රණය සම්පූර්ණයෙන්ම පීඨය තුල සිදුකරනු ලබන අතර, ඒ සඳහා අවශ්‍ය වන ලිපි ද්‍රව්‍ය, මුද්‍රණ තීන්ත හා අනෙකුත් උපකරණ සහ නඩත්තු කටයුතු සඳහා සැලකිය යුතු පිරිවැයක් වෙන් කිරීමට සිදු වීම. මෙම ක්‍රියාවලිය සිදුවනුයේ අප පීඨයෙහි පමණි. තවද මුද්‍රණ කටයුතු සඳහා වන ගෙවීම්ද මෙකී පිරිවැයට අයත් වේ.

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

විද්‍යාවේදී කෘෂිකර්ම උපාධි පාඨමාලාව දේශන, විද්‍යාගාර පරීක්‍ෂණ, ව්‍යාපෘති, ක්‍ෂේත්‍ර පරීක්‍ෂණ, ක්‍ෂේත්‍ර චාරිකා, පර්යේෂණ ව්‍යාපෘති හා සේවස්ථ පුහුණුව (Inplant Training) අංශ වලින් සමන්විත

වන පාඨමාලාවකි. මේ නිසා ශිෂ්‍ය පිරිවැය සාපේක්ෂව ඉහළ අගයක් ගනී. මෙය සියළුම කෘෂිකර්ම පීඨවලට පොදු වූ කරුණකි.

එමෙන්ම 2014 වසර තුල නව කාර්ය මණ්ඩල බඳවා ගැනීමද, විද්‍යාගාර රසායන ද්‍රව්‍ය හා උපකරණ ඇතුළු සමස්ථ වියදම් සීග්‍රලෙස ඉහළ යෑම නිසා ද පීඨයේ සමස්ථ පිරිවැය ඉහළ යෑම තුලින් ඒකක ශිෂ්‍ය පිරිවැය වැඩිවීම සිදුවී ඇත.

## ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

2012 වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ (2013) වියදම ප්‍රතිශතයක් ලෙස 49% කින් වැඩි වීමට ස්ථිර ආචාර්ය මණ්ඩලයට 11 දෙනෙකු එකතු වීමත්, සියළුම ආචාර්යභවතුන්ගේ වැටුප් වැඩි වීමත් හේතු වී ඇත. 2012 වසරේදී ආචාර්ය මණ්ඩලය 24 ක් වූ අතර, 2013 දී ආචාර්ය මණ්ඩලය 35 ක් විය. එසේම ශිෂ්‍ය සංඛ්‍යාව 26% කින් වැඩි වී ඇත. (1042 සිට 1312 දක්වා)

මේ අනුව ඒක ශිෂ්‍ය පිරිවැය 19% කින් ඉහළ ගොස් ඇත.

## ව්‍යවහාරික විද්‍යා පීඨය

2012 වර්ෂයට සාපේක්ෂව 2013 වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය වැඩිවීමට පහත සඳහන් කරුණු බලපා ඇති අතර ඒ පිළිබඳව ඔබගේ අවධානය යොමු කරමි.

- අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩල සඳහා තාවකාලික සේවක මහත්ම මහත්මීන් බඳවා ගැනීම හා අධ්‍යයන කාර්ය මණ්ඩල වැටුප් ඉහල යාම.
- 2013 වර්ෂය තුල දී කාර්ය මණ්ඩල උසස්වීම් සිදු වීම හේතුවෙන් අධ්‍යයන හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයන්හි වැටුප් තල ඉහල යාම හා ඊට සමගාමීව විශ්වවිද්‍යාලය විසින් දරනු ලබන UPF, ETF, විශ්‍රාම වැටුප් දායක මුදල් ඉහල යාම සහ ජීවන වියදම් දීමනා හා අනෙකුත් දීමනාවන් ද ඉහල යාම.
- විද්‍යාගාර උපකරණ හා පරිගණක විද්‍යාගාර සඳහා පරිගණක මිලදී ගැනීම හා එම භාණ්ඩවල මිලගණන් වාර්ෂිකව ඉහල යාම.
- නවක සිසුන් සඳහා ලබා දෙන ශිෂ්‍ය අත්පොත් මුද්‍රණය කිරීම හා එම මුද්‍රණ වියදම් අධික වීම.
- සේවක කාර්ය මණ්ඩලයේ වෘත්තිය අභිවෘද්ධිය සඳහා ඔවුන් විවිධ අධ්‍යාපනික, සේවස්ථ වැඩමුළු සඳහා යොමු කිරීම.
- ශිෂ්‍ය සංඛ්‍යාව වැඩිවීමත් සමඟම ඔවුන්ට ගෙවනු ලබන මහපොල/ශිෂ්‍යාධාර මුදල් ප්‍රමාණයන් ඉහල යාම.
- ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන ක්‍රමය තුළ සිසුන් නොයෙකුත් අධ්‍යාපන වැඩසටහන් සඳහා යොමු කිරීම.

ඒ අනුව ඉහත කරුණු හේතුවෙන් 2013 වර්ෂයේ ඒක ශිෂ්‍ය පිරිවැය ඉහල ගොස් ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

**(ආ) විභාග පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම**

**(i)**

**<u>පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය</u>**

මෙම පීඨයෙහි, අධ්‍යයන වැඩසටහන ක්‍රියාත්මක වන්නේ අධ්‍යයන වර්ෂ වශයෙන් පදනම්ව බව සඳහන් කරන අතර ඒ අනුව 2013 අධ්‍යයන වර්ෂයේ සාමාසික දෙකෙහි විභාග පැවැත්වූ දින සහ ප්‍රතිඵල නිකුත් කිරීමට අදාල දිනයන් මතු සඳහන් පරිදි වේ.

| **විභාග පැවැත්වූ කාලසීමාව** | **විභාගය අවසන් වූ දිනය** | **කුලියාපිටිය විභාග අංශයට ලකුණු භාර දුන් දිනය** | **කුලියාපිටිය විභාග අංශයෙන් ප්‍රතිඵල නිකුත් කළ දිනය** | **විභාගය අවසන් වූ දින සිට ප්‍රතිඵල නිකුත් කිරීම සඳහා ගත වූ දින ගණන** |
|---|---|---|---|---|
| 2013 පෙබ./මාර්තු | 2013.03.20 | 2013.06.04 | 2013.07.19 | 76 |
| 2013 සැප්./ඔක්. | 2013.10.13 | 2013.12.20 | 2014.01.30 | 68 |

උක්ත විස්තර අනුව විගණන විමසීම් ලිපියේ ඉහත අනුමාතෘකාව යටතේ සඳහන් තොරතුරු නිවැරදි නොවන බව සඳහන් කරනු කැමැත්තෙමි.

**<u>ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය</u>**

වසර 2013 දී ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය තුල අධ්‍යයන ඛාණ්ඩ 4 ට අදාළ ශිෂ්‍ය ශිෂ්‍යාවන් 1523 ක් විභාගයට පෙනී සිටි අතර ප්‍රධාන විෂයන් 36 ක් සඳහා පිළිතුරුපත් පරීක්ෂා කිරීමට මාස 03 ක් ගත විය. දෙවනවර පරීක්ෂණය සඳහා මාස 02 ක් ගත විය. ලකුණු සකස් කිරීම සඳහා මාසයක් පමණ ගත විය. ඒ අනුව ප්‍රතිඵල නිකුත් කිරීමට මාස 06 ක් ගත විය. ඉදිරියේදී මෙම ක්‍රියාවලිය කඩිනම් කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

**(ii)**

**<u>ව්‍යවහාරික විද්‍යා පීඨය</u>**

2013 වර්ෂයේ B.Sc. Joint Major උපාධි පාඨමාලාව සඳහා සිසුන් 36 දෙනෙකු ලියාපදිංචි වී ඇති අතර ඉන් 32 දෙනෙකු උපාධිය සම්පූර්ණ කොට ඇත. අසමත් වූ ශිෂ්‍ය සංඛ්‍යාව සිව්දෙනෙකු වන අතර එසේ අසමත් වූ ශිෂ්‍යයන් සිව්දෙනාගෙන් දෙදෙනෙකු ඔවුන්ගේ සිව්වන වසරට අදාල ව්‍යාපෘති වාර්තා නිසි වේලාවට භාර නොදීම හේතුවෙන් උපාධිය සම්පූර්ණ කිරීමට අපොහසත් වී

ඇත. එසේ ව්‍යාපෘති වාර්තා නිසි වේලාවට භාර නොදීම විෂයයන් අසමත් වීමක් ලෙස සැලකිය නොහැකි කරුණකි. අනෙකුත් සිසුන් දෙදෙනා දෙවන වසර හා තෙවන වසරවල විෂයයන් 2 ක බැගින් අසමත්ව සිට, ඔවුන් පුනර් පරීක්ෂණ සඳහා එම වසරේදීම ඉදිරිපත් වී පසුව සමත් වී ඇත. ඒ අනුව ඔවුන් දෙදෙනා 2013 වර්ෂයේ පැවැති විභාගවලින් අසමත් වී නොමැති බව කාරුණිකව දන්වනු කැමැත්තෙමි. එහෙයින් උක්ත විගණන විමසුමින් දක්වා ඇති ප්‍රතිශතයන් නිරවද්‍ය නොවන බව කාරුණිකව දන්වා සිටිමි.

කෙසේ වෙතත් එම සිසුන් සිව්දෙනාම අදාල ව්‍යාපෘති වාර්තා නිසිලෙස භාරදීමෙන් හා විෂයයන් සමත් වීමෙන් උපාධි පාඨමාලාව සම්පූර්ණ කර ඇත. තවද ඔවුන් සිව්දෙනාම 2014 වර්ෂයේදී පැවැත්වූ උපාධි ප්‍රදානෝත්සවයට ද සහභාගී වූ බව වැඩිදුරටත් දන්වා සිටිමි.

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

මෙහි සඳහන් ප්‍රතිශතය ගණනය කිරීම පිළිබඳව පැහැදිලි නැත.

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

වසර 2013 දී උපාධිය සඳහා (සිව්වන වසර) ශිෂ්‍යයන් 212 ක් වාඩිවිය. ඉන් ඉතා සුළු පිරිසක් විභාගය අසමත් විය. එසේ අසමත් වූ පිරිස ඊළග වසරේදී සමත් විය.

**පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

මෙම පීඨය විසින් පවත්වන වාර්ෂික පරීක්ෂණ වලින් සමත්වීම සඳහා ලබාගත යුතු GPA අගය සහ ක්‍රෙඩිට් ප්‍රතිශතය යන කරුණු සළකා බලන අතර එම අවශ්‍යතා සපුරා නොමැති සිසුන් අසමත් සිසුන් සේ සැළකේ. තවද මෙහි විභාග ප්‍රශ්න පත්‍ර සකසනු ලබන්නේද මෙම පීඨයේ උපාධි පාඨමාලාවන්හි ප්‍රමිතියට ගැලපෙන අයුරිනි. එම නිසා විභාග වලින් අසමත් වීම යන කරුණු විශේෂ කරුණක් වශයෙන් සඳහන් කළ නොහැකි අතර එය සිසු දක්ෂතා මත පදනම් වේය යන්න අපගේ විශ්වාසයයි.

එහෙත් විගණන විමසීම් වලට බලපා ඇති අප විසින් ඉහතින් සඳහන් කොට ඇති සපුරාලිය යුතු අවශ්‍යතා වලින් බැහැර වෙනත් කරුණු ඇත්නම් ඒ පිළිබඳව අප දැනුවත් කලහොත් ඒ සඳහා යම් පැහැදිලි කිරීමක් කළ හැකි බව වැඩිදුරටත් සඳහන් කරනු කැමැත්තෙමි.

**(ඇ) ව්‍යවහාරික විද්‍යා පීඨය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව නිකුත් කරනු ලබන ශිෂ්‍ය අත්පොතට අනුව විශ්වවිද්‍යාල සඳහා පාඨමාලාව උසස් කර යැවීමේදී ශිෂ්‍යයා විසින් එම මාරුවීම් අනිවාර්යයෙන්ම බාර ගත යුතුය. එම හේතුවෙන් වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය සංඛ්‍යාව 52 ක් වී ඇත. 2012

වසරේ දී වෙනත් විශ්වවිද්‍යාලවලට මාරු වී ගිය ශිෂ්‍ය ප්‍රතිශතය 68% ක් වූ අතර එම තත්වය 2013 වර්ෂය වන විට 25% දක්වා අඩු වී ඇති බව ඉතා කාරුණිකව දන්වා සිටිමි.

2011/2012 අධ්‍යයන වර්ෂය සඳහා වරින්වර ශිෂ්‍ය නාමලේඛන ලැබීම නිසා සිසුන් බඳවා ගැනීම පමා වූ අතර අධ්‍යයන කටයුතු 2014.03.19 දින ආරම්භ කිරීමට නියමිතව තිබුණි. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවෙන් පුරප්පාඩු පිරවීම සඳහා ශිෂ්‍ය නාමලේඛන ලැබීමට සති 3 ක් 4 ක් ගත වන බැවින් සහ අනෙක් ශිෂ්‍යයන්ගේ අධ්‍යයන කාල සීමාවට ද (උදා : විභාග පැවැත්වීම ) එම ප්‍රමාදය වක්‍රව බලපාන බැවින් සහ අධ්‍යයන කටයුතු ඇරඹීමත් සමඟම අඛණ්ඩව ඇගයීම් සිදු කරන බැවින් පීඨ මණ්ඩල තීරණය පරිදි පුරප්පාඩු සඳහා නැවත සිසුන් බඳවා ගැනීම නතර කරන ලදී.

කෙසේ වෙතත් මේ පිළිබඳව නිරන්තරයෙන් ම විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව දැනුවත් කර ඇති අතර මෙම ගැටළු සහගත තත්වයට පිළියම් ලෙස 2014/2015 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 300 ක නම් ලැයිස්තුවක් ඉල්ලීමට කටයුතු කර ඇති අතර එමගින් අභ්‍යන්තර ස්ථාන මාරු කිරීම් සිදුකිරීමෙන් අනතුරුව සිසුන් 200 ක පමණ ප්‍රමාණයක් රඳවා ගැනීමට අපේක්ෂා කෙරේ.

## කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය

වෛද්‍ය, දන්ත වෛද්‍ය, අතුරු වෛද්‍ය සේවා ඇතුළු උපාධි පාඨමාලාව සාමාන්‍යයෙන් වැඩි ඉල්ලුමක් පවතින ක්ෂේත්‍රයක් වේ. සිසුන් විද්‍යා විෂය ධාරාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය සඳහා අයදුම් කිරීමේදී සාමාන්‍යයෙන් සෑම වරණයක් සඳහාම ඉල්ලුම් කරන බැවින් එහිදී උපාධි පාඨමාලා සඳහා තේරුණ විට මෙම පීඨයේ ලියාපදිංචි වී සිටියද එය ඇතහැර ඉහත පාඨමාලා සඳහා යෑම සාමාන්‍ය පිළිවෙත වේ. මෙය අප පාලනයෙන් බැහැර වූ තත්වයකි. ඒ කෙසේ වුවද පීඨයට පහසුකම් ඇති ප්‍රමාණයට සිසුන් බඳවා ගැනීමට පීඨය කටයුතු කර ඇත.

## ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය

වසර 2013 සඳහා බඳවා ගැනීමට නියමිතව සිටි ශිෂ්‍ය සංඛ්‍යාව 350 කි. එහෙත් Z අගය නැවත පුනරීක්ෂණය කිරීම නිසා වැඩිපුර ශිෂ්‍යයින් 161 දෙනෙකු බඳවා ගැණුනි. එහෙත් එයින් විශ්වවිද්‍යාලාන්තර ශිෂ්‍ය මාරුකිරීමේ පදනම මත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ශිෂ්‍යයින් 26 දෙනකු මාරු කරනු ලැබීය. එබැවින් එය සම්පත් කෙරෙහි බලපෑමක් ඇති නොකරයි. එසේම එම තීරණ පීඨය විසින් ගනු ලබන තීරණ නොවන බව සඳහන් කරමි.

## පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය

ආරම්භයේදී මෙම පීඨයේ උපාධි පාඨමාලාවන් සඳහා ලියාපදිංචි වූ සිසුන් හට, පසුව වෙනත් උපාධි පාඨමාලාවලට ඇතුළුවීමට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් අවස්ථාව ලබාදීමත්, ඒ බව සෑපුවම සිසුන් වෙත දැනුම්දීමත් ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සිදුකරනු

ලබයි. පීඨවල මෙසේ ඇතිවන පුරප්පාඩු පිරවීම ද කොමිෂන් සභාව යටතේ සිදුවේ. මෙම ක්‍රියාවලිය විශ්වවිද්‍යාලයට පාලනය කළ නොහැක.

**(ඈ)**

**<u>ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය</u>**

වසර 2013 සඳහා අනුමත ආචාර්ය මණ්ඩලය බඳවාගෙන ඇති අතර 2014 කාර්යමණ්ඩල ඉල්ලීම් අනුමත වූ පසු මෙම අනුපාතය අඩුවනු ඇතැයි අපේක්ෂා කරමි.

**<u>කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය</u>**

පීඨයේ අනුමත අධ්‍යයන තනතුරු බඳවා ගැනීම සඳහා කටයුතු කර ඇත. ඒ අනුව ඉදිරි වර්ෂවලදී මෙම අනුපාතය සාමාන්‍ය මට්ටමකට පැමිණෙනු ඇත.

**4.2 <u>කළමනාකරණ ආකාර්යක්ෂමතා</u>**

**(අ)** එච්.පී.වී. රූපසිංහ මහතාගෙන් අය වීමට ඇති මුදල අය කර ගැනීමට ඔහුට විරුද්ධව විශ්වවිද්‍යාලය මඟින් පවරා ඇති නඩුව තවදුරටත් පවත්වාගෙන යාමට අවශ්‍ය උපදෙස් ලබා දෙන ලෙස නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා ඇත. ආර්.එම්.ඩබ්.එස්. රත්නායක මහතාගෙන් අයවීමට ඇති මුදල ගෙවීමට කටයුතු කරන ලෙස ඔහුටත් ඇපකරුවන්ටත් නැවත දැනුම් දී ඇත.

**(ආ)** අත්සන් ලේඛනවල අත්සන් නොයොදා තිබීම දෝෂයක් ලෙස පිළිගන්නා අතර, එවැනි දෝෂ මග හැර කටයුතු කිරීමට උපදෙස් දී ඇත. තවද, ඉදිරියේ දී ශිෂ්‍ය නාමලේඛන නිසි පරිදි පවත්වාගෙන යාමට අවශ්‍ය පියවර ගෙන ඇති බව දැනුම් දෙමි.

**(ඇ)** විශ්වවිද්‍යාලය ඡායාපිටපත් යන්ත්‍ර සේවා කිරීම්වලට අදාලව කාලානුරූපීව ගිවිසුම්ගත වන අතර ගිවසුම් ප්‍රකාරව සේවාවන් සිදුකර ගැනීම සම්බන්ධයෙන් අංශ ප්‍රධානීන් දැනුවත් කරන ලදී.

**(ඈ)** මෙම තැන්පතු Call Deposit ලෙස තැන්පත් කර තිබූ අතර මෙම ආයෝජනයෙන් ලද පොලිය මේ වන විට ගිණුම්ගත කර ඇත. 2014 වර්ෂයේ මෙම ස්ථාවර තැන්පතු හතරම පොලිය ද සමග එවකට පැවති පොළී අනුපාතය මත නැවත ආයෝජනය කර ඇත.

**(ඉ)** එක් එක් අධ්‍යයන වර්ෂයේ නේවාසිකාගාර අවශ්‍යතාව, අභ්‍යන්තර නේවාසිකාගාර මගින් සම්පූර්ණ කළ නොහැකි වූ විට ඒ සඳහා බාහිර නිවාස හෝ ගොඩනැගිලි බදු පදනම මත ලබා ගැනීමට කටයුතු කෙරේ. අධ්‍යයන කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යා යුතු බැවින් කඩිනමින් නේවාසිකාගාර පහසුකම් ලබා දිය යුතු වේ. එබැවින් ඒ සඳහා

විශ්වවිද්‍යාල පනත මගින් පාලක සභාව වෙත සළසා ඇති බලතල අනුව කටයුතු කරනු ලැබේ.

2013 වර්ෂයේ පිරිමි සිසුන් සඳහා ලබාගෙන ඇති කාරියවසම් නේවාසිකාගාරය සිසුන් 150 ක් සඳහා ලබාගත්ත ද, 2013 වර්ෂයේ දී සිසුන් 60 ක් පමණක් සිටින බව ඔබ විසින් දක්වා ඇත. අප විසින් නේවාසිකාගාර ලබා ගැනීමේදී නේවාසික පහසුකම් සඳහා සුදුසුකම් ලත් සිසුන් ප්‍රමාණය ඉතා ඉහළ මට්ටමක පැවති අතර සුදුසුකම් ලැබූ සිසුන් 125 දෙනෙක් ලියාපදිංචි කිරීම සඳහා කටයුතු කළ ද සිසුන් නේවාසිකාගාර සඳහා ලියාපදිංචිවීමේ ප්‍රතිශතය අඩු මට්ටමක පැවතුණි.

**4.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

බාහිර කථිකාචාර්යවරුන් වෙත පවරා තිබූ නියමිත දේශන සියල්ල සම්පූර්ණ කර ඇති බව මෙයින් අවධාරණය කරමි. මෙය සටහන් කිරීමේ අඩුපාඩුවක් පමණි.

**4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

මෙම එළිමහන් රඟහල ඉදිකිරීමට තීරණය කළ අවස්ථාවේ ලැබෙන ප්‍රතිපාදනවල හිඟකම නිසා අවශ්‍යතාවය යන්තම් පිරිමැසෙන ලෙස පළමු අදියර පමණක් ඉදිකර භාවිතයට ගෙන පසුව ප්‍රතිපාදන ඇති අවධියක ඉතිරි ඉදිකිරීම් සම්පූර්ණ කිරීමට තීරණය කර තිබුණි. එහෙත් පළමු අදියර නිමාවෙත්ම සිසුන්ගේ දැඩි ඉල්ලීම පරිදි දෙවන අදියරක් ලෙස රාත්‍රී දර්ශන සඳහා විදුලි පද්ධතියක් ඉදිකිරීමට සිදුවිය.

මෙම රඟහලේ ධාරිතාවය ළමුන් 550 කට සීමා වී තිබූ අතර සිසුන්ගේ අදහස වූයේ මෙහි ධාරිතාවය අවම වශයෙන් සිසුන් 1000 ක් පමණ විය යුතු බවයි. ඒ අනුව මෙහි ධාරිතාවය වැඩි කිරීමේ අදහසින් හා ඉතිරි වැඩ කොටස් නිම කිරීමේ අවශ්‍යතාවය මත තෙවන අදියරක් ලෙස රු. 995,000/- ක ඉංජිනේරු ඇස්තමේන්තුවක් ඉදිරිපත්කොට රඟහලේ මූලික, ප්‍රධාන වැඩ කොටස් නිම කරන ලදී.

**4.5 ද්‍රව්‍ය අක්‍රමිකතා**

**(අ)** මෙහි සඳහන් පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨයට අනුයුක්ත ආචාර්යවරුන් දෙදෙනා වෙත පර්යේෂණ දීමනා වශයෙන් රු.176,504 ක් හා රු.191,672 ක් ගෙවා ඇත්තේ පර්යේෂණ දීමනා ගෙවීම සම්බන්ධයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛ උපදෙස් පරිදිය. **(ඇමුණුම 01, 02)**

**4.6 හඳුනාගත් අලාභ**

මෙම විශ්වවිද්‍යාලය ප්‍රාදේශියව පිහිටි විශ්වවිද්‍යාලයක් වන බැවින් එහි සේවය කරනු ලබන සේවක මහත්ම මහත්මීන් සේවයට පැමිණෙන්නේ ඉතා දුර බැහැර ප්‍රදේශවලිනි. ලංකාවේ අනිකුත්

දුර බැහැර ප්‍රදේශවල පිහිටි විශ්වවිද්‍යාල තුල එම විශ්වවිද්‍යාල සතු නිවාස ඇති නමුත් වයඹ විශ්වවිද්‍යාලයට එවැනි පහසුකම් ඉතා සීමිතය. ඒ අනුව ගෙවල් කුලියට ගෙන හෝ නේවාසික පහසුකම් සැපයිය යුතුව ඇත. එසේ නොකලහොත් කාර්යමණ්ඩල රඳවා ගැනීම ඉතා අපහසුය. ඒ අනුව ඔවුන්ගේ ක්‍රය ශක්තිය ද සලකා බලා සාධාරණ කුලියකට නේවාසික පහසුකම් ලබා දීම සිදුකර ඇත.

**4.7 <u>ආර්ථික නොවූ ගනුදෙනු</u>**

**(අ)** කුලියාපිටිය පරිශ්‍රය සඳහා ශිෂ්‍ය නේවාසිකාගාර කුලියට ලබා ගැනීමේදී, තක්සේරු දෙපාර්තමේන්තුව මඟින් අදාල නිවාස/ගොඩනැගිලි සඳහා ලබාගත් තක්සේරු වාර්තා වලට අනුකූල වනසේ ටෙන්ඩර්කරුවන් ඉදිරිපත් කර තිබූ මිලගණන් අඩුකර ගැනීමට උත්සාහ ගත් අතර ඉදිරිපත් කර තිබූ ටෙන්ඩර් වටිනාකමින් යම් ප්‍රමාණයක් අඩුකර ගැනීමට ටෙන්ඩර් කමිටුව සමත් වූ නමුත් අනුමත තක්සේරු වටිනාකම දක්වා මිල අඩු කිරීමට අදාල පාර්ශව විසින් එකඟ නොවීය. අදාල පාර්ශව සමඟ එකඟ වූ නිවාස කුලිය පාලක සභාවේ අනුමැතිය මත ගෙවීමට කටයුතු කර ඇත. **(ඇමුණුම 03)**

**(ආ)** 2013 වර්ෂය සඳහා කුලී පදනම මත ලබා ගත් ශිෂ්‍ය නේවාසිකාගාර සඳහා මාසික කුලී පදනම මත හා වාර්ෂික කුලී පදනම මත තක්සේරු වටිනාකම් ලබාගෙන තිබූ අතර බදු මුදල් ගෙවීමේදී වාර්ෂික තක්සේරු වටිනාකම මත ගණන් බලා අදාළ ගෙවීම් කර ඇත.

2013/2015 වර්ෂ සඳහා කාර්යමණ්ඩල නේවාසිකාගාර කුලියට ගැනීමේදී වාර්ෂික කුලී පදනම මත කටයුතු කර ඇති බැව් කාරුණිකව දන්වමි.

**4.8 <u>කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු</u>**

**(අ) <u>මාකඳුර පරිශ්‍රයේ අවිවාහක අධ්‍යයන කාර්ය මණ්ඩල නේවාසිකාගාරය ඉදිකිරීම.</u>**

**(i)** මෙම කොන්ත්‍රාත්තුව සඳහා කල් දිගුව 2013 මාර්තු 12 දක්වා ලබා දීමට රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, විශ්වවිද්‍යාලය සහ කොන්ත්‍රාත්කරු යන අය සහභාගි වන ප්‍රගති සමාලෝචන රැස්වීමේදී නිර්දේශ වුන අතර ඒ අනුව 2013 මාර්තු 12 දින වැඩ අවසන් කර වැඩ අවසන් වාර්තා ඉදිරිපත් කර ඇත. කොන්ත්‍රාත්කරු එම කල් දිගුව සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත ලිඛිතව ඉල්ලීම් කල යුතු අතර ඔහු ඒ සඳහා ඉල්ලීම් කර ඇත්තේ 2013 නොවැම්බර් මාසය දක්වා කල් ගත කිරීමෙන් පසුය. එම කල් දිගුව සඳහා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාවේ නිර්දේශය 2014 ජුනි මස විශ්වවිද්‍යාලයට ලැබී ඇති අතර 2014 ජුනි 26 දින උපකුලපතිතුමා විසින් අනුමත කර ඇත.

**(ii)** On Account Payment ලෙස ගෙවීමේ දී කොන්ත්‍රාත්කරු ඉදිරිපත් කරන බිලේ සඳහන් වන ඇස්තමේන්තුගත කාර්ය වටිනාකමින් යම් ප්‍රතිශතයක් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව නිර්දේශ කරනු ලබන අතර එම මිණුම් වාර්තා අපවෙත ඉදිරිපත් නොකෙරේ.

**(iii)** ගිවිසුමේ Contract data හි 47.1 ට අනුව ගිවිසුම මිල විචලනයට යටත් බව දක්වා ඇත. එය ගණනය කරන ආකාරය ගිවිසුමේ කොන්දේසි 47 හි දක්වා ඇත. **(ඇමුණුම 04)**

පස්වන අන්තර් ගෙවීමේදී රු. 1,755,679.37 ක විචලන ආඥාවකට අනුමැතිය ලබා ගෙන ගෙවීම් සිදු කර ඇති අතර 06 වන අන්තර් ගෙවීම (රු. 1,785,119.00) On Account Payment ලෙස ගෙවා ඇත. ඊළඟ ගෙවීම සිදු කිරීමේදී 06 වන අන්තර් ගෙවීමට අදාලව අමතරව සිදු කර ඇති රු. 29,439.63 සඳහා අනුමැතිය ලබා ගෙන ගෙවීම් කිරීමට කටයුතු කරනු ලැබේ.

**(ආ) කෙරීගෙන යන වැඩ**

- **Garbage System**
- **Car Park - FBSF**

මෙම කාර්යයන්හි වැඩ කටයුතු විශ්වවිද්‍යාලය මඟින් අදාල අමුද්‍රව්‍ය යොදවා විශ්වවිද්‍යාලයේ ශ්‍රමිකයින් මඟින් කරගෙන යන ලද නමුත් එම කාලපරිච්ඡේදය තුල විශ්වවිද්‍යාලයේ පැවති වෙනත් අත්‍යාවශ්‍ය නඩත්තු කටයුතු සඳහා ප්‍රමුඛතාවය ලබා දීමට සිදු වී තිබුණි. කෙසේ වෙතත් දැනට එම කටයුතු නිම කරමින් පවතී.

- **Partition of Applied Nutrition Dept.**
- **Computer Laboratory FBSF**

මෙම ව්‍යාපෘතිවලට අදාලව අවසන් බිල්පත් ඉදිරිපත් කර ඇත්තේ 2014 වර්ෂයේදීය.

- **Water Supply for Proposed Nano Technology Institute at Waikkala**

මෙම ව්‍යාපෘතියට අදාලව වැඩ අවසන් කර නොමැති බැවින් කෙරීගෙන යන වැඩ ගිණුමේ දක්වා ඇත.

### 4.9 කාර්ය මණ්ඩල පරිපාලනය

**(අ)** අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් මඟින් අයදුම්පත් කැඳවන ලදී. ඒ අනුව මේ වන විට කථිකාචාර්යවරුන් 11 දෙනෙකු බඳවාගෙන ඇත. ඉදිරියේ දී තවත් අධ්‍යයන අංශ කිහිපයකම කථිකාචාර්යවරුන් බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමට කටයුතු කරමින් පවතී. ඒ අනුව පුරප්පාඩු ප්‍රමාණය අවම වනු ඇත. 2013 වර්ෂයේ බාහිර දේශකයින් 44 දෙනෙකු බඳවාගෙන ඇත්තේ එක් එක් අධ්‍යයන අංශවල සමහර විෂයන් සඳහා විශේෂ නිපුණතාවයක්/ පළපුරුද්දක් ඇති කථිකාචාර්යවරුන්

නොමැති වීම නිසාය. කෙසේ වෙතත් පුරප්පාඩු පිරවීම නිසා ඉදිරියේ දී බාහිර දේශකයින් බඳවා ගැනීම අවම වන බව සඳහන් කළ හැකිය.

**(ආ)** 2013 වර්ෂය සඳහා අනුමත කම්කරු සේවක සංඛ්‍යාව මේ වන විට බඳවා ගෙන ඇති අතර එම බඳවා ගැනීම්වලට අනුව පෞද්ගලික ශ්‍රම සැපයුම් සේවාව යටතේ සේවයේ යොදවා සිටි සේවක සංඛ්‍යාව 27 සිට 13 දක්වා අඩු කරන ලදී.

එහෙත්, 2014 වර්ෂයේ දැයට කිරුළ ජාතික සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව ඇති වූ ඉදිකිරීම් නඩත්තු කිරීමට හා නඩත්තු අංශයේ වෙනත් අත්‍යාවශ්‍ය සේවාවන් ඉටු කර ගැනීම සඳහා පාලක සභා අනුමැතියට යටත්ව පෞද්ගලික ශ්‍රම සැපයුම් ආයතනයේ සේවාව තවදුරටත් ලබා ගනිමින් සිටී. **(ඇමුණුම 05)**

ඒ අනුව, වයඹ විශ්වවිද්‍යාලය සඳහා 2014 වර්ෂයට අදාලව ඉල්ලීම් කරන ලද කම්කරු සේවක සංඛ්‍යාව කළමණාකරන සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත වන තෙක් අත්‍යාවශ්‍ය රාජකාරි සඳහා පෞද්ගලික ශ්‍රම සේවාව යටතේ සේවකයන් යොදවා ඇති බැව් කාරුණිකව දන්වා සිටිමි.

**(ඇ)** 2013 වර්ෂයේ අනුමත සේවක සංඛ්‍යා ලේඛනයට අනුව ලිපිකරු හා සමාන්තර ශ්‍රේණි සහ සුළු සේවකයින්ගේ අනුමත සංඛ්‍යාව 360 ක් වූ අතර සත්‍ය වශයෙන්ම සේවයේ නියුතු වූ සංඛ්‍යාව 2013.12.31 දිනට 316 කි. ඒ අනුව, 2013 වසර අවසන් වන විට තනතුරු පුරප්පාඩු 44 ක් පැවතුණි.

2014 වර්ෂයේ කුලියාපිටිය පරිශ්‍රයේ පැවති දැයට කිරුළ ජාතික සංවර්ධන ව්‍යාපෘතියට සමගාමීව විශ්වවිද්‍යාලයේ විවිධ අංශ මඟින් ඉතා හදිසියේ ඉටු කළ යුතු රාජකාරි කොටස් රාශියක් තිබුණි. තවද, 2013 අධ්‍යයන වර්ෂය සඳහා අතිරේක වශයෙන් සිසුන් ප්‍රමාණයක් බඳවා ගැනීමට සිදු වීම හේතුවෙන් ද විවිධ අංශවල අතිරේක හදිසි රාජකාරි ප්‍රමාණයක් නිර්මාණය විය. එබැවින්, මෙම අතිරේක රාජකාරි කොටස් ඉටු කරවා ගැනීම සඳහා එම කාර්යයන් අවසන් වන තුරු පමණක් කාර්යය පැවරුම් පදනම මත ලිපිකරුවන් පස් දෙනෙකු බඳවා ගැනීමට සිදු විය.

අදාල රාජකාරී කටයුතු මේ වන විට අවසන්ව ඇති බැවින් ඉහත සේවක භවතුන්ගේ සේවය අවසන් කර ඇත.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 සංයුක්ත සැලැස්ම**

**(අ)**

**ඉලක්ක 02 - අරමුණු 01**

**එක් පීඨයකට එකක් බැගින් දෙපාර්තමේන්තු සංඛ්‍යාව වැඩි කිරීම.**

**වෘවහාරික විද්‍යා පීඨය**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් තාක්ෂණික විෂය ධාරාව හදාරන සිසුන් සඳහා හඳුන්වා දීමට යෝජනා කර ඇති උපාධි පාඨමාලාවන් සඳහා ව්‍යවහාරිකවිද්‍යා පීඨය මඟින් ද තාක්ෂණික විද්‍යා උපාධියක් ලබා දීම සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති අතර එම පාඨමාලාව සඳහා වෙනම දෙපාර්තමේන්තුවක් අත්‍යාවශ්‍ය වන බැවින් ඒ සඳහා යෝජනා ඉදිරිපත් කර ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ පීඨය**

මෙම පීඨය මේ වන විට විද්‍යාවේදී ජෛව පද්ධති තාක්ෂණය පිළිබඳ උපාධි පාඨමාලාව පිරිනැමීම සඳහා සියළු කටයුතු සූදානම් කරගෙන යන අතර ඒ සඳහා නව දෙපාර්තමේන්තුවක් ස්ථාපිත කිරීමට ද විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමැතිය ලැබී ඇත. මෙම උපාධි පාඨමාලාවේ අධ්‍යයන කටයුතු 2016 වර්ෂය වන විට ඇරඹීමට අදහස් කරන අතර ඒ වන විට සංයුක්ත සැලැස්මේ ඉහත සඳහන් ඉලක්ක සපිරෙනු ඇත.

**ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨය**

සංයුක්ත සැලැස්මක සියළුම ඉලක්ක ඉටු කර ගත නොහැකි වන අතර, පීඨයකට දෙපාර්තමේන්තුව බැගින් එකතු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය වෙමින් පවතී. එය තරමක් කල්ගත වන කාර්යයකි.

ඒ අනුව, ව්‍යාපාර අධ්‍යයන හා මූල්‍ය පීඨයට මානව සම්පත් කළමනාකරන අධ්‍යයන දෙපාර්තමේන්තුව සහ අලෙවි කළමනාකරන අධ්‍යයන දෙපාර්තමේන්තුව එකතු කිරීමට අවශ්‍ය මූලික කටයුතු සම්පාදනය වෙමින් පවතින බව මෙහිලා සඳහන් කරමි.

**පශු සම්පත්, ධීවර හා පෝෂණ පීඨය**

මෙම පීඨයේ දැනටමත් ජෛව සංඛ්‍යානය සහ ශෂ්‍ය විද්‍යා ඒකකයක් පිහිටුවා ඇති අතර පීඨයේ උපාධි පාඨමාලා දෙකට අදාල පොදු විෂයමාලාවන් මේ තුලින් කරගෙන යනු ලැබේ.

එසේම 2013-2017 සංයුක්ත සැලැස්මෙහි ද ඉලක්ක 2 හා අරමුණු 1 යටතේ ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම සඳහා අලුත් දෙපාර්තමේන්තු, ඒකක, විශේෂිත ක්ෂේත්‍රයන් ඇතිකරන බව දක්වා ඇත.

**ඉලක්ක 02 - අරමුණු 02**

**(1) - තොරතුරු තාක්ෂණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරිකවිද්‍යා පීඨය**

උක්ත පාඨමාලාවේ විෂය මාලාව හා අයවැය ඇස්තමේන්තු 2014.03.27 වන දින පැවති 113 වන පීඨ මණ්ඩල රැස්වීමෙන් නිර්දේශ කිරීමෙන් අනතුරුව පාලක සභා අනුමැතියට ඉදිරිපත් කර එහි අනුමැතිය ලැබී ඇත.

ඒ අනුව, එම පාඨමාලාව සඳහා අවශ්‍ය අනෙකුත් යටිතල පහසුකම් සියල්ල සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මෙම වර්ෂයේදී හඳුන්වා දීමට නියමිතව ඇති බව කාරුණිකව දන්වා සිටිමි.

**(2) - ඉලෙක්ට්‍රොනික පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරික විද්‍යා පීඨය**

**(3) - කාර්මික කළමනාකරණ පාඨමාලාවක් හඳුන්වා දීම - ව්‍යවහාරිකවිද්‍යා පීඨය**

ඉලෙක්ට්‍රොනික විද්‍යා හා කර්මාන්ත කළමනාකරණ විශේෂවේදී උපාධි පාඨමාලාවන් ව්‍යවහාරිකවිද්‍යා පීඨය මගින් මේ වන විට ආරම්භ කර ඇත.

**ඉලක්ක 03 - අරමුණු 04**

**1. ඉංජිනේරු සහ වෛද්‍ය පීඨයන් ආරම්භ කිරීම.**

**2. පශ්චාත් උපාධි අධ්‍යයන පීඨයක් ආරම්භ කිරීම.**

විශ්වවිද්‍යාලයට පීඨයක් ආරම්භ කිරීමට ප්‍රථම ඒ සඳහා අවශ්‍ය ඉඩම්, භෞතික සම්පත්, මානව සම්පත් පහසුවෙන් ලබා ගත හැකි ස්ථානයක් තෝරා ගත යුතු අතර මුදල් ප්‍රතිපාදන ලබා ගත හැකි ආකාරය ද සලකා බැලිය යුතුව ඇත. රජයෙන් මුදල් ප්‍රතිපාදන ලැබෙන ආකාරය අනුව ඉලක්කගත අරමුණු ඉටු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට සිදුව ඇත.

ඉංජිනේරු පීඨයක් සහ වෛද්‍ය පීඨයක් ආරම්භ කිරීමට සංයුක්ත සැලැස්මෙහි ඇතුලත්ව ඇතත් ඒ සඳහා සුදුසු භූමි භාගයක් මේ දක්වා ලැබී නොමැත. වයික්කාල ප්‍රදේශයෙන් ඉඩමක් විශ්වවිද්‍යාලයට ලබා දී ඇති නමුත් එය කිසිසේත් ඉංජිනේරු පීඨයක් ආරම්භ කිරීමට ප්‍රමාණවත් සහ සුදුසු භූමි භාගයක් නොවේ. වෛද්‍ය පීඨයක් ස්ථාපිත කිරිම සඳහා දැනට අමාත්‍යාංශ මට්ටමින් සාකච්ජා කෙරෙමින් පවතී.

**3. අතිරේක අධ්‍යයන දෙපාර්තමේන්තු ආරම්භ කිරීම.**

මූල්‍ය හා මානව සම්පත් මෙන්ම යටිතල පහසුකම් වර්ධනය වීමක් සිදු වී නොමැති බැවින්, අතිරේක අධ්‍යයන දෙපාර්තමේන්තු ඇති කිරීම සීමා වී ඇතත් 2014 වර්ෂයේ සිට විශේෂ උපාධි පාඨමාලා සඳහා සිසුන් ඇතුලත් කර ගෙන ඇත. (ව්‍යවහාරිකවිද්‍යා පීඨය) තවද, 2016 වර්ෂයේ සිට තාක්ෂණික විෂයධාරාව තුලින් ඇතුලත් වන සිසුන් සඳහා අධ්‍යයන අංශ 2 ක් පිහිටුවීමට කටයුතු කර ගෙන යනු ලැබේ. (කෘෂි විද්‍යා පීඨය)

(ආ)

**ක්‍රියාකාරකම 02 - ගාස්තු අයකර ගන්නා පාඨමාලා සඳහා දේශීය හා විදේශීය සිසුන් බඳවා ගැනීම.**

ගාස්තු අයකර ගන්නා පාඨමාලා 15 ක් පමණ දැනටමත් ක්‍රියාත්මක වෙමින් පවතී. විදේශිය සිසුන් බඳවා ගැනීමට ප්‍රමාණවත් පහසුකම් වර්ධනය වී නොමැත.

**ක්‍රියාකාරකම 03 - කාර්ය මණ්ඩලයේ විශේෂඥ ඥාණය බාහිර සමාජය වෙත ලබාදීම.**

අධ්‍යයන කාර්ය මණ්ඩලය විසින් විවිධ ප්‍රදේශවල අ.පො.ස. උසස් පෙළ හදාරන සිසුන් සඳහා එක් එක් අධ්‍යයනාංශ මට්ටමින් විවිධ සම්මන්ත්‍රණ, උපදේශන, වැඩමුළු පවත්වනු ලබන අතර ඒ සඳහා විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රතිපාදන අවශ්‍ය නොවන බව කාරුණිකව දන්වා සිටිමි.

මීට අමතරව කළමනාකරුවන් පුහුණු කිරීමේ වැඩමුළු රාශියක් ද වාණිජ බැංකු, රක්ෂණ සමාගම් ඇතුළුව තවත් වාණිජමය ආයතන සඳහා පවත්වනු ලැබේ. එසේම විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරුන් කිහිපදෙනෙක් නිවාඩු ලබා වෙනත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල සේවය කරමින් විශේෂඥ ඥානය බාහිර සමාජය වෙත ලබා දීම සිදුකරනු ලබයි.

**5.2 <u>ක්‍රියාකාරී සැලැස්ම</u>**

**(අ)** 2013 - 2017 සඳහා සකස්කල සංයුක්ත සැලැස්මෙහි එම කාලපරිච්ඡේදය සඳහා සකස්කල විශ්වවිද්‍යාලයේ ක්‍රියාකාරී සැලැස්ම ඇතුලත් වේ.

**(ආ) <u>ක්‍රියාකාරී සැලැස්මට අනුව කටයුතු කිරීම.</u>**

**(i)** 2013 වර්ෂය සඳහා වැඩ සැලැස්මක් පැවතිණි. **(ඇමුණුම 06)** සැලසුම් කරන ලද සියළුම කාර්යයන් සඳහා සේවා අවශ්‍යතා ඉල්ලුම්කරන ලද අංශ වලින්, වැඩ ඉංජිනේරු මගින් ප්‍රමාණ පත්‍ර නොලැබීම නිසා සැලසුම් කරන ලද කාර්යයන්ගෙන් 64% පමණක් සිදුවිය.

**(ii)**

**(i) ව්‍යවහාරික විද්‍යා පීඨ ගොඩනැගිල්ල පියවර ii ඉදිකිරීම**

2013 වර්ෂය සඳහා මුදල් ඉල්ලීම් කර ඇත්තේ අවසාන බිල ගෙවීම සඳහා පුරෝකතනයක් ලෙසිනි. නමුත් රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් අවසන් බිල්පත් නිර්දේශකර එවා නොතිබූ බැවින් ප්‍රතිපාදන ඉතිරියක් වාර්තා වේ.

**(ii) ධීවර හා පශු පෝෂණ විද්‍යා පීඨ ගොඩනැගිල්ලේ පියවර ii ඉදිකිරීම**

බිල්පත් ගෙවීම සඳහා ප්‍රතිපාදන ලෙස මුලදී අයදුම්කර වෙන්කර තිබුනේ මිලියන 2 ක් පමණි. කෙසේ වුවද නිර්දේශිත බිල්පත් ගෙවියයුතු බැවින් වෙනත් කාර්යයක් සඳහා වෙන්කර තිබූ ප්‍රතිපාදන මෙම ව්‍යාපෘතිය සඳහා මාරු කිරීම මඟින් ගෙවීම් සිදුකරන ලදී.

**(iii), (iv), (vi), (ix)**

**කෘෂිකර්ම හා වැවිලි කළමනාකරණ ගොඩනැගිල්ල පීඨ පියවර i ඉදිකිරීම**

**ව්‍යාපාර පරිපාලන හා මූල්‍ය පීඨ ගොඩනැගිල්ල පියවර i ඉදිකිරීම**

**සෞඛ්‍ය මධ්‍යස්ථානය පියවර ii කුලියාපිටිය**

**නේවාසිකාගාර ඉදිකිරීම - මාකඳුර**

වියදම් පුරෝකතනයේදී, කොන්ත්‍රාත්කරු ඉංජිනේරු ආයතනය වෙත ලබාදෙන බිල්පත් හා වටිනාකම් පදනම්ව සිදුකරන අතර ගෙවීම් වලදී ඉංජිනේරු ආයතනය යම් අඩුකිරීම් නිර්දේශ කරන බැවින් මෙවැනි ඉතිරියක් වාර්තා වේ.

**(v) සෞඛ්‍ය මධ්‍යස්ථානය - මාකඳුර**

අවසාන බිල ගෙවීම අරමුණු කරගෙන මෙම ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන වෙන් කළ අතර, එම බිල 2013 වසර තුළ දී රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් නිර්දේශකර විශ්වවිද්‍යාලය වෙත ලබා දී නොතිබුණ බැවින් ප්‍රතිපාදන ඉතිරියක් වාර්තා වේ.

**(vii) Bachelor Academic Staff Quarters - මාකඳුර**

අවසාන බිල්පත ගෙවීම අරමුණු කරගෙන වියදම් පුරෝකතනය කර තිබුණ ද, එම ගෙවීම නිර්දේශ කිරීම රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව විසින් ප්‍රමාද කිරීම නිසා On Account මුදලක් පමණක් ගෙවා ඇත. ඒ අනුව ඉතිරිය වාර්තා වේ.

**(viii) නේවාසිකාගාර ඉදිකිරීම - කුලියාපිටිය**

නේවාසිකාගාර ඉදිකිරීමේදී ඉඩමේ අයිතිය තහවුරු කරගැනීමට සහ කාළගුණය මත යම් ඉදිකිරීම් පසුබෑමක් දක්නට ලැබී තිබුණි. ඒ අනුව පුරෝකතනය කරන ලද වියදම් දැරීමට නොහැකි විය.

**(x) Access Road Makandura - මාකඳුර**

අවසාන බිල්පත් කොන්ත්‍රාත්කරු ඉදිරිපත්කර නැත.

**(xi) පරිපාලන ගොඩනැගිල්ල ඉදිකිරීම**

පරිපාලන ගොඩනැගිල්ල සඳහා යාවත්කාලීන කරන ලද ඇස්තමේන්තුවක් අනුමත වූ අතර, අනුමැතිය නොතිබූ කාලසීමාවලදී කරන ලද ගෙවීම් වලට ප්‍රතිපාදන නොමැති වූ බැවින්, ඒ සඳහා ගැලපීමක් ලෙස 2013 වර්ෂය සඳහා සෘණ ප්‍රතිපාදන ඉතිරියක් වාර්තා කර ඇත.

**(xii) දැයට කිරුල වැඩසටහනට අදාල ඉදිකිරීම්**

දැයට කිරුළ ප්‍රදර්ශනය සඳහා මෙම ව්‍යාපෘති කඩිනමින් සම්පූර්ණ කිරීමට අවශ්‍ය වූ බැවින් කොන්ත්‍රාත්කරුවන් ඉදිරිපත් කරන බිල්පත් සම්පූර්ණයෙන් ගෙවීමට සිදුවීම නිසා, මෙම සුළු ඉක්මවීම වාර්තා වී ඇත.

**5.3 අයවැය ලේඛණමය පාලනය**

ඇස්තමේන්තු සකසනුයේ පෙර වර්ෂවල සත්‍ය වියදම් ඉදිරි වර්ෂයේ සැලසුම් හා විවිධ උපකල්පන පදනම් කරගනිමිනි. සාර්ව ආර්ථික තත්වයන්ගේ විචලතාවයන් හා අනපේක්ෂිත වෙනස්වීම් විචලතාවයන්ට හේතුවන අතර එබඳු විචලතාවයන් අවම කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ.

**5.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2013 වාර්ෂික වාර්තාවේ ඉංග්‍රීසි භාෂාවෙන් පිටපත් උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙත යැවීමෙන් පසු අමාත්‍යංශ නිලධාරීන් සමග ඒ පිළිබඳව සිදුකරන සාකච්ඡාව ද පවත්වන ලදී. ඉන් අනතුරුව එහිදී සාකච්ඡා කළ පරිදි සිදුකළ යුතු සංශෝධන සිදුකර සම්පූර්ණ වාර්තාව භාෂාත්‍රයෙන් උසස් අධ්‍යාපන අමාත්‍යංශය වෙත එවන ලෙස අපට දන්වා ඇත. සම්පූර්ණ වාර්ෂික වාර්තාවට 2013 වර්ෂයේ විගණන වාර්තාව හා ඊට විශ්වවිද්‍යාලය සපයන ලද පිළිතුරු ද ඇතුළත් කළ යුතුය. නමුත් 2013 වර්ෂයේ විගණන වාර්තාව විශ්වවිද්‍යාලය වෙත ලැබී ඇත්තේ 2015.03.23 දිනයි. ඉන්පසුව විශ්වවිද්‍යාලය ඊට සපයන පිළිතුරු ඇතුලත් වාර්තාව ද අවසන් කළ පසු භාෂාත්‍රයෙන් සකස් කරන ලද වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කිරීම සඳහා ඉදිරිපත් කිරීමට කටයුතු කරමි.

**5.5 නොවිසඳී ඇති විගණන ඡේද**

2012 වර්ෂයේ සිට සනාතන සභා පර්යේෂණ හා උසස් උපාධි කමිටුව අදාල ආචාර්යවරයාගෙන් පර්යේෂණ වාර්තාව ලබාගැනීමට කටයුතු කලද එය සාර්ථක නොවූ අතර 2013 වර්ෂයේ අගෝස්තු මාසයේදී මෙම කරුණ පිළිබඳව සලකා බැලීමට විශ්වවිද්‍යාල පාලක සභාව වෙත යොමුකොට ඇත.

**5.6 පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම.**

නිරීක්ෂණය සමග එකඟ වේ.

**6. පද්ධති හා පාලනයන්**

විගණන වාර්තාව මඟින් අවධානයට ලක් කර ඇති පාලන ක්ෂේත්‍රයන්හි පැවති අඩුපාඩු අවම කර ගැනීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනු ලබන බව කාරුණිකව දන්වමි.

**මහාචාර්ය එස්.ජේ.බී.ඒ. ජයසේකර**

**උපකුලපති**